

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

හතලිස් හතර වන වාර්ෂික වාර්තාව

பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு

நாற்பத்து நான்காவது ஆண்டறிக்கை

UNIVERSITY GRANTS COMMISSION

FORTY FOURTH ANNUAL REPORT

2022

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

හතලිස් හතරවන වාර්ෂික වාර්තාව

2022

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු



දැක්ම

වඩාත් යහපත් ශ්‍රී ලංකාවක් / ලෝකයක් සඳහා දැනුමෙන් නායකත්වය සැපයීම



මෙහෙවර

සමාජ, පාරිසරික සහ මුල්‍යමය වශයෙන් ඉලක්ක ජය ගැනීමට උනන්දුවක් දක්වන දැනුමැති නායකයින් බිහිකිරීමට, රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ශක්තිමත් සම්බන්ධීකරණ පද්ධතියක් තුළින් ඉහළ බලපෑමක් ඇති පර්යේෂණ, ගුණාත්මක ඉගැන්වීම් සහ කර්මාන්ත කටයුතුවල නියැලීමට සහ උසස් තත්ත්වයේ ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි සහ වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීමට පහසුකම් සලසාදීමට අවශ්‍ය කළමනාකරණය සහ යහපාලනය ඇති කිරීම.



අරමුණු

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට ප්‍රවේශය සමානව වැඩි කිරීම.
- 21 වන සියවසේ පුරවැසියෙකු සඳහා අවශ්‍ය යැයි සැලකෙන සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමෙන් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සඳහා පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙනුම් කටයුතු වල නියැලීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුලින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතින්වල විශිෂ්ඨත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක මානව සම්පත්, විශිෂ්ඨ පහසුකම් සහ තිරසාර/හරිත සංකල්ප හරහා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රමිතිය සහතික කිරීම.
- ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශවකරුවන්ගේ සබඳතා හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

සභාපතිතුමාගේ පණිවුඩය



2022 වර්ෂයේදී කොමිෂන් සභාව ඇතැම් ප්‍රධාන කාර්යයන් විධිමත් කිරීමට සහ සියලු ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය පසුබිම සැකසීමට ප්‍රතිපත්තිමය තීරණ රැසක් ගෙන ඇත. ජනාධිපති කාර්ය සාධක බලකායේ සහ උසස් අධ්‍යාපන අනුකමිටුවේ මැදිහත්වීමෙන් මෙම වෙනස්කම් කෙටුම්පත් කර ක්‍රියාත්මක කෙරේ. තවද, මෙම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020-2022 උපාය මාර්ගික සැලැස්මට අනුකූල වන අතර රජයේ නව උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමට දායකවේ.

උපක්‍රම 9කින් සමස්ථ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) 50කට යටත් කර ඉතා සරල පසුබිමක් තුළ සියලුම කාර්යයන් වසර 5ක් තුළ නිමා කිරීමට සැලසුම් සකස් කර ඇත.

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ශීඝ්‍ර හා විප්ලවීය වෙනස්කම් කිහිපයක් අත්විඳ ඇත. 2019/2020 අධ්‍යයන වර්ෂයේදී විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව පෙර නොවූ විරූ ලෙස 31% කින් ඉහළ ගොස් ඇත. මෙම වැඩිදියුණු කරන ලද බඳවා ගැනීම් පහසු කිරීම සඳහා, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පන්සියයකින් සහ තාවකාලික අධ්‍යයන තනතුරු හැත්තෑවකින් සමන්විත අතිරේක කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත.

වසර 15කට පසු ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ වවුනියාව විශ්වවිද්‍යාලය යන ජාතික විශ්වවිද්‍යාල දෙකක් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියට එක් කරන ලදී. තවද, 2022 වර්ෂය තුළ නව පීඨ 02ක්, නව අධ්‍යයනාංශ 12ක්, ප්‍රථම උපාධි වැඩසටහන් 19ක් සහ පශ්චාත් උපාධි වැඩසටහන් 30ක් ද හඳුන්වා දී ඇත.

විශ්වවිද්‍යාලවලට අලුතින් ඇතුළත් වන සිසුන්ට විශ්වවිද්‍යාල පාඨමාලා ආරම්භ වනතුරු වන කාලය අතරතුර තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විශ්වවිද්‍යාල වසා දමා තිබූ බැවින්, Lanka Education and Research Network (LEARN) හරහා සිසුන්ට සහ අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයන්ට නොමිලේ දත්ත ප්‍රවේශය ලබා දෙන අන්තර්ජාල අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ආර්ථික අපහසුතා ඇති සිසුන්ට උපකාර කිරීම සඳහා මහජන බැංකුව හරහා සහන පොලී පදනම මත ලැප්ටොප් පරිගණක මිලදී ගැනීමේ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය. සිසුන්ගේ තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨවල පරිගණක තාක්ෂණ අධ්‍යයනාංශ කිහිපයක් ස්ථාපිත කරන ලදී. තවද, මෙරට පවතින උග්‍ර තොරතුරු තාක්ෂණ සේවකයින්ගේ හිඟයට පිළියම් යෙදීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හරහා වාර්ෂිකව මෘදුකාංග ඉංජිනේරුවන් 10,000ක් බිහි කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත.

රාජ්‍ය විශ්වවිද්‍යාලවල විවිධත්වයට සහ වෙනස්කම්වලට සංවේදී ඉගෙනුම්/සේවා පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව හා සාධාරණත්වය සහ සමාජ ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානය පිහිටුවීම මෑතක දී සිදු වූ තවත් වැදගත් සිදුවීමකි.

වර්තමානයේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව ප්‍රධාන කාණ්ඩ හතරක් යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්ති සහ භාවිතයන් ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ හඳුන්වාදීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති

පටුන

		පිටු අංකය
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	i
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය	ii
	පටුන	iii
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව [UGC]	
	හැඳින්වීම	v
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය	v
	විධායක සාරාංශය	vi
	වගු ලැයිස්තුව	xv
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංවිධාන රූ සටහන	xix
01	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය	1
02	විශ්වවිද්‍යාල කළමනාකරණය	2
03	ආයතන	7
04	මණ්ඩප	9
05	විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම	10
06	අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම	24
07	මූල්‍ය පරිපාලනය	39
08	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව	47
09	මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය	49
10	යටිතල පහසුකම් සංවර්ධනය	58
11	තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු(QAC)	60
12	තොරතුරු තාක්ෂණ සහාය	64
13	නීති කටයුතු	68
14	විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)	72
15	මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු	73
16	ප්‍රකාශන සහ වාර්තා / සංවර්ධන ක්‍රියාකාරකම් / විශේෂ පැවරුම්	76
17	ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය	78
18	විශ්වවිද්‍යාල සිසුන් සඳහා මූල්‍ය ආධාර ලබා දීම	81
19	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම	84
20	විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල	88
21	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	93
22	2022 වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි	97
23	ශිෂ්‍ය කටයුතු සහ සුබසාධන අංශය	100
24	පර්යේෂණ සහ සංවර්ධන අංශය	100
25	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2022	101

26 විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2022……..... 118

27 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2022……... 128

28 තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව - 2022……... 140

29 **ඇමුණුම්**

I. විශ්වවිද්‍යාල ප්‍රවේශය- අධ්‍යයන වර්ෂය 2021/2022
සාමාන්‍ය ප්‍රවේශය යටතේ හා විශේෂ ප්‍රවේශයන් යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාවන් සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව 159

II. විශ්වවිද්‍යාල ප්‍රවේශය- අධ්‍යයන වර්ෂය 2021/2022
සාමාන්‍ය ප්‍රවේශය සහ විශේෂ ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාවන් සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව
[පීඨය අනුව දීප ව්‍යාප්ත කුසලතා සහ දිස්ත්‍රික්ක පදනම මත තෝරාගත් සිසුන් සංඛ්‍යාව]..... 165

III. විශ්වවිද්‍යාල ප්‍රවේශය- අධ්‍යයන වර්ෂය 2021/2022
සාමාන්‍ය සහ විශේෂ ප්‍රවේශ යටතේ විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව
[දිස්ත්‍රික් සහ පාඨමාලා අනුව වර්ගීකරණය] 167

30 කෙටි යෙදුම් ……. 175

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC)

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ මග පෙන්වීම හා සම්බන්ධීකරණය සඳහා කටයුතු කරන ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) 1978 දෙසැම්බර් 22 වන දින අංක 16 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් අතරට උසස් අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, උසස් අධ්‍යාපන ආයතනවලට මුදල් වෙන් කිරීම, උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම නියාමනය හා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් සියලුම රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රගතිය සහ සංවර්ධනය සඳහා සහාය වීම අයත් වේ.

සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන ගණුන් දීමේ නිලධාරියා වන අතර කොමිෂන් සභාවේ කටයුතු දෛනිකව පරිපාලනය කිරීම හා කොමිෂන් සභා රැස්වීම්වල සභාපතිත්වය දැරීම සිදු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධීකරණය හා අනුකූලනය පිණිස වෙන් කරන ලද රාජකාරී හා කාර්යයන් සහිත දෙපාර්තමේන්තු, අංශ හා ඒකක ඇත. විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන අතරට විශ්වවිද්‍යාල 17ක්, පශ්චාත් උපාධි ආයතන 10ක්, ආයතන 8ක් හා 1ක් මධ්‍යස්ථානයක් ඇතුළත් වේ. පාලක සභාව එක් එක් විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර සනාතන සභාව අධ්‍යයන කටයුතු සම්බන්ධ උත්තරීතර සභාව වේ. විශ්වවිද්‍යාලයක සහ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා අනුපිළිවෙළින් උපකුලපති හා අධ්‍යක්ෂ වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධානයන් ප්‍රකාරව කොමිෂන් සභාව පහත අරමුණු සමඟ ස්ථාපනය කොට ඇත:

1. ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාළව පාර්ලිමේන්තුව මඟින් වෙන් කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදා දීම, සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතනය මඟින් සිදු කරන වියදම් පාලනය කිරීම.
3. උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
4. උසස් අධ්‍යාපන ආයතනයන් හි පරිපාලනය නියාමනය කිරීම.
5. එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම නියාමනය කිරීම, සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ, ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරී සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

විධායක සාරාංශය

මෙම වාර්ෂික වාර්තාව, 2022 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ක්‍රියාවට නංවන ලද කාර්යයන් සමාලෝචනය කරයි. සමාලෝචිත වර්ෂයේ මූලික වැදගත් අවස්ථා සහ ජයග්‍රහණයන්, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුලත් කර ගැනීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, කාර්ය මණ්ඩල සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, තත්ත්ව සහතිකකරණය, මූල්‍යමය පරිපාලනය හා කළමනාකරණය සහ විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහයෝගිත්වය හා පර්යේෂණ සහයෝගිත්වය යන ක්ෂේත්‍රයන් යටතේ සාරාංශ කර ඇත.

2019-2023 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලැස්ම සමඟ 2022 වාර්ෂික වාර්තාවෙහි දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී, 2019-2023 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලසුමෙහි දක්වා ඇති ඉලක්ක, අරමුණු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI), රට තුළ පැන නගින අපේක්ෂා හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කර ගත් ආර්ථිකයෙහි මානව අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සැලකිල්ලට ගන්නා ලදි.

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කර, 2021 පෙබරවාරි මස පවත්වන ලද අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව, 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමට 2022 සැප්තැම්බර් 05 සහ 2022 සැප්තැම්බර් 23 අතර කාලය තුළ අනාගත අපේක්ෂකයින්ගෙන් මාර්ගගතව අයදුම්පත් කැඳවන ලදී. අනතුරුව කඩඉම් ලකුණු 2022 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලද අතර සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් කරන ලදී. විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීම තවමත් සිදුවෙමින් පවතින අතර 2023 දී එම කටයුතු අවසන් කිරීමට නියමිතය.

2021/2022 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ ප්‍රධාන තොරතුරු පහත සාරාංශගත කර ඇත;

නිකුත් කරන ලද අ.පො.ස.(උසස් පෙළ) ප්‍රතිඵල මත පදනම්ව 2021/2022 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන් සංඛ්‍යාව	**171,497**
2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර ගැනීමට යෝජිත සංඛ්‍යාව	**42,519**
තෝරාගත් / ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව:	
(1) සාමාන්‍ය ප්‍රවේශය : (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)	41,228
(2) විශේෂ විධිවිධාන :	191

විශ්වවිද්‍යාල ප්‍රවේශය වැඩි කිරීම සඳහා, 2022 දී විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින පාඨමාලා ලැයිස්තුවට නව අධ්‍යයන පාඨමාලා හතරක් (04) එක් කරන ලද අතර 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා එම පාඨමාලා පහත පරිදි ක්‍රියාත්මක කරන ලදී.

අංකය	පාඨමාලාවේ නම	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	මූල්‍ය ආර්ථික විද්‍යාව	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	50
2	නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය		50
3	ඉංග්‍රීසි භාෂාව හා ව්‍යවහාරික වාග් විද්‍යාව	ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	50
4	බැංකුකරණය හා රක්ෂණ	වව්නියාව විශ්වවිද්‍යාලය	50
	එකතුව		**200**

මීට අමතරව, 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා පහත සඳහන් දැනට පවතින අධ්‍යයන පාඨමාලා අනෙකුත් විශ්වවිද්‍යාල සඳහා හඳුන්වා දෙන ලදී;

අංකය	අධ්‍යයන පාඨමාලාව	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	පරිගණක විද්‍යාව	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	50
2	මෘදුකාංග ඉංජිනේරු		50
3	තොරතුරු පද්ධතිය		50
	එකතුව		**150**

<u>අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය</u>

උසස් අධ්‍යාපනයට පුළුල් සහභාගීත්වයක් සහ සමාන ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින්, දේශීය හා ගෝලීය වශයෙන් පිළිගත් නව හා නව්‍යකරණය කරන ලද පාඨමාලා සහ උපාධි වැඩසටහන් හඳුන්වා දීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කරන ලදී. මෙම ප්‍රයත්නයට සහාය දැක්වීම සඳහා, 2022 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන ලදී;

- නව පීඨ තුනක් (03)
- නව අධ්‍යයනාංශ දහහතරක් (14)
- නව උපාධි වැඩසටහන් දහයක් (10)
- නව විශේෂවේදී උපාධි වැඩසටහන් නවයක් (09)
- නව පශ්චාත් උපාධි වැඩසටහන් තිස් හතරක් (34)
- නව බාහිර උපාධි වැඩසටහන් එකක් (01)

තවද සිසුන්ට වැඩි රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ලබා දීම සඳහා, රටේ වර්තමාන අවශ්‍යතාවන්ට සරිලන පරිදි නව දැනුම හා කුසලතා හඳුන්වා දෙමින් පවත්නා උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, 2022 වර්ෂයේදී අධ්‍යයනාංශ නම වෙනස් කිරීම් 03ක් සහ උපාධි වැඩසටහන්වල නම් වෙනස් කිරීම් 01ක් යෝජනා කරන ලදී.

2022 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ස්ථාවර කමිටු 24 ක් ක්‍රියාත්මක වූ අතර එමඟින් විවිධ විෂය ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනයට අදාළ කරුණු පිළිබඳව කොමිෂන් සභාවට වාර්තා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ, මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වා දෙන ලද මනා කළමනාකරණ භාවිතයන් අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලන හා මෙහෙයුම් කටයුතුවල සියලුම වැදගත් අංශ අධීක්ෂණය කිරීමේ අරමුණින් 2022 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් පහක් පවත්වන ලදී. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය, පද්ධතිය තුළ නිසි පාලනයක් සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයන් අභ්‍යන්තර විගණන අංශ සමඟ නිතිපතා සම්බන්ධීකරණය වීම කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල කටයුතු කළමනාකරණය

2022 වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 325ක් වූ අතර, එයට විධායක සහ විධායක නොවන කාර්ය මණ්ඩලය අයත් වේ. 2022 දෙසැම්බර් 31 වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සිටි කාර්ය මණ්ඩලය 239කි. 2022 වර්ෂය තුළ කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්ගේ නව පත්වීම් හතක් (07) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දී ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයින් දාහතක් (17) සේවයේ ස්ථීර කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් (EB) අවශ්‍යතා සඳහා ඇගයීමෙන් පසු සේවකයින් විසිඅට (28) දෙනෙකු උසස් කරන ලද අතර පත්කිරීම් හයක් (06)ක් සිදු කරන ලදී. තවද, එක් සේවකයෙකු (01) තනතුරෙන් ඉවත් කරන ලදී.

2022 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර මාරුවීම් තුනක් (03) ක් පමණක් වාර්තා විය. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ සේවකයින් නව (09) දෙනෙකු විශ්වවිද්‍යාල පද්ධතියට කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවා සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඔවුන්ට ඒ වෙනුවෙන් මුදල් ත්‍යාගයන් ලබා දෙන ලදී.

2022 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වෙනත් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙත ස්ථාන මාරු තුනක් (03) සිදු කරන ලද අතර අනෙකුත් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙතින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු හතරක් (04) සිදු කරන ලදී. විශ්‍රාම පූර්ව නිවාඩු ගැනීම් හතරක් (04) විශ්‍රාම යෑම් හයක් (06), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවයෙන් පහකිරීම් එකක් (01) සහ ඉල්ලා අස්වීම් හයක් (06) සමාලෝචිත වර්ෂය තුළ වාර්තා කර ඇත. තවද, 2022 වර්ෂය තුළ විභාගවලට පෙනී සිටීම් සඳහා නිවාඩු 09ක්, වැටුප් රහිත නිවාඩු 04ක්, ප්‍රසූත නිවාඩු 08ක් සහ ඉකුත් නිවාඩු 10ක් ද වාර්තා වී ඇත.

2022 වර්ෂයේ දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සියලුම ස්ථීර සේවකයින් සඳහා ආකර්ශනීය හා සාධාරණ ගාස්තුවකට පුද්ගලික ගිණුමෙන්ම පවුල් ආවරණයක් ලබා ගැනීමේ විකල්පය සමඟ සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දී ඇත.

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය

2022 දී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක සංඛ්‍යා තනතුරු 118ක් අනුමත කරන ලදී.

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පරිපාලන ශ්‍රේණියේ පත්වීම් / උසස්වීම් සිදු කිරීමට පැවරී ඇති වගකීම යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2022 දී පරිපාලන ශ්‍රේණියේ පත්වීම් 56 ක් සිදු කරන ලදී. මීට අමතරව, වසර තුළදී වෙනත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම්106 ක් සහ උසස්වීම් 466 ක් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාන මාරුවීම් 141 ක් සඳහා ද පහසුකම් සලසන ලදී.

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක කාලය තුළ සහන කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් අයදුම්පත් 171 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී තිබූ අතර එම කටයුතු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ක්‍රියාවට නැංවේ.

1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් පවරා ඇති බලතල, රාජකාරි හා කාර්යයන් ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2022 වර්ෂයේ දී කොමිෂන් සභා චක්‍රලේඛ 18ක් සහ ආයතන චක්‍රලේඛ ලිපි 13 ක් නිකුත් කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යයාපන ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභාව ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙමින් මෙම චක්‍රලේඛ ලිපි නිකුත් කරන ලදී.

<u>විශ්වවිද්‍යාල සිසුන් සඳහා මූල්‍ය ආධාර</u>

ශිෂ්‍යත්ව යනු පරිත්‍යාගශීලීන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් එකඟ වන නියමයන් සහ කොන්දේසි මත පුද්ගලයන් හෝ සංවිධාන විසින් ස්ථාපිත කර ඇති සහ අනාගතයේදී ස්ථාපිත කළ හැකි ඒවා වේ. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන තෝරාගත් සිසුන්ට අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා මෙම මූල්‍ය ආධාර ලබාදේ. මුදල් අංශය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශයේ සහාය ඇතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය විසින් දැනට ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කරයි.

<u>විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා සහාය සහ මූල්‍යාධාර ලබා දීම</u>

සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන කාර්ය මණ්ඩලයට, විශේෂයෙන් තරුණ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය,මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු කළේය. මෙම කටයුතු මූලික වශයෙන් පර්යේෂණ හා ජාත්‍යන්තර සහයෝගීතා අංශය (DRIC) හරහා සිදු කරන ලද අතර ඒවා පහත පරිදි වේ;

උසස් අධ්‍යාපන ආයතනවල ස්ථීර සේවයේ නිරත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූල්‍යාධාර සපයයි. මෙම ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ සියළුම අංශයන්හි අධ්‍යයන කටයුතුවල නියැලෙන්නන්ට ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ධාරිතාවය ශක්තිමත් කිරීමයි.

ප්‍රදානයේ මුළු වටිනාකම විෂය, අධ්‍යයන වැඩසටහනේ ස්වභාවය සහ වැඩසටහන පවත්වන රට අනුව වෙනස් වේ.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ශුභ සිද්ධිය වෙනුවෙන් ඔවුන්ට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයෙ හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සම අනුග්‍රහය දක්වන ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කරන ලදී.

- ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් උසුලන ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒකාබද්ධව විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා ඒකාබද්ධ/ භින්න ආචාර්ය උපාධි වැඩසටහනක් දියත් කළේය.

- ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු (PhD) සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සම අනුග්‍රාහක ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර තිබේ.

<u>උසස් අධ්‍යාපන ආයතනයන් හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු</u>

2022 වසරේ දී, නව ඉදිකිරීම් හා අඛණ්ඩව සිදු කෙරෙන ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත් කර ගැනීම්, මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සහ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 4,700 ක මුදලක් වෙන් කරන ලදී. 2022 වසර අවසන් වන විට රු. මිලියන 3,042 ක මුළු මුදලක් භාණ්ඩාගාරය විසින් නිර්දේශ කර නිකුත් කරන ලදී.

වර්ෂය තුළදී, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 10 ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එහි සෝදිසි කිරීම් හා ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව, 2022 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්දේ ව්‍යාපෘති යෝජනා* 8 ක් පමණි. රේඛීය අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේ දී ව්‍යාපෘති යෝජනා 8 ම අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාධන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදි. 2022 වර්ෂයේදී කිසිදු ව්‍යාපෘතියක භෞතික වැඩ ආරම්භ නොවුණු අතර වර්ෂය අවසන් වන විට, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වටිනාකම රු.මිලියන 28,748 ක් වන වැඩ ආරම්භ කර සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 56 ක් පවතින අතර සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 99.1 ක් වන ව්‍යාපෘති 1 ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දී ඇත.

<u>තොරතුරු තාක්ෂණ සහාය</u>

පැවරී ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතික් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවල සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා /පිරිවිතරයන් සකස් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය, පරිගණක, සන්නිවේදන පද්ධති හා ජාලයේ සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ 2022 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

- නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම සහ පවතින පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා සහ පිරිවිතරයන් සැකසීම, මෘදුකාංග ඇතුළු පරිගණක පද්ධතියේ සහ ජාලයේ සමස්ත පරිපාලනය, සන්නිවේදන පද්ධති, දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සහ ආයතනයේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සැපයීම සඳහා සෞඛ්‍ය සම්පන්න අබාධිත පරිගණක පද්ධතියක් කළමනාකරණය කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වන ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා ටෙලිකොම්, LK Domain Registry සමඟ සම්බන්ධීකරණය කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නවතම තොරතුරු තාක්ෂණයන් හඳුන්වා දීම.

- වෙබ් අඩවි පරිපාලනය සහ නඩත්තු කිරීම;

- සාර්ථක ප්‍රතිඵල ලබා දීම සඳහා පහත ක්ෂේත්‍ර යටතේ ආවරණය කිරීමට, යෙදවුම් සංවර්ධන කණ්ඩායම සහ සේවා සපයන්නන් සම්බන්ධීකරණය කිරීම.

    - 2021/2022 අධ්‍යයන වර්ෂයට අදාළ අවම කඩඉම් ලකුණු වෙබ් අඩවිය ඔස්සේ නිකුත් කිරීම.

    - කෙටි පණිවුඩ සහ රජයේ තොරතුරු මධ්‍යස්ථානය (1919 ඇමතුම් මධ්‍යස්ථානය) විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ ක්‍රියාකාරකම්.

    - කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික ශ්‍රේණි තනතරුවල උසස්වීම්වලට අදාළ මාර්ගගත අයදුම්පත් සඳහා රජයේ කෙටි පණිවුඩ (GovSMS) සේවාව.

    - විශ්වවිද්‍යාල සඳහා මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචිය - 2021/2022 අධ්‍යයන වර්ෂය

    - මාර්ගගත අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය - 2021/2022 අධ්‍යයන වර්ෂය

- ICTA සමඟ එක්ව මාර්ගගත ගෙවීම් ද්වාරයේ ක්‍රියාවලිය පරිපාලනය සහ සම්බන්ධීකරණය:

- වෙබ් ද්වාරය, රැස්වීම් ශාලා වෙන් කිරීමේ පද්ධතිය, පිරිස් අංශය සඳහා සේවකයින්ගේ පැමිණීම සලකුණු කිරීම සඳහා වන eHRM පද්ධතිය, සේවක උසස් වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ පද්ධතිය, ඉ-තොග සහ මාර්ගගතව වාහන වෙන්කරවා ගැනීමේ අයදුම්පත වැනි ව්‍යාපාරික යෙදවුම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

- ශ්‍රී ලංකාවේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යාපනයේ ශත සංවත්සර සැමරුම් වෙබ් අඩවිය (1921-2021) එහි පෙර පැවති අන්තර්ගතය සමඟ නැවත සකස් කර එය පවතින සර්වරයේ අවකාශය (https://eugc.ac.lk/hss/) තුළම ස්ථානගත කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ නව සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

- **මෘදුකාංග සංවර්ධන**

    - කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියේ උසස්වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීම සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය

- කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරට ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් පත්කිරීම සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය
- ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් /ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී /ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරු සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීම සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය
- ප්‍රේරණ පුහුණු වැඩසටහන සහ වැඩසටහන් හැසිරවීමේ පද්ධතිය
- ගබඩා කළමනාකරණ පද්ධතිය
- නීති සහ ප්‍රලේඛන අංශය සඳහා ගොනු බෙදා හැරීමේ පද්ධතිය
- වාහන වෙන්කරවා ගැනීමේ මාර්ගගත අයදුම්පත
- විශ්වවිද්‍යාලය සඳහා මාර්ගගතව ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමේ අයදුම්පත
- සේවක සංඛ්‍යාව ආශ්‍රිත වාර්තා ජනනය කිරීම සඳහා වන පරිගණක යෙදවුම

<u>කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කටයුතු සහ සහාය</u>

2022 දී, කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන 2021 හා සම්බන්ධ වැදගත් ප්‍රකාශන/වාර්තා එකක් සහ විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ වෙබ් අඩවියේ (webometrics) හා QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යාවත්කාලීන කරන ලද ශ්‍රේණිගත කිරීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී. තවද මෙම කාල සීමාව තුළ සම්පූර්ණ කරන ලද විශේෂ පැවරුම් 09 ක් භාර දෙන ලදී.

<u>තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ (QAC) කටයුතු</u>

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට 2022 වසර කාර්යබහුල වර්ෂයක් වූ අතර, වාර්ෂික ක්‍රියාමාර්ගවලින් සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක සහ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් පසුගිය වසර දෙක තුළ එකතු වූ කාර්යයන් ද සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින් විසින් සහාය දක්වන අතර තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් ද මෙහෙයවනු ලැබේ. ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව 2022 දෙසැම්බර් 31 වන විට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ ප්‍රගතිය පහත පරිදි වේ.

- විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම
- පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශ සංවර්ධනය කිරීම
- ආයතනික සමාලෝචන පැවැත්වීම (IRs)
- වැඩසටහන් සමාලෝචන පැවැත්වීම (PRs)
- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය 2015 ට අනුකූලව සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම
- පොදු අධ්‍යයන දින දර්ශනයක් සඳහා ක්‍රියා කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ සුදුසුකම් සඳහා වූ ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය (GEE), ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන වල නවකවදය

විවිධත්වයට සහ සමානාත්මතාවයට සංවේදී වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල හිතකර ඉගෙනුම්/සේවා පරිසරයක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. ඒ අනුව, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රජාවන්හි අසමානතා අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරන විවිධ ක්‍රියාකාරකම් සමූහයක නිරත වෙමින් සිටී. මහාචාර්ය හේමමාලි ගුණතිලක (කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආචාර්ය උපාධිය, වෝර්වික් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරිය ලෙස 2022 මැයි දක්වා සප්ත වාර්ෂික නිවාඩු තුළ සිදු කළ පත්වීමක් ලෙස කටයුතු කරන ලදී. ඇයගේ වසරක සේවා කාලය සම්පූර්ණ වූ පසු ඇය එම මධ්‍යස්ථානයේ වැඩබලන අධ්‍යක්ෂවරිය ලෙස නැවත පත් කරන ලද අතර 2022 වර්ෂයේදී එම මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

පැමිණිලි ද්වාරය

රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට මාර්ගගත පැමිණිලි ද්වාරයට ප්‍රවේශ විය හැකි අතර නවක වදයට සම්බන්ධ නමුත් ප්‍රධාන වශයෙන් ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ලෙස වර්ගීකරණය කළ හැකි සිදුවීම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. 2022 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩු අගයක් ගන්නා ලදී. එයට හේතුව වුයේ විශ්වවිද්‍යාල මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක වීමත් සිසුන් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ භෞතිකව නොසිටීමත් ය. කෙසේ වෙතත්, ලැබුණු පැමිණිලි කිහිපයක් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ විශ්වවිද්‍යාල වෙත යොමු කරන ලද අතර පවතින සමහර පැමිණිලි පිළිබඳව ක්‍රියාකර විසඳා ඇත (ලැබුණු සහ අවශ්‍ය පියවර ගන්නා ලද පැමිණිලි සංඛ්‍යාව 71 ක් වූ අතර පැමිණිලි 18 ක කටයුතු අවසන් කර ඇත).

පර්යේෂණ මුල පිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාලවල නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ සහ නවක වදයට එරෙහිව සටන් කිරීමට උපාය මාර්ග යෝජනා කිරීම සහ පැතිරීම අවම කිරීම පිළිබඳව වන UNICEF විසින් අරමුදල් සපයන ලද ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාව 2022 වර්ෂයේ මාර්තු මාසයේදී නිකුත් කරන ලදී. ලේකම්/අධ්‍යාපන අමාත්‍යාංශය, යුනිසෙෆ් නිලධාරීන්, උපකුලපතිවරුන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයන්, විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රවල අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් ආරාධිතයන්ගේ සහභාගීත්වයෙන් පර්යේෂණ වාර්තාව එළිදැක්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සරල උත්සවයක් පවත්වන ලදී.

2022 දී ගන්නා ලද මුලපිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ ප්‍රධාන වශයෙන් සිදු කරනු ලැබුවේ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය බහුලවීමට හේතු හඳුනා ගැනීම සහ එවැනි සිදුවීම් අවම කිරීම සඳහා උපාය මාර්ග යෝජනා කිරීම සඳහා ය. විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ විවිධත්වය සහ සමාන ප්‍රවේශය සම්බන්ධ ගැටළු විසඳීමට ඇති නොහැකියාව බව අධ්‍යයන සොයාගැනීම්වලින් අනාවරණය විය. එවැනි

සොයාගැනීම් මත පදනම්ව, මේ වන විට ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ සම්පත් දායකයින්ගේ සහාය ඇතිව 'විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම' නමින් පාඨමාලාවක් සකස් කර ඇත. මෙම පාඨමාලාව පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සම්පාත වේ:

ඉලක්කය 4 : ගුණාත්මක අධ්‍යාපනය
ඉලක්කය 5 : ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය
ඉලක්කය 10: අඩු කරන ලද අසමානතා
ඉලක්කය 11: තිරසාර නගර සහ ප්‍රජාවන්
ඉලක්කය 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගෝලීය සමුළුව

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගෝලීය සමුළුවක් සංවිධානය කිරීමටත් 2024 දී එය පැවැත්වීමටත් ස්ථාවර කමිටුව යෝජනා කළේය. සමුළුව සංවිධානය කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලද අතර එය ස්ථාවර කමිටුවේ ස්වේච්ඡා සාමාජිකයින්ගෙන් සහ සියලුම විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රස්ථානවල අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවයේ කාර්ය මණ්ඩලය සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍ර / සඳහා පුහුණුව

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ විසින් එහි කාර්ය මණ්ඩලය වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙම පුහුණුව ස්ත්‍රී පුරුෂ භාවය සහ අසමානතාවයේ වෙනත් ආකාර, පුද්ගල සංවර්ධනය, වෘත්තීය ප්‍රගතිය සහ අන්තර් පුද්ගල සහ සමාජ කුසලතා වැනි ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

වගු ලැයිස්තුව

5

වගු අංකය	නම	පිටු අංකය
5.1.1	සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළත්කර ගැනීම් (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)*	11-15
5.2	2021/2022 අධ්‍යයන වර්ෂයේදී හඳුන්වා දුන් නව අධ්‍යයන පාඨමාලා	15
5.3	2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා අනෙකුත් විශ්වවිද්‍යාලවලට හඳුන්වා දුන් විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලා	15
5.4.(අ)	අන්ධ හා කායික අශක්නුතාවන් ඇති සිසුන් ඇතුළත් කිරීම	16
5.4.(ආ)	විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම	16-19
5.4.(ඇ)	ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම	20
5.4.(ඉ)	සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම	20
5.4.(ඊ)	ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨ දක්ෂතාවත් දක්වා ඇති අයදුම්කරුවන්	21
5.4.(උ)	අතිරේක බඳවා ගැනීම් යටතේ සිසුන් ඇතුළත් කිරීම	21
5.5 (අ)	විදේශීය සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කර ගැනීම	22
5.5 (ආ)	සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම	22
5.5 (ඇ)	අන්ධ හා කායික අශක්නුතාවන් ඇති සිසුන්	22
5.5(ඊ)	අතිරේක ප්‍රවේශය	23

6

වගු අංකය	නම	පිටු අංකය
6.1	2022 දී පැවැත්වූ ස්ථාවර කාරක සභා රැස්වීම් ගණන	24-25
6.2.1	2022 වර්ෂයේ අනුමත පීඨ	25
6.2.2	2022 වර්ෂයේ අනුමත අධ්‍යයනාංශ	25-26
6.2.3	2022 වර්ෂයේදී අනුමත කරන ලද නව ප්‍රථම උපාධි වැඩසටහන්	26
6.2.4	2022 වර්ෂයේදී අනුමත කරන ලද විශේෂවේදී උපාධි වැඩසටහන්	27
6.2.5	2022 වර්ෂයේදී අනුමත කරන ලද පශ්චාත් උපාධි වැඩසටහන්	27-29
6.2.6	2022 වර්ෂයේදී අනුමත කරන ලද බාහිර උපාධි වැඩසටහන්	29
6.3.1	2022 වර්ෂයේදී අනුමත කරන ලද අධ්‍යයනාංශවල නම වෙනස් කිරීම්	30
6.3.2	2022 වර්ෂයේදී අනුමත කරන ලද ප්‍රථම උපාධි වැඩසටහන්වල නම් වෙනස් කිරීම්	30
6.5.5	2022 දී අත්සන් කරන ලද බලපත්‍රලාභී ගිවිසුම් සහ වෙළඳපොලේ ඇති නිෂ්පාදන	36

7

වගු අංකය	නම	පිටු අංකය
7.2	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම/භාවිතය	42
7.2.1	පුනරාවර්තන ප්‍රදානය (RBG)	42
7.2.2	ප්‍රාග්ධන ප්‍රදාන (CBG)	42
7.2.3	අයවැය යෝජනා – 2022	43
7.4	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම /භාවිතය -2018 සිට 2022 දක්වා	45
7.5	මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම සඳහා වාර්ෂිකව මුදල් වෙන් කිරීම	45-46
7.6	2022.12.31 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව	46
7.7	මහපොළ සහ ශිෂ්‍යාධාර සාරාංශය	47

8

වගු අංකය	නම	පිටු අංකය
8	2022 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යා තොරතුරු	48
8.3	වර්ෂය තුළ වාර්තා කර ඇති නිවාඩු ලබා ගැනීම් ගණන	49

9

වගු අංකය	නම	පිටු අංකය
9.1.1	විශ්වවිද්‍යාල පනය සඳහාඋසස් අධ්‍යා /2022 දී අනුමත කරන ලද නව සේවක සංඛ්‍යාව [කාණ්ඩය අනුව]	50
9.1.2	උසස් අධ්‍යාපන ආයතනවල අනුමත කළ සේවක සංඛ්‍යා ව්‍යාප්තිය	50
9.2.1(අ)	සහකාර ලේකම්/ සහකාර ලේඛකාධිකාරී තනතුර සඳහා පත්වීම් සංඛ්‍යාව (නීති සහ ප්‍රලේඛන)	51
9.2.2 (අ)	නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුර සඳහා උසස් කිරීම	51
9.2.2(ආ)	නියෝජ්‍ය ගණකාධිකාරී/ නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර	52
9.2.2(ඇ)	නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති සහ ප්‍රලේඛන) තනතුර සඳහා වූ උසස්වීම් සංඛ්‍යාව	52
9.3.1	අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් -2022	53
9.3.2	අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද උසස්වීම් - 2022	53
9.4	කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් පත් කිරීම	54
9.9	මෝටර් රථ බලපත්‍ර සඳහා ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව	55
9.10 (අ)	සහාය මහාචාර්ය/මහාචාර්ය තනතුරට කුසලතා අනුව සිදු කරන උසස් කිරීම් පිළිබඳ තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව	55-56

9.10 (ආ)	දැන්වීම් මඟින් පූරප්පාඩු කැඳවන ලද මහාචාර්ය (ප්‍රධානී) තනතුර සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව	56
9.10 (ඇ)	නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරට කුසලතා අනුව සිදු කරන උසස් කිරීම සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව	57
9.10 (ඈ)	දැන්වීම් මඟින් පූරප්පාඩු කැඳවන ලද පුස්තකාලයාධිපති තනතුර සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව	57
9.10 (ඉ)	කථිකාචාර්ය (පරිවාස) / කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම / උසස් කිරීම සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව	57
9.11 (අ)	කථිකාචාර්ය (පරිවාස) තනතුරේ පත්වීම් සඳහා අනුමැතිය ලබා ගැනීම් සංඛ්‍යාව	58
9.11 (ආ)	කථිකාචාර්ය තනතුරේ පත්වීම් සඳහා අනුමැතිය අපේක්ෂා කරන සංඛ්‍යාව (ස්ථිර නොකළ)	58
9.11 (ඇ)	කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරේ පත්වීම් සඳහා අනුමැතිය අපේක්ෂා සංඛාව	58

10

වගු අංකය	නම	පිටු අංකය
10.1	නිම කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දුන් ව්‍යාපෘති	59

15

වගු අංකය	නම	පිටු අංකය
15.4	ප්‍රගති වාර්තාව- අභ්‍යන්තර විගණන අංශය	74-75
15.5	නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි සහ ආයතන චක්‍රලේඛ ලිපි	76

18

වගු අංකය	නම	පිටු අංකය
18.1.1	මිටිසුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව	81
18.1.2	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය	82
18.1.3	හොඳම විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සඳහා වන ශිෂ්‍යත්ව	82-83
18.1.4	ඩබ්ලිව් පී හෙන්ඩ්‍රික් අප්පු අබේදීර ශිෂ්‍යත්ව වැඩසටහන	83

20

වගු අංකය	නම	පිටු අංකය
20.1	විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රධාන මූල්‍ය තොරතුරු	89
20.2	2022.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල	91
20.3	විශ්‍රාම වැටුප් අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද අනුපාත	92

21

වගු අංකය	නම	පිටු අංකය
21.1	මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය– විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	93
21.2	2022.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	96
21.3	ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බැඳුම්කර බිල්පත් සහ ණයකරවල පස් / අවුරුදු සාමාන්‍ය පොලී අනුපාත	96-97

22

වගු අංකය	නම	පිටු අංකය
22.1	2022 දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ	98
22.2	2022 දී නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි	99

අ.වි. - අභ්‍යන්තර විගණක
නි.ලේ. – නියෝජ්‍ය ලේකම්
නි.ග.– නියෝජ්‍ය ගණකාධිකාරී
ජ්‍යෙ.ස.ලේ. – ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ජ්‍යෙ.ස.ග. – ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී
ජ්‍යෙ.ස.අ.වි. – ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
ස.ලේ. – සහකාර ලේකම්
ස.අ.ස. – සහකාර අභ්‍යන්තර විගණක
ස.ග. – සහකාර ගණකාධිකාරී
ම.ස.නි. – මහජන සම්බන්ධතා නිලධාරී
මා.ස. – මානව සම්පත්
ය.ප.ස.අ. – යටිතල පහසුකම් සංවර්ධන අංශය
ක.ආ.ක. – කක්ෂ්ව ආරක්ෂණ කවුන්සිලය
නී. හා ප්‍ර. – නීති හා ප්‍රලේඛණ
ප.සහ ජා.ස.අ.– පර්යේෂණ සහ ජාත්‍යන්තර සහයෝගිතා අංශය
සැ.හා.න. – සැපයුම් හා නඩත්තු
මා.ස.ස.ඒ. - මානව සම්පත් සංවර්ධන ඒකකය
වි.අ.අ. – විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
වි.සේ.අ.ම.– විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය
ස්. පු. සා. කේ. - ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංවිධාන රූ සටහන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ස්ථාවර කමිටු

සභාපති

උප සභාපති

ලේකම්

අතිරේක ලේකම් / මානව සම්පත්

අධ්‍යක්ෂ මා.ස.ස.ඒ

ජ්‍යෙ.ස.ලේ.

අතිරේක ලේකම් / අධ්‍යයන

නි.ලේ

ජ්‍යෙ.ස.ලේ.

ස.ලේ

අතිරේක ලේකම්/ නීති හා ප්‍රලේඛණ

අධ්‍යක්ෂ සැලසුම්

නියෝජ්‍ය ලේකම්

ස.ලේ

අධ්‍යක්ෂ ය.ප.ස.අ

වැඩ ඉංජිනේරු

ව්‍යාපෘති කළමණාකරු

ගණකාධිකාරී

ජ්‍යෙ.ස.ග. වි.අ.අ

ජ්‍යෙ.ස.ග. වි.වි.ප්‍ර.කොට.ස

ජ්‍යෙ.ස.ග.

ජ්‍යෙ.ස.ග. විශ්‍රාම වැටුප්

සංඛ්‍යාලේඛනඥ

නියෝජ්‍ය ලේකම්/ සැ.හා.න.

ජ්‍යෙ.ස.ලේ. පිරිස්

ජ්‍යෙ.ස.ලේ.

ස.ලේ

සහකාර සංඛ්‍යාලේඛනඥ

සහකාර සංඛ්‍යාලේඛනඥ

වැඩසටහන්කරු සහ පද්ධති විශ්ලේෂක

අධ්‍යක්ෂ / කක්ෂ්ව ආරක්ෂණ කවුන්සිලය

වි.සේ.අ.ම.- ලේකම් (ස.ලේ)

ස.ලේ

අධ්‍යක්ෂ / ස්. පු. සා. කේ

ජ්‍යෙ.ස.ලේ

වැඩසටහන්කරු සහ පද්ධති විශ්ලේෂක

ප්‍රධාන අභ්‍යන්තර විගණක

අභ්‍යන්තර විගණක

ජ්‍යෙ.ස.ලේ

ස.ලේ

ජ්‍යෙ.ස.අ.වි.

ස.අ.වි.

ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි

පුහුණු, අර්ධ පුහුණු සහ නුපුහුණු සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත කළමනාකරණය සඳහා වගකිව යුතු කොමිෂන් සභාව 2022 වර්ෂයේ දී පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය;

සභාපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග** *බී.ඒ.ආර්ථික විද්‍යාව (විශේෂ) (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය); එම්.ඒ. ආර්ථික විද්‍යාව(කොළඹ); එම්.එස්.සී.ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ආර්ථික විද්‍යාව (සාගා, ජපානය); පී.එච්.ඩී (කගෝෂිමා, ජපානය)*
උප සභාපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්දන පී උඩවත්ත** *බී.එස්.සී., දර්ශනශූරී, පී.එච්.ඩී., වරලත් රසායනඥ, රසායනික ඉංජිනේරු ඩිප්ලෝමාව (Dip.Chem. Eng), ජෛව තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (Dip.Bio.Tech)*
කොමිෂන් සභාවේ සාමාජිකයන්	**පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි** *බී.ඒ (ගෞරව) එම්.ඒ., පී.එච්.ඩී.(පේරාදෙණිය), අග්ගමහාපණ්ඩිත*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ කේ ඩබ්ලිව් ජයවර්ධන *බී.එස්.සී.ඉංජිනේරු (ගෞරව) (මොරටුව), එම්.එස්.සී.ඉදිකිරීම් (ලෝබරෝ, එ.රා.), පී.එච්.ඩී. ඉදිකිරීම් කළමනාකරණය (ලෝබරෝ, එ.රා.), වරලත් ඉංජිනේරු, එෆ්.අයි.එෆ්.(ශ්‍රී.ල) එම්.එස්.එස්.ඊ. (ශ්‍රී.ල), Int.PEng (ශ්‍රී.ල), එම්.එස්.එස්.ඊ.(ශ්‍රී.ල), එෆ්.අයි.පී.එම්. (ශ්‍රී.ල), එෆ්.එන්.ඒ.එස්.(ශ්‍රී.ල), ජී.එස්.එල්.අයි.ඩී.*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ති අරසරත්නම් *බී.එස්.සී, එම්.එස්.සී, පී.එච්.ඩී.(ජෛව රසායන විද්‍යාව)*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා *බී.ඒ., එම්.ඒ.(කොළඹ), එම්.එස්.සී. සහ පී.එච්.ඩී.(එඩින්බරෝ, එ.රා.)*
	පාලිත කුමාරසිංහ මහතා (ජනාධිපති නීතිඥ)
භාණ්ඩාගාර නියෝජිත	**ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතා** *බී.ඒ. (ගෞරව)(කොළඹ),1991, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කයිරෝ), 1997, එම්.ඒ.(සංවර්ධන අධ්‍යයන), නෙදර්ලන්තය, 2002*
ලේකම්	**ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර** *බී.එස්.සී.(ගෞරව), එම්.බී.ඒ.(කොළඹ), පී.එච්.ඩී.(වුහාන්)*

2. විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය

2.1 කොළඹ විශ්වවිද්‍යාලය

කුලපති
ශාසන කීර්ති ශ්‍රී බුද්ධ ශාසන ශෝභන පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක හිමි

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී. එන්. විජයරත්න *(2022.04.11 දක්වා)*
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න *(2022.04.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

නියෝජ්‍ය උප කුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
කේ.ඒ.එස්.එඩ්වඩ්. මහතා

2.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කුලපති

මහාචාර්ය කේ. එම්. ද සිල්වා *(2022.05.04 දක්වා)*

මහාචාර්ය ජී. එච්. පීරිස් *(2022.05.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

උප කුලපති
මහාචාර්ය එම්. ඩී. ළමාවංශ

නියෝජ්‍ය උප කුලපති
මහාචාර්ය ඩබ්ලිව්. එම්. ටී. මධුජිත්

ලේඛකාධිකාරී
එම්. ජේ. ජී. ධර්මසේන මිය (වැඩ බලන)

2.3 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කුලපති

ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝ සභාවේ ශ්‍රී මහා විහාර වංශාලංකාර විමලකීර්ති ශ්‍රී ධම්මාලෝක සාහිත්‍යසූරී ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාරාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ

උප කුලපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. එස්. එල්. ඩබ්ලිව්. ලියනගේ *(2022.12.23 දක්වා)*
මහාචාර්ය එස්. එම්. සී. යූ. පී. සුබසිංහ (වැඩ බලන) (*2022.12.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

ලේඛකාධිකාරී

ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්.ඒ.බී.වැලිවිට මහතා

2.4 කැලණිය විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක ස්වාමීන් වහන්සේ

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා

ලේඛකාධිකාරී
කේ. කේ. කේ. ධර්මතිලක මහතා

2.5 මොරටුව විශ්වවිද්‍යාලය

කුලපති
විද්‍යාජෝති මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්ලිව්. පෙරේරා

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. ඩී. ගුණවර්ධන

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය පී. කේ. එස්. මහානාම (*2022.10.04 දක්වා*)
ආචාර්ය ඩී. පී. චන්ද්‍රසේකර (*2022.10.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

ලේඛකාධිකාරී
ඩබ්ලිව්. එම්. ඩී. පී. එම්. හුලුගල්ල මිය

2.6 යාපනය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය එස්. පද්මනාදන්

උප කුලපති
මහාචාර්ය එස් ශ්‍රීසත්කුනරාජා

නියෝජ්‍ය උපකුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
වී. කන්දීපන් මහතා

2.7 රුහුණ විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය ධර්මකීර්ති ශ්‍රී ආචාර්ය අකුරැටියේ නන්ද නායක හිමි

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.එස්.ඩී. අමරසේන

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය ඊ. පී. එස්. චන්දන

ලේඛකාධිකාරී
පී.එස්. කළුගම මිය

2.8 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කුලපති
ආචාර්ය වී.විවේකානන්දරාජා *(2022.05.14 දක්වා)*
මහාචාර්ය එම්. සෙල්වරාජා *(2022.06.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

උප කුලපති
මහාචාර්ය එෆ්.සී. රගෙල් *(2022.01.21 දක්වා)*
මහාචාර්ය වී. කනගසිංහම් *(2022.02.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

නියෝජ්‍ය උපකුලපති
නියෝජ්‍ය උපකුලපති තනතුර 2022.04.24 දක්වා පුරප්පාඩුව පැවතුණි.
මහාචාර්ය කේ. ඊ. කරුණාකරන් (*2022.04.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

ලේඛකාධිකාරී
ඒ. පහිරදන් මහතා

2.9 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය ඒ. එම්. ඉෂාක් *(2022.11.18 දක්වා)*
එෆ්. මුස්තාපා මහතා *(2022.11.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

උප කුලපති
මහාචාර්ය ඒ. රමීස්

ලේඛකාධිකාරී
එච්. ඒ. සත්තාර් මහතා

2.10 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

කුලපති
රාජකීය පණ්ඩිත පූජ්‍ය ඊතලවැටුනවැවේ ඥානතිලක නායක හිමි

උප කුලපති
මහාචාර්ය ජී. ඒ. එස්. ගිනිගද්දර

ලේඛකාධිකාරී
එන්. සී. එස්. සේනක මහතා (වැඩබලන) (*2022.04.17 දක්වා*)
ඒ.එම්.ජී.බී. අබේසිංහ මහතා (*2022.04.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

2.11 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය පූජ්‍ය කඹුරුගමුවේ වජිර නායක හිමි

උප කුලපති
මහාචාර්ය ආර්.කේ.එස්.යූ.එම්.රත්නායක

ලේඛකාධිකාරී
එස්. උයන්ගොඩ මහතා

2.12 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

කුලපති
දේශබන්දු මහාචාර්ය ටියුලේ ද සිල්වා

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ. එම්. යූ .කේ. ජයසිංහ *(2022.06.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*
ආචාර්ය පී. ජී. සී. එස්. බෝවත්ත (වැඩබලන) *(2022.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි 2022.06.29 දක්වා)*

ලේඛකාධිකාරී
ඩබ්ලිව්. ඒ. ඩී. චිත්‍රානන්ද මහතා

2.13 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

කුලපති
ත්‍රිපිටකාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී සුමංගල රත්නපාල ධම්මරක්ඛිත අති පූජ්‍ය බෙන්ගමුවේ ශ්‍රී ධම්මදින්න නායක හිමි

උප කුලපති
මහාචාර්ය ජේ.එල්.රත්නසේකර

ලේඛකාධිකාරී
එම් .එෆ්.එච්. කරීම් මහතා

2.14 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කුලපති
සම්මානිත මහාචාර්ය ඩී. ඒ. තන්ත්‍රිගොඩ

උප කුලපති
මහාචාර්ය පී. එම්. සී. තිලකරත්න

නියෝජ්‍ය උප කුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එල්.වී.ජයසේන මිය

2.15 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

කුලපති
සම්මානිත මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ආචාර්ය) ආර්. පී. මහලියනආරච්චි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජේ. රවීන්ද්‍ර (වැඩ බලන) *(2022.08.28 සිට ක්‍රියාත්මක වන පරිදි 2022.09.10 දක්වා)*

ලේඛකාධිකාරී
බී.එම්.දයාවංස මයා

2.16 ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM)

[1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ස්ථාපිත කරන ලදී]

කුලපති
සාහිත්‍ය චක්‍රවර්ති, මල්වතු පාර්ශ්වයේ අනුනායක, පූජ්‍ය ආචාර්ය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංගරක්ඛිත විජිතසිරි ස්වාමීන් වහන්සේ

උප කුලපති

මහාචාර්ය ආර්. ඩබ්ලිව්. සෙනෙවිරත්න (වැඩබලන)

ලේඛකාධිකාරී
බී. ඒ. එන්. ක්‍රිෂාන්ත මහතා

2.17 වව්නියාව විශ්වවිද්‍යාලය

(1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2021.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වව්නියාව විශ්වවිද්‍යාලය පිහිටුවන ලදී)

කුලපති
ආචාර්ය එස්. මෝහනදාස්

උප කුලපති
ආචාර්ය ටී. මංගලේශ්වරන්

ලේඛකාධිකාරී
එන්.රාජවිසහන් මහතා

3. ආයතන

3.1 කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව

3.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.එම්.ජී. අධිකාරී

3.3 කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය ඩබ්ලිව්. ජී. එස්. කේ. ගමගේ

3.4 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එස්. රාජපක්ෂ

3.5 පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි

3.6 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල

3.7 ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.එස්. රඹුක්වැල්ල *(2022.02.28 දක්වා)*
ආචාර්ය ඒ. ආර්. රසූල් *(2022.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

3.8 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එස්. ජේ. එස්. ද මෙල්

3.9 දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. ඒ. පරණගම

3.10 මානව සම්පත් අභිවර්ධන ආයතනය

අධ්‍යක්ෂ

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න *(2022.09.14 දක්වා)*

මහාචාර්ය ඩබ්ලිව්. එස්. වන්ද්‍රසේකර *(2022.09.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

3.11 කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය කේ.පී.හේවාගමගේ *(2022.05.31 දක්වා)*

ආචාර්ය ඩී ඒ එස් අතුකෝරළ *(2022.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

3.12 ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ

ආචාර්ය කේ. ජී. පී. ජී. විජේතුංග මිය

3.13 තොරතුරු තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ

මේජර් ජෙනරාල් [විශ්‍රාමික] එස්.කේ. තිරුනාවුකරසු

3.14 ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය බී. පී. ගල්හේන

3.15 මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

අධ්‍යක්ෂ

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා (වැඩ බලන)

3.16 සෞන්දර්යය අධ්‍යයන පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය

අධ්‍යක්ෂ

ආචාර්ය එෆ්.බී. කෙනඩි (මිය)

3.17 කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා සඳහා වන අධ්‍යාපන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ

ආචාර්ය එන්. පී. විදානපතිරණ (වැඩ බලන) *(2022.03.01 දක්වා)*

ආචාර්ය ඒ.ඩී.අම්පිටියවත්ත *(2022.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

3.18 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය සී. අබේසේන

3.19 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය එස්. ඩී. ධර්මරත්න

4. මණ්ඩප

4.1 ත්‍රිකුණාමලය මණ්ඩපය

මණ්ඩපාධිපති

එස්. තඩ්වනමූර්ති මහතා *(2022.01.31 දක්වා)*

මහාචාර්ය සී. ජී.දේවදාසන් මිය *(2022.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

4.2 ශ්‍රීපාලී මණ්ඩපය

මණ්ඩපාධිපති

ආචාර්ය එස්. ඩබ්ලිව්. පී. මහානාමහේවා

5. විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කර, 2021 පෙබරවාරි මස පවත්වන ලද අ.පොෂ.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව, 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමට 2022 සැප්තැම්බර් 05 සහ 2022 සැප්තැම්බර් 23 අතර කාලය තුළ අනාගත අපේක්ෂකයින්ගෙන් මාර්ගගතව අයදුම්පත් කැඳවන ලදී. අනතුරුව කඩඉම් ලකුණු 2022 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලද අතර සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් කරන ලදී. විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීම තවමත් සිදුවෙමින් පවතින අතර 2023 දී එම කටයුතු අවසන් කිරීමට නියමිතය.

5.1 සාමාන්‍ය විධිවිධාන යටතේ 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම (2021 පෙබරවාරි මාසයේ පැවති අ.පොෂ. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)

2021/2022 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීමට පහත සඳහන් ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී.

1. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2021 වර්ෂයේ පවත්වන ලද අ.පොෂ.උසස් පෙළ විභාගයේ දී අයදුම්කරුවන් ලබාගත් ඉසෙඩ් ලකුණුවල සාමාන්‍ය අනුව පෙළගැස්වූ කුසලතා අනුපිළිවෙල මත පදනම්ව සිදු කිරීම.

2. [*කලා, කලා (SP), කලා(SAB), සන්නිවේදන අධ්‍යයන, සාමය හා ගැටුම් නිරාකරණය, ඉස්ලාම් අධ්‍යයන, අරාබි භාෂාව සහ ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL), සමාජ වෘතවේදය සහ කලා-තොරතුරු තාක්ෂණය*] වැනි කලා පාඨමාලා සඳහා දී ඇති දිස්ත්‍රික්කයකින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් මුළු සංඛ්‍යාව, 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයේ දී යම් දිස්ත්‍රික්කයකින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් මුළු සංඛ්‍යාවට වඩා අඩු නොවිය යුතුය යන කොන්දේසියට යටත්ව දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිසුන් ඇතුළත් කිරීම් සිදු කරන ලදි.

3. ඉහත 5.1.2 හි සඳහන් පාඨමාලා හැරුණු විට අනෙකුත් සියලුම පාඨමාලා සඳහා ද්විත්ව නිර්ණායක මත ඇතුළත් කිරීම් සිදු කරන ලදි:
   - දීප ව්‍යාප්ත කුසලතා පදනම
   - දිස්ත්‍රික් කුසලතා පදනම

4. යම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඇති මුළු ස්ථානවලින් 40% ක් දක්වා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙල ගැසූ ඉසෙඩ් ලකුණු අනුව සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

5. ඉතිරි 60% න් 55%ක් දක්වා දිස්ත්‍රික් කුසලතා පදනම මත සිසුන් තෝරා ගැනේ. යම් දිස්ත්‍රික්කයකින් දීප ව්‍යාප්ත කුසලතා පදනම් මත කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා තෝරා ගන්න සිසුන්ට (40%) අමතරව, දිස්ත්‍රික් කුසලතා පදනම යටතේ තවත් 55% ක් දක්වාද අමතර සිසුන් සංඛ්‍යාවක් තෝරා ගැනේ. ඒ අනුව, එක් එක් පාඨමාලාවේ ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 55%ක් දක්වා, පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව එනම්, ශ්‍රී ලංකාවේ මුළුජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතය අනුව බෙදා හැරේ.

6. එක් එක් පාඨමාලාවේ පවතින 5%ක් දක්වා වූ ඉතිරි ස්ථාන සිසුන් අතර බෙදා හැරීමේදී, අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යැයි හඳුනාගෙන ඇති පහත

දැක්වෙන දිස්ත්‍රික්ක 16 සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව එම ස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික්ක 16 හි මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජනසංඛ්‍යා අනුපාතය අනුව බෙදා වෙන් කරනු ලැබේ;

1. නුවරඑළිය
2. හම්බන්තොට
3. යාපනය
4. කිලිනොච්චිය
5. මන්නාරම
6. මුලතිව්
7. වව්නියාව
8. ත්‍රිකුණාමලය
9. මඩකලපුව
10. අම්පාර
11. පුත්තලම
12. අනුරාධපුරය
13. පොලොන්නරුව
14. බදුල්ල
15. මොණරාගල
16. රත්නපුර

7. තවද, කලා හැර වෙනත් පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී, කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඕනෑම දිස්ත්‍රික්කයකට වෙන් කර ඇති දිස්ත්‍රික් පංගු ප්‍රමාණය, 1993/1994 හෝ 2002/2003, අධ්‍යයන වර්ෂයන්වල දී එම එක් එක් පාඨමාලාව සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයට වෙන් කර තිබූ දිස්ත්‍රික් පංගු ප්‍රමාණයේ උපරිමයට වඩා අඩු නොවන අයුරින් සිදු කෙරිණි.

8. ඒ අනුව, 2021 වර්ෂයේ අ.පොෂ.ස. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා Z-අගය පදනම් කරගෙන 2021/2022 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම, 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කළ "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය" යන අත්පොතෙහි ඇතුළත් නීතිරීතිවලට යටත්ව සිදු කරන ලදී.

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා යෝජිත බඳවා ගැනීම් ප්‍රමාණය 42,519 ක් වූ අතර 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට අපේක්ෂකයින් 171,497 ක් සුදුසුකම් ලබා තිබුණි.

5.1.1 සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)*

පහත දැක්වෙන පරිදි සාමාන්‍ය විධිවිධාන යටතේ සිසුන් 41,228 ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලදි;

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)*
1	වෛද්‍ය විද්‍යාව	2005
2	දන්ත ශල්‍ය විද්‍යාව	150
3	පශු වෛද්‍ය විද්‍යාව	128
4	කෘෂිකර්මය	881
5	ආහාර විද්‍යාව හා පෝෂණය	162
6	ජෛවීය විද්‍යාව	1671
7	ව්‍යවහාරික විද්‍යාව(ජෛවිය විද්‍යාව)	406
8	ඉංජිනේරු විද්‍යාව	2207
9	ඉංජිනේරු විද්‍යාව - (EM)	78
10	ඉංජිනේරු විද්‍යාව - (TM)	96
11	ප්‍රමාණ සමීක්ෂණය	150
12	පරිගණක විද්‍යාව	691
13	භෞතික විද්‍යාව	2303

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)*
14	මැනුම් විද්‍යාව	163
15	ව්‍යවහාරික විද්‍යාව (භෞතීය විද්‍යාව)	762
16	කළමනාකරණය	5367
17	දේපල කළමනාකරණය හා තක්සේරුකරණය	68
18	වාණිජ්‍යය	880
19	කලා	6562
20	කලා (SP)- ජනමාධ්‍ය	108
21	කලා (SAB)	168
22	කළමනාකරණ අධ්‍යයන - (TV)	225
23	වාස්තු විද්‍යාව	93
24	නිර්මාණවේදය	74
25	නීතිය	491
26	තොරතුරු තාක්ෂණය (IT)	249
27	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT)	115
28	කළමනාකරණය (රාජ්‍ය) විශේෂ	112
29	සන්නිවේදන අධ්‍යයනය	198
30	නගර හා ග්‍රාම නිර්මාණය	87
31	සාමය හා ගැටුම් නිරාකරණය	34
32	ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	379
33	යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	87
34	විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය	65
35	ආහාර විද්‍යාව හා තාක්ෂණය	216
36	සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	245
37	භෙද	558
38	තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)	279
39	කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය	219
40	කළමනාකරණ අධ්‍යයන (TV)	231
41	කලා (විශේෂ) / ප්‍රසාංගික කලා	108
42	කලා (SAB)	137
43	පරිවර්තන අධ්‍යයනය	55
44	සංගීතය	69
45	නර්තනය	59
46	සංගීතය	269
47	නර්තනය	273
48	නාට්‍ය හා රංග කලා	64
49	ආහාර ව්‍යාපාර කළමනාකරණය	66
50	සෞඛ්‍ය ප්‍රවර්ධනය	101
51	ඖෂධ විද්‍යාව	227

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)*
52	වෛද්‍ය රසායනාගාර විද්‍යා	222
53	විකිරණ ශිල්පය	66
54	භෞත චිකිත්ස	110
55	පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	107
56	පහසුකම් කළමනාකරණය	79
57	ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය	89
58	අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව	78
59	කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය	119
60	සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	77
62	ධීවර සහ සාගර විද්‍යාව	148
63	ඉස්ලාම් අධ්‍යයනය	276
64	විද්‍යාව සහ තාක්ෂණය	105
65	පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	99
66	ව්‍යවසායකත්වය හා කළමනාකරණය	99
67	සත්ත්ව පාලන විද්‍යාව	106
68	සංගීතය	75
69	නර්තනය	62
70	චිත්‍ර සහ නිර්මාණ	42
71	නාට්‍ය හා රංග කලා	74
72	දෘශ්‍ය සහ තාක්ෂණික කලා	67
73	අපනයන කෘෂිකර්මය	103
74	තේ තාක්ෂණය සහ අගය වැඩිකිරීම	110
75	කාර්මික තොරතුරු තාක්ෂණය	98
76	ඛනිජ සම්පත් සහ තාක්ෂණය	104
77	ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BIS)	78
79	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි)	168
80	ආගනණය සහ තොරතුරු පද්ධති	176
81	ශාරීරික අධ්‍යාපනය	132
82	ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	226
83	කථන හා ශ්‍රවන විද්‍යා	80
84	අරාබි භාෂාව	223
85	දෘශ්‍ය කලා	105
86	සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව	72
87	ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	137
88	ජලජ සම්පත් තාක්ෂණය	112
89	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම	102
90	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	105
91	තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය	118

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)*
92	සංචාරක හා සත්කාරක කළමනාකරණය	179
93	කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය	179
94	කෘෂි ව්‍යාපාර කළමනාකරණය	76
95	හරිත තාක්ෂණය	70
96	තොරතුරු පද්ධති	153
97	භූමි නිර්මාණවේදය	70
98	පරිවර්තන අධ්‍යයනය (කැලණිය සහ සබරගමුව)	53
99	මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	170
100	සිනමා හා රූපවාහිනී අධ්‍යයන	58
101	ව්‍යාපෘති කළමනාකරණය	99
102	ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	1321
103	ජෛව පද්ධති තාක්ෂණවේදය (BST)	1233
104	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	890
105	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)	79
106	සාගර හා මිරිදිය විද්‍යාව	98
107	ආහාර ව්‍යාපාර කළමනාකරණය	66
108	භෞතීය විද්‍යාව - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	152
109	ව්‍යාපාර විද්‍යාව	147
110	මූල්‍ය ඉංජිනේරුකරණය	74
111	භූගෝලීය තොරතුරු විද්‍යාව	73
112	සමාජ වෘතවේදය	49
113	මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය	71
114	මානව සම්පත් සංවර්ධනය	83
115	වෘත්තීය චිකිත්සාව	48
116	දෘෂ්ටිමිතිය	58
117	බුද්ධිමය යන්ත්‍ර විද්‍යාව	48
118	ව්‍යවහාරික රසායන විද්‍යාව	58
119	ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව	78
120	දේශීය ඖෂධ සම්පත්	53
121	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	53
122	සෞඛ්‍ය සංචාරක හා ආගන්තුක සත්කාරක කළමනාකරණය	53
123	ජීව වෛද්‍ය තාක්ෂණය	54
124	දේශීය ඖෂධ තාක්ෂණය	53
125	යෝග සහ පාරමනෝවිද්‍යාව	53
126	සමාජ අධ්‍යයන (දේශීය දැනුම)	53
127	ගිණුම්කරණ තොරතුරු පද්ධති	47

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)*
128	කලා-තොරතුරු තාක්ෂණය	48
129	ජලජ ජෛවසම්පත්	48
130	නාගරික ජෛවසම්පත්	48
131	මූල්‍ය ආර්ථික විද්‍යාව	48
132	ඉංග්‍රීසි භාෂාව හා ව්‍යවහාරික වාග් විද්‍යාව	48
133	බැංකුකරණය හා රක්ෂණ	48
134	නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය	48

වගුව 5.1.1 සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළත්කර ගැනීම් (ප්‍රතිඵල නැවත සමීක්ෂණයට පෙර)*

5.2 හඳුන්වාදෙන ලද නව අධ්‍යයන පාඨමාලා

2021/2022 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නව අධ්‍යයන පාඨමාලා හතරක් (04) හඳුන්වා දෙන ලදී.

අංකය	අධ්‍යයන පාඨමාලාව	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	මූල්‍ය ආර්ථික විද්‍යාව	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	50
2	නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය		50
3	ඉංග්‍රීසි භාෂාව හා ව්‍යවහාරික වාග් විද්‍යාව	ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	50
4	බැංකුකරණය හා රක්ෂණ	වවුනියාව විශ්වවිද්‍යාලය	50
	එකතුව		**200**

වගුව 5.2 2021/2022 අධ්‍යයන වර්ෂයේදී හඳුන්වා දුන් නව අධ්‍යයන පාඨමාලා

5.3 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා අනෙකුත් විශ්වවිද්‍යාලවලට හඳුන්වා දුන් විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලා

අංකය	අධ්‍යයන පාඨමාලාව	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	පරිගණක විද්‍යාව	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	50
2	මෘදුකාංග ඉංජිනේරු		50
3	තොරතුරු පද්ධතිය		50
	එකතුව		**150**

වගුව 5.3. 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා අනෙකුත් විශ්වවිද්‍යාලවලට හඳුන්වා දුන් විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලා

5.4 විශේෂ විධිවිධාන යටතේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම (2020 ඔක්තෝබර් මාසයේ පැවති අ.පොෂ.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)

(අ) අන්ධ හා කායික අශක්නූතාවන් ඇති සිසුන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අන්ධ සිසුන් සීමිත සංඛ්‍යාවක් [බ්‍රෙල් ක්‍රමය භාවිතා කරමින් 2020 අ.පොෂ.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්] කලා අධ්‍යයන පාඨමාලාවටත්, කායික අශක්නූතාවන් ඇති සිසුන් (වෛද්‍යමය වශයෙන් විවිධ කායික අශක්නූතාවන් ඇති බවට සහතික කර ඇති) කලා, වාණිජ්‍යය, ජීව විද්‍යාව හා භෞතික විද්‍යාව යන අධ්‍යයන පාඨමාලාවලට ඇතුළත් කර ගන්නා ලදී.

අධ්‍යයන පාඨමාලාව	එකතුව	විෂයයන්			
		කලා	වාණිජ්‍යය	ජීව විද්‍යාව	භෞතික විද්‍යාව
1. අන්ධ සිසුන්	18	18	-	-	-
2. කායික අශක්නූතාවන් ඇති සිසුන්	77	64	08	01	04
එකතුව	**95**	**82**	**08**	**01**	**04**

වගුව 5.4. (අ) අන්ධ හා කායික අශක්නූතාවන් ඇති සිසුන් ඇතුළත් කිරීම

(ආ) විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන්

අනෙක් සෑම අධ්‍යයන පාඨමාලාවකම ඇති ස්ථානවලින් 0.5%ක ප්‍රමාණයක්, සුළු ඉසෙඩ් ලකුණු සංඛ්‍යාවක අඩුවක් නිසා සාමාන්‍ය ප්‍රවේශය යටතේ යම්කිසි පාඨමාලාවකට නොතේරුණු එහෙත්, ක්‍රීඩා, සෞන්දර්ය සහ සංස්කෘතික කටයුතු (උදා: නැටුම්, චිත්‍ර, සංගීතය හා සාහිත්‍යය) බාල දක්ෂ සහ ශිෂ්‍ය බට, සමාජ කටයුතු හා වෙනත් බාහිර ක්‍රියාකාරකම්වලින් 2017.10.01 සිට 2020.09.30 දක්වා කාලය තුළ ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන හෝ ජාත්‍යන්තර මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන ඇති ශිෂ්‍යයන්ට මෙම අවස්ථාව පිරිනැමේ. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා එකඟ වී ඇති ස්ථානවලින් 4% ක් දක්වා මෙම කාණ්ඩය යටතේ සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා වෙන් කර ඇත.

අංකය	2020/2021 අධ්‍යයන වර්ෂය		
	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව	
		නව විෂය නිර්දේශය	පැරණි විෂය නිර්දේශය
1	වෛද්‍ය විද්‍යාව	8	1
2	දන්ත ශල්‍ය විද්‍යාව	1	1
3	පශු වෛද්‍ය විද්‍යාව	1	
4	කෘෂිකර්මය	3	
5	ආහාර විද්‍යාව හා පෝෂණය	1	
6	ජෛවීය විද්‍යාව	6	

අංකය	2020/2021 අධ්‍යයන වර්ෂය		
	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව	
		නව විෂය නිර්දේශය	පැරණි විෂය නිර්දේශය
7	ව්‍යවහාරික විද්‍යාව (ජෛවිය විද්‍යා)	2	
8	ඉංජිනේරු විද්‍යාව	10	
9	ඉංජිනේරු විද්‍යාව (EM)	1	
10	ඉංජිනේරු විද්‍යාව (TM)	1	
11	ප්‍රමාණ සමීක්ෂණය	1	
12	පරිගණක විද්‍යාව	3	
13	භෞතීය විද්‍යාව	11	
14	මිනුම් විද්‍යාව	1	
15	ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යාව)	4	
16	කළමනාකරණය	27	
17	රාජ්‍ය කළමනාකරණය සහ තක්සේරු කිරීම	1	
18	වාණිජ්‍යය	4	1
19	කලා	28	
20	කලා (SP) - ජනමාධ්‍ය	1	
21	කලා (SAB) –A	1	
22	කළමනාකරණ අධ්‍යයන (TV) –A	1	
23	වාස්තු විද්‍යාව	1	
24	නිර්මාණවේදය	1	
25	නීතිය	2	1
26	තොරතුරු තාක්ෂණය (IT)	1	
27	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT)	1	
28	කළමනාකරණය (රාජ්‍ය) විශේෂ	1	
29	සන්නිවේදන අධ්‍යයන	1	
30	නගර හා ග්‍රාම නිර්මාණය	1	
32	ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	2	
35	ආහාර විද්‍යාව හා තාක්ෂණය	1	
36	සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	1	
37	භෙද	2	
38	තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)	1	
39	කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය	1	
40	කළමනාකරණ අධ්‍යයන (TV) –B	1	
41	කලා (විශේෂ) - ප්‍රසාංගික කලා	1	
42	කලා (SAB) -B	1	
45	නර්තනය	1	
46	සංගීතය	11	
47	නර්තනය	11	1
48	නාට්‍ය හා රංග කලා	2	
49	දෘශ්‍ය කලා	1	1
51	ඖෂධ විද්‍යාව	1	

අංකය	2020/2021 අධ්‍යයන වර්ෂය		
	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව	
		නව විෂය නිර්දේශය	පැරණි විෂය නිර්දේශය
52	වෛද්‍ය රසායනාගාර විද්‍යාව	1	1
54	භෞත චිකිත්ස	1	1
55	පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	1	
56	පහසුකම් කළමනාකරණය	1	
57	ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය	1	
58	අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව	1	1
59	කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය	1	
60	සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	1	
62	ධීවර සහ සාගර විද්‍යාව	1	
63	ඉස්ලාම් අධ්‍යයන	1	
64	විද්‍යාව සහ තාක්ෂණය	1	
65	පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	1	
66	ව්‍යවසායකත්වය සහ කළමනාකරණය	1	
67	සත්ත්ව පාලන විද්‍යාව	1	1
68	සංගීතය	1	
69	නර්තනය	1	
71	චිත්‍ර හා නිර්මාණ	1	
73	අපනයන කෘෂිකර්මය	1	
74	තේ තාක්ෂණය සහ අගය වැඩිකිරීම	1	
76	ඛනිජ සම්පත් සහ තාක්ෂණය	1	
77	ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BIS)	1	
79	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි)	1	
80	ආගනණය සහ තොරතුරු පද්ධති	1	
81	ශාරීරික අධ්‍යාපනය	1	
82	ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	1	
83	කථන ගා ශ්‍රවන විද්‍යා	1	
89	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම	1	
90	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරනය	1	
91	තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය	1	
92	සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය	1	
93	කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය	1	
94	හරිත තාක්ෂණය	1	
96	තොරතුරු පද්ධති	1	
97	පරිවර්තන අධ්‍යයන	1	
99	මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	1	
100	සිනමා හා රූපවාහිනී අධ්‍යයන	1	
101	ව්‍යාපෘති කළමනාකරණය	1	
102	ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	3	

අංකය	2020/2021 අධ්‍යයන වර්ෂය		
	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව	
		නව විෂය නිර්දේශය	පැරණි විෂය නිර්දේශය
103	ජෛව පද්ධති තාක්ෂණවේදය (BST)	4	
104	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	1	
105	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)	1	
106	සාගර සහ මිරිදිය විද්‍යාව	1	
107	ආහාර ව්‍යාපාර කළමනාකරණය	1	
108	භෞතීය විද්‍යා - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	1	
109	ව්‍යාපාර විද්‍යාව	1	
110	මුල්‍ය ඉංජිනේරුකරණය	1	
111	භූගෝලීය තොරතුරු විද්‍යාව	1	
112	සමාජ වෘතවේදය	1	
113	මුල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය	1	
114	මානව සම්පත් සංවර්ධනය	1	
115	දෘෂ්ටිමිතිය	1	
116	බුද්ධිමය යාන්ත්‍ර විද්‍යාව	1	
117	ව්‍යවහාරික රසායන විද්‍යාව	1	
118	ඉලෙක්ට්‍රොනික සහ පරිගණක විද්‍යාව	1	
119	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	1	
120	සෞඛ්‍ය සංචාරක සහ ආගන්තුක සත්කාරක කළමනාකරණය	1	
121	යෝග සහ පාරමනෝවිද්‍යාව	1	
122	සමාජ අධ්‍යයන (දේශීය දැනුම)	1	
123	ගිණුම්කරණ තොරතුරු පද්ධති	1	
124	කලා - තොරතුරු තාක්ෂණය	1	
125	නාගරික ජෛව සම්පත්	1	

වගුව 5.4. (ආ) විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම

(ඇ) ගුරුවරුන් ඇතුළත් කර ගැනීම

සෑම අධ්‍යයන වර්ෂයකදී ම කලා, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව සහ ව්‍යවහාරික විද්‍යාව යන පාඨමාලා සඳහා පහත සඳහන් කාණ්ඩවලට අයත් ගුරුවරුන් සීමිත සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව, මෙම විශේෂ විධිවිධාන යටතේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා පහත අවශ්‍යතා සපුරාලන ගුරුවරුන් සලකා බලන ලදී.

i. 2016 වර්ෂයේදී හෝ ඊට පසු වර්ෂයකදී ඉංග්‍රීසි විෂය සහිතව සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය / ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන්.

ii. ජෛවීය විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික විද්‍යාව යන පාඨමාලාවක් සඳහා 2016 වර්ෂයේ දී හෝ ඊට පසු වර්ෂයක දී විද්‍යාවේ දී (බාහිර) උපාධි පාඨමාලාවේ පළමු විභාගය සමත් වූ ගුරුවරුන්.

ඒ අනුව 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා (ඉංග්‍රීසි) අධ්‍යයන පාඨමාලාව සඳහා මෙම කාණ්ඩය යටතේ 01ක් ගුරුවරයෙක් තෝරා ගන්නා ලදී.

(ඇ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා මෙම කාණ්ඩය යටතේ තෝරාගත් සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ;

විශේෂ විධිවිධාන	තෝරාගත් සංඛ්‍යාව
විදේශයන්හි අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලාංකිකයන් සහ විදේශීය සිසුන්	44

වගුව 5.4. (ඇ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම

(ඉ) සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම

වෛද්‍ය, දන්ත ශල්‍ය විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යා සඳහා බඳවා ගැනීමට යෝජිත ස්ථානවලින් 0.5%ක ප්‍රමාණයක් මෙම ප්‍රතිපාදන යටතේ, ස්ථිර සේවයේ නියුක්ත සන්නද්ධ සේවා නිලධාරීන් සහ මෙහෙයුම් ප්‍රදේශවල සේවය කරන පොලිස් සේවයේ හා විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් වෙත වෙන් කර ඇත.

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා මෙම කාණ්ඩය යටතේ තෝරාගත් සිසුන් සංඛ්‍යාව පහත පරිදි විය;

කේත අංකය	පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව	
		නව විෂය නිර්දේශය	පැරණි විෂය නිර්දේශය
1	වෛද්‍ය	09	01
2	දන්ත ශල්‍ය විද්‍යාව	01	01
8	ඉංජිනේරු විද්‍යාව	06	01

වගුව 5.4. (ඉ) සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම

(ඊ) ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨ දක්ෂතාවත් දක්වා ඇති අයදුම්කරුවන්

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන පාඨමාලා සඳහා ක්‍රීඩාවේ විශිෂ්ටතා

දැක්වූ අපේක්ෂකයින් 05 දෙනෙකු ඇතුළත් කර ගැනීමට ප්‍රතිපාදන සලසා ඇත.

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා මෙම කාණ්ඩය යටතේ තෝරාගත් සිසුන් සංඛ්‍යාව පහත පරිදි විය;

විශේෂ විධිවිධාන	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨ දක්ෂතාවත් දක්වා ඇති අයදුම්කරුවන්	5

වගුව 5.4. (ඊ) ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨ දක්ෂතාවත් දක්වා ඇති අයදුම්කරුවන්

(උ) අභියාචනා යටතේ සිසුන් ඇතුළත් කර ගැනීම - 2020/2021 අධ්‍යයන වර්ෂය

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් අපේක්ෂකයින් විසින් කරන ලද අභියාචනා සහ පැමිණිලි විමර්ශනය කර වාර්තා කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුව විසින් 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ 4.4 වගන්තියට අනුව ඉදිරිපත් කරන ලද අභියාචනා 1843 ක් සලකා බලන ලදී. ඒ අනුව, කමිටුවේ නිර්දේශ අනුව අභියාචනා යටතේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලා සඳහා ඉල්ලා සිටි සිසුන් 1278 දෙනෙකු තෝරා ගන්නා ලදී.

(ඌ) අතිරේක ප්‍රවේශය යටතේ සිසුන් ඇතුළත් කිරීම

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ 1.1 වගන්තියේ දක්වා ඇති ඇතුළත් වීමේ ප්‍රතිපත්තිය මත කලා අධ්‍යයන පාඨමාලාවේ සමහර විෂයයන් සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් තෝරා නොගත හැක. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාන්‍ය ප්‍රවේශ නිර්ණායක යටතේ තෝරාගත් සංඛ්‍යාවට වඩා විශාල සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට ඇතැම් පීඨ සහ අධ්‍යයනාංශවලට හැකියාව පවතී.

එවැනි තත්ත්වයන් තුළ, අදාළ විශ්වවිද්‍යාලවල ඉල්ලීම පරිදි තෝරාගත් විෂය ක්ෂේත්‍ර සඳහා සීමිත අමතර සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තීරණය කළ හැකිය. මෙය විශ්වවිද්‍යාලවල ඇති මානව හා භෞතික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම මෙන්ම සමාජයේ නිපුණ මිනිස් බල අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගත් ‘අතිරේක බඳවා ගැනීමකි’.

2020/2021 කාලසීමාව සඳහා මෙම කාණ්ඩය යටතේ තෝරාගත් සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ;

විශේෂ විධිවිධාන	තෝරාගත් ගණන
අතිරේක ප්‍රවේශය	1014

වගුව 5.4. (ඌ) අතිරේක බඳවා ගැනීම් යටතේ සිසුන් ඇතුළත් කිරීම

5.5 විශේෂ විධිවිධාන යටතේ 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම (2021 පෙබරවාරි මස පවත්වන ලද අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)

අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කර ගැනීම

විශේෂ විධිවිධාන	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
විදේශයන්හි අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලාංකිකයන් සහ විදේශීය සිසුන් (වෛද්‍ය)	25

වගුව 5.5. (අ) විදේශීය සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කර ගැනීම

ආ) සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම

ක්ෂේත්‍ර අංකය	පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
1	වෛද්‍ය	10
2	දන්ත ශල්‍ය විද්‍යාව	5
8	ඉංජිනේරු විද්‍යාව	4

වගුව 5.5. (ආ) සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම

ඇ) අන්ධ සහ කායික අශක්නුතාවන් ඇති සිසුන්

අධ්‍යයන පාඨමාලාව	එකතුව	විෂයයන්			
		කලා	වාණිජ්‍යය	ජීව විද්‍යාව	භෞතික විද්‍යාව
අන්ධ සිසුන්	11	11	-	-	-
කායික අශක්නුතාවන් ඇති සිසුන්	66	52	07	03	04
එකතුව	**77**	**63**	**07**	**03**	**04**

වගුව 5.5. (ඇ) අන්ධ සහ කායික අශක්නුතාවන් ඇති සිසුන්

ඈ) ගුරුවරුන් ඇතුළත් කර ගැනීම

2021/2022 අධ්‍යයන වර්ෂයට අදාළව ගුරුවරුන් බඳවා ගැනීම් සඳහා අයදුම්කරුවන් කිසිවෙක් නොවීය.

ඉ) විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ අභියාචනා

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් අපේක්ෂකයින් විසින් කරන ලද අභියාචනා සහ පැමිණිලි විමර්ශනය කර වාර්තා කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුව විසින් 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ 4.4 වගන්තියට අනුව ඉදිරිපත් කරන ලද අභියාචනා 1657 ක් සලකා බලන ලදී. ඒ අනුව, කමිටුවේ නිර්දේශ අනුව අභියාචනා අදියර 1

යටතේ 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලා ඉල්ලා සිටි සඳහා සිසුන් 572ක් තෝරා ගන්නා ලදී.

ඊ) අතිරේක ප්‍රවේශය

විශේෂ විධිවිධාන	තෝරාගත් සංඛ්‍යාව
අතිරේක ප්‍රවේශය	1073

වගුව 5.5. (ඊ) අතිරේක ප්‍රවේශය

5.6 විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලියේ සංවර්ධනයන් / වෙනස්කම්

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත 2022 සැප්තැම්බර් 02 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දී බලයලත් නියෝජිතයන් වෙත බෙදා දෙන ලදී. ඒ අනුව, අනාගත අපේක්ෂකයින් සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ලබා දීම සඳහා, සිසුන්ට 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු වන විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලය ඔස්සේ මිලදී ගැනීමට අවස්ථාව ලබා දෙමින් මාර්ගගත ක්‍රමයක් සකස් කරන ලදී.

ඒ අනුව, 2021 වර්ෂයේ අ.පොෂ. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු කෙටිම කාලයක් ඇතුළත අනාගත අපේක්ෂකයින්ගෙන් 2021/2022 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම්පත් කැඳවනු ලැබීය. අනාගත අපේක්ෂකයින් දැනුවත් කිරීම සඳහා මාර්ගගත විශ්වවිද්‍යාල අයදුම්පත් පිරවීමේ ක්‍රියාවලිය පිළිබඳ හඳුන්වාදීමේ වීඩියෝවක් සකස් කර භාෂා තුනෙන්ම යූ ටියුබ් හරහා ප්‍රකාශයට පත් කරන ලදී.

2021/2022 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මාර්ගගතව අයදුම් කළ පාසල් අයදුම්කරුවන්ගේ පාසල් අධ්‍යාපනය පිළිබඳ තොරතුරු සත්‍යාපනය කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සකස් කරන ලද ක්‍රමය, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඔවුන්ව සලකා බැලිය යුතු දිස්ත්‍රික්කය තීරණය කිරීම සඳහා භාවිතා කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ වෙන වෙනම අවබෝධතා ගිවිසුම් දෙකක් (MoUs) අත්සන් කර ඇති බැවින්, අයදුම්පත් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛණ තොරතුරු සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ තොරතුරු මාර්ගගත වේදිකා දෙකක් ඔස්සේ පහසුවෙන් ලබා ගන්නා ලදී.

මෙම 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා සඳහා ඇතැම් අධ්‍යයන පාඨමාලා සඳහා සුදුසුකම් ලැබීමට පූර්ව අවශ්‍යතාවයක් වන ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ 39ක් පැවැත්වීමට නියමිතය. පවතින ඒවායෙහි විෂයයන් හා ශ්‍රේණිවල අවශ්‍ය වෙනස්කම් සමඟ එම පාඨමාලා 39 න් 22 ක් සඳහා මෙම ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ අවශ්‍යතාවය 2023/2024 අධ්‍යයන වර්ෂයේ සිට ඉවත් කරනු ලැබේ. එම අධ්‍යයන පාඨමාලා 39 න් 22 ක් සඳහා මෙම ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ අවශ්‍යතාවය 2023/2024 අධ්‍යයන වර්ෂයේ සිට පවතින ඒවායෙහි විෂයයන් සහ ශ්‍රේණිවල අවශ්‍ය වෙනස්කම් සමඟ ඉවත් කරනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුව විසින් අනුමත කරන ලද පරිදි එම වෙනස්කම් 2021/2022 සහ 2022/2023 අධ්‍යයන වර්ෂ සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත හරහා ක්‍රියාත්මක කිරීමට පෙර අඛණ්ඩව අධ්‍යයන වර්ෂ දෙකක් පුරාවට දැනුම් දෙනු ලැබේ.

5.7 වෙනත් සංවර්ධනයන්

අයැදුම්පත් කැඳවීමේ කාලසීමාව තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කරන ලද අතර, අයදුම්පත් කැඳවීමේ කාලසීමාව හා සම්බන්ධ විමසීම් විධිමත් කිරීම සඳහා නිලධාරීන්ද විමසුම්වලට සහභාගි විය.

6. අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම

6.1 ස්ථාවර කමිටු

සංශෝධිත 1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 4 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ ලබා දී ඇති විධිවිධානවලට අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු පිහිටුවා ඇත. එක් එක් ස්ථාවර කමිටුවේ වගකීම නම් අදාළ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය හා සම්බන්ධ කරුණු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීමය. ඒ අනුව සමාලෝචිත වර්ෂය වන 2022 තුළ ස්ථාවර කමිටු 24ක් විවිධ විෂයයන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ක්‍රියාත්මක වේ. එක් එක් ස්ථාවර කාරක සභාව යටතේ පැවති රැස්වීම් සංඛ්‍යාව පහත දැක්වේ;

අංකය	ස්ථාවර කමිටුවේ නම	2022 වර්ෂයේදී පැවැති රැස්වීම් ගණන
01.	වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ස්ථාවර කමිටුව	-
02.	වෛද්‍ය හා දන්ත වෛද්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	07
03.	දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	03
04.	විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	05
05.	කෘෂිකර්ම, පශු වෛද්‍ය විද්‍යා හා සත්ත්ව පාලන විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	06
06.	පශ්චාත් උපාධි අධ්‍යයනය හා පර්යේෂණය පිළිබඳ ස්ථාවර කමිටුව	06
07.	ඉංජිනේරු හා වාස්තු විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	06
08.	තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ස්ථාවර කමිටුව	06
09.	මානව ශාස්ත්‍ර සමාජ විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	06
10.	අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව	06
11.	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව	06
12.	කළමනාකරණ අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව	06
13.	බාහිර උපාධි පිළිබඳ ස්ථාවර කමිටුව	02
14.	පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුව	06
15.	නීති අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව	06
16.	පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	05
17.	ලලිත කලා පිළිබඳ ස්ථාවර කමිටුව	05
18.	සම සෞඛ්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	06
19.	විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා පිළිබඳ ස්ථාවර කමිටුව	06
20.	තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ මාර්ගගත අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව *	03
21.	ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව	03

අංකය	ස්ථාවර කමිටුවේ නම	2022 වර්ෂයේදී පැවැති රැස්වීම් ගණන
22.	සමාජ සංහිඳියාව පිළිබඳ ස්ථාවර කමිටුව	06
23.	තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව	08
24.	ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව සාධාරණත්වය / පිළිබඳ ස්ථාවර කමිටුව	04

වගුව 6.1 2022 දී පැවැත්වූ ස්ථාවර කාරක සභා රැස්වීම් ගණන

සටහන: 2022 වර්ෂයේදී වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම් පැවැත්වුණේ නැත.

6.2 2022 වර්ෂය තුළ අනුමත කරන ලද විශ්වවිද්‍යාල/පීඨ /අධ්‍යයනාංශ/ ප්‍රථම උපාධි පාඨමාලා, බාහිර හා පශ්චාත් උපාධි වැඩසටහන්

අවස්ථා ප්‍රමාණය වැඩි කිරීම සහ උසස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශ ගණන වැඩි කිරීමේ අභිප්‍රාය ඇතිව, 2022 වර්ෂය තුළ නව පීඨ 3ක්, නව අධ්‍යයනාංශ 14ක්, විශේෂවේදී උපාධි පාඨමාලා ඇතුළුව නව උපාධි වැඩසටහන් 19ක්, නව පශ්චාත් උපාධි පාඨමාලා 34ක් සහ නව බාහිර උපාධි වැඩසටහන් 1ක් හඳුන්වා දී අනුමත කර ඇත. මේවා පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත;

6.2.1 2022 වර්ෂයේ අනුමත පීඨ

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පීඨයේ නම
1.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	පරිගණක විද්‍යා පීඨය
2.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	පරිගණක විද්‍යා පීඨය
3.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	උපාධි අධ්‍යයන පීඨය

වගුව 6.2.1 2022 වර්ෂයේ අනුමත පීඨ

6.2.2 2022 වර්ෂයේ අනුමත අධ්‍යයනාංශ

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	අධ්‍යයනාංශයේ නම
1.	කොළඹ විශ්වවිද්‍යාලය	සන්නිවේදන හා නිර්මාණාත්මක කලා අධ්‍යයනාංශය
2.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	විද්‍යාත්මක පරිගණක අධ්‍යයනාංශය
		තොරතුරු පද්ධති ඉංජිනේරු සහ තොරතුරු අධ්‍යයන අධ්‍යයනාංශය
		දැනුම් ඉංජිනේරු සහ සන්නිවේදන අධ්‍යයන අධ්‍යයන අංශය
3.	මොරටුව විශ්වවිද්‍යාලය	පහසුකම් කළමනාකරණ අධ්‍යයනාංශය
4.	යාපනය විශ්වවිද්‍යාලය	යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය
5.	රුහුණු විශ්වවිද්‍යාලය	සමුද්‍ර ඉංජිනේරු සහ නාවික වාස්තු විද්‍යා අධ්‍යයනාංශය

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	අධ්‍යයනාංශයේ නම
6.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	පරිගණක විද්‍යා අධ්‍යයනාංශය
		ආර්ථික හා සංඛ්‍යාන අධ්‍යයනාංශය
7.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයනාංශය
		දත්ත විද්‍යා අධ්‍යයන අංශය
		පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
8.	ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
		තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය

වගුව 6.2.2 2022 වර්ෂයේ අනුමත අධ්‍යයනාංශ

6.2.3 2022 වර්ෂයේදී අනුමත කරන ලද නව ප්‍රථම උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	නව උපාධි වැඩසටහනේ නම
1.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	සමාජ වෘතවේදය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
		බහු අවයවික විද්‍යා සහ කාර්මික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
		සංගීතය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
		මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය
		පරිගණක විද්‍යාව පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය
		තොරතුරු පද්ධති පිළිබඳ පරිගණකවේදී ගෞරව උපාධිය
		නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
2.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය
		දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
3.	ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	ඉංග්‍රීසි භාෂාව සහ ව්‍යවහාරික වාග් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය

වගුව 6.2.3 2022 වර්ෂයේදී අනුමත කරන ලද නව ප්‍රථම උපාධි වැඩසටහන්

6.2.4 2022 වර්ෂයේදී අනුමත කරන ලද විශේෂවේදී උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	උපාධි වැඩසටහනේ නම (විශේෂවේදී)
1.	කොළඹ විශ්වවිද්‍යාලය	සන්නිවේදනය සහ නිර්මාණාත්මක කලා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
2.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	චීන භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
		ජපන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
		ප්‍රංශ භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
		ජාන විද්‍යාව සහ අණුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන
		බෞද්ධ උරුමය සහ සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
3.	යාපනය විශ්වවිද්‍යාලය	හින්දු ශිෂ්ටාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
		සංස්කෘත භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
		සෛව සිද්ධාන්ත පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය

වගුව 6.2.4 2022 වර්ෂයේදී අනුමත කරන ලද විශේෂවේදී උපාධි වැඩසටහන්

6.2.5 2022 වර්ෂයේදී අනුමත කරන ලද පශ්චාත් උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පශ්චාත් උපාධි වැඩසටහනේ නම
1.	කොළඹ විශ්වවිද්‍යාලය	සයිබර් ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර වැඩසටහන
		සයිබර් ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
		සයිබර් ආරක්ෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
		ලිංගික සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
		දේශගුණික විපර්යාස සහ සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පශ්චාත් උපාධි වැඩසටහනේ නම
		දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති උපාධිය
2.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති උපාධිය
		අණුක ජීව විද්‍යාව සහ පෙව තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය
		අණුක ජීව විද්‍යාව සහ පෙව තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
3.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	කාර්මික කාබනික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
		කාර්මික කාබනික රසායන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
		කාර්මික කාබනික රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
		ව්‍යාපාර පිළිබඳ දර්ශනපති උපාධිය
4.	කැලණිය විශ්වවිද්‍යාලය	බැංකු සහ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය
		වෘත්තීය මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
5.	මොරටුව විශ්වවිද්‍යාලය	ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
		දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති උපාධිය
6.	යාපනය විශ්වවිද්‍යාලය	ක්‍රිස්තියානි අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
7.	රුහුණු විශ්වවිද්‍යාලය	සංවර්ධන සැලසුම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
8.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	රාජ්‍ය ප්‍රසම්පාදන සහ සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
		රාජ්‍ය ප්‍රසම්පාදන හා සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
		කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
		කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පශ්චාත් උපාධි වැඩසටහනේ නම
9.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	කළමනාකරණය පිළිබඳ දර්ශන ආචාර්ය උපාධිය (Doctor of Philosophy in Management)
10	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	මානව පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය
		මානව පෝෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
		මානව පෝෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
		ආහාර විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
		ආහාර විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
		ආහාර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
		ගෝලීය මහජන සෞඛ්‍ය පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය
		ගෝලීය මහජන සෞඛ්‍ය පෝෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
		ගෝලීය මහජන සෞඛ්‍ය පෝෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
11.	කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය	ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය

වගුව 6.2.5 2022 වර්ෂයේදී අනුමත කරන ලද පශ්චාත් උපාධි වැඩසටහන්

6.2.6 2022 වර්ෂයේදී අනුමත කරන ලද බාහිර උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	බාහිර උපාධි වැඩසටහනේ නම
1.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	ශාස්ත්‍රවේදී (බාහිර) සාමාන්‍ය උපාධිය

වගුව 6.2.6 2022 වර්ෂයේදී අනුමත කරන ලද බාහිර උපාධි වැඩසටහන්

6.3 2022 වර්ෂය තුළ අනුමත කරන ලද පීඨ, අධ්‍යයනාංශ හා ප්‍රථම උපාධි පාඨමාලාවල නම වෙනස් කිරීම්

2022 වර්ෂය තුළ, පහත වගුවල දක්වා ඇති පරිදි පිළිවෙළින් අධ්‍යයනාංශ තුනක (3) නම් සහ ප්‍රථම උපාධි වැඩසටහන් එකක (01) නම වෙනස් කිරීම් යෝජනා කර අනුමත කරන ලදී.

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	අධ්‍යයනාංශයේ පැවැති නම	අධ්‍යයනාංශයේ අනුමත නම
1.	මොරටුව විශ්වවිද්‍යාලය	ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ අධ්‍යයනාංශය (DTLM)	ප්‍රවාහන කළමනාකරණ සහ සැපයුම් ඉංජිනේරු අධ්‍යයනාංශය (DTMLE)
2.	රුහුණු විශ්වවිද්‍යාලය	කෘෂිකර්ම ඉංජිනේරු අධ්‍යයනාංශය	කෘෂිකර්ම ඉංජිනේරු සහ පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය
3.	රුහුණු විශ්වවිද්‍යාලය	කෘෂිකර්ම ආර්ථික අධ්‍යයනාංශය	කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සහ කෘෂි ව්‍යාපාර අධ්‍යයනාංශය

වගුව: 6.3.1 2022 වර්ෂයේදී අනුමත කරන ලද අධ්‍යයනාංශවල නම වෙනස් කිරීම්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පැවැති නම	අනුමත නම
1.	ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	සත්ත්ව විද්‍යාවේදී ගෞරව උපාධිය	සත්ත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

වගුව 6.3.2 2022 වර්ෂයේදී අනුමත කරන ලද ප්‍රථම උපාධි වැඩසටහන්වල නම් වෙනස් කිරීම්

6.4 දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලාංකික සිසුන් තම උසස් අධ්‍යාපන හදාරන ලද දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල පිළිගැනීමේ සහතිකය ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම් බොහෝ ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු දෙපාර්තමේන්තුව විසින් සපුරා දෙන ලදී. මෙම දේශීය හා විදේශීය පිළිගැනීම් කටයුතු මාර්ගගත ක්‍රමය හරහා සිදු කරනු ලබන අතර, මෙය කොවිඩ් -19 තත්ත්වය තුළ මහජනතාවට මහත් රුකුලක් වූ අතර, අධ්‍යයන කටයුතු අංශය විසින් අන්තර්ජාලය හරහා අදාළ ලේඛන හොඳින් පරීක්ෂා කිරීමෙන් පසු පිළිගැනීම් ලිපිය නිකුත් කිරීමට පහසුකම් සලසා ඇත. 1992 මාර්තු 13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/92 හි විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාල පිළිබඳ ජාත්‍යන්තර අත්පොතේ සහ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල විශ්වවිද්‍යාල පිළිබඳ වාර්ෂික සංග්‍රහයේ ලැයිස්තුගත කර ඇති විදේශ විශ්වවිද්‍යාල සඳහා පිළිගැනීමේ ලිපි නිකුත් කරනු ලැබේ.

6.5 වෙනත් ක්‍රියාකාරකම්

6.5.1 මානව ශාස්ත්‍ර සඳහා තොරතුරු තාක්ෂණය -2022

ක්‍රියාකාරකම්	විස්තරය
තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම මගින් කලා/මානව ශාස්ත්‍ර උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩිදියුණු කිරීමේ යෝජනාව	තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම මගින් කලා/මානව ශාස්ත්‍ර උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩිදියුණු කිරීමේ යෝජනාව i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහාය ඇතිව පිරිනමනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකයක් / ඩිප්ලෝමාවක් ලබා ගැනීමට උපාධි අපේක්ෂකයින්ට අවස්ථාවක් ලබා දීම. ii. සිසුන්ට නවීන පහසුකම් අත්විඳීමට හැකිවන පරිදි සියලුම මානව ශාස්ත්‍ර හා කලා පීඨවල තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම. iii. සියලුම මානව ශාස්ත්‍ර හා කලා පීඨවල තොරතුරු තාක්ෂණ සේවා ඒකක/අධ්‍යයනාංශ පිහිටුවීම **1. තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකයක් / ඩිප්ලෝමාවක් හඳුන්වා දීම** SLQF 3 (ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය) වැනි මට්ටමේ ශ්‍රේණිගත කර ඇති තොරතුරු තාක්ෂණය පිළිබඳ දෙවසරක අධ්‍යයන වැඩසටහනක් සිසුන්ට ඔවුන්ගේ දැනට පවතින අධ්‍යයන පාඨමාලාවලට අමතරව හැදෑරීමට අවස්ථාව සැලසීම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම පාඨමාලාව පළමු වසරේ දෙවන අධ්‍යයන වාරයේ සිට ආරම්භ වන අතර සෑම සමාසිකයකම, සෑම සතියකම පන්තිකාමරවල හෝ පරිගණක විද්‍යාගාරවල පැය 08-10ක් පමණ අධ්‍යයන කටයුතු කිරීම සිදු වේ. ශිෂ්‍යයා විභාග සාර්ථකව නිම කරන්නේ නම්, ශිෂ්‍යයාට ඔහුගේ / ඇයගේ අධ්‍යයන කටයුතු අවසන් වීමට පෙර ඩිප්ලෝමාව ලබා ගැනීමට හැකි විය යුතුය. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය (UCSC) සමඟ මූලික සාකච්ඡා සිදු කර ඇති අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සහ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය අතර ගිවිසුම අත්සන් කිරීමට නියමිතය.

ක්‍රියාකාරකම්	විස්තරය
	2. මානව ශාස්ත්‍ර / කලා පීඨවල තොරතුරු තාක්ෂණ සම්පත් ශක්තිමත් කිරීම
	මෙම පාඨමාලාව මූලික වශයෙන් පරිගණක විද්‍යාගාර පරිසරයක් තුළ පැවැත්වීමට ඉලක්ක කර ඇති අතර, එක් සැසියකට උපරිම සිසුන් 70ක් මෙයට ඇතුළත් වේ. සෑම ශිෂ්‍ය කණ්ඩායමකටම මෙම පහසුකම, සතියකට පැය 08 ක සෘජු සහ වක්‍ර ලෙස භාවිතා කිරීමට අවස්ථාව ලබා දීම සහතික කෙරේ. ඒ අනුව, පෙරවරු 8 සිට පස්වරු 7 දක්වා දින හතක මෙහෙයුම් කාලසටහනක් සමඟින්, පරිගණක 50 කින් යුත් එක් විද්‍යාගාරයක සිසුන් 450 කට ඉඩ සලසා දින හැකිය. සෑම සිසුන් 9 දෙනෙකුටම එක් පරිගණකයක් යන අනුපාතයට නව පරිගණක විද්‍යාගාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. (මෙය සතියක් තුළ සාමාන්‍ය පැය 8ක් සඳහා ශිෂ්‍යයෙකුට පරිගණකයක් භාවිතා කිරීමට අවස්ථාව ලබා දේ). සංවිධානය කිරීමේ පහසුව සඳහා, විද්‍යාගාර කාණ්ඩ දෙකක් යෝජනා කෙරේ. සිසුන් 70 දෙනෙකුට ඉඩ සැලැස්විය හැකි විශාල විද්‍යාගාර සහ සිසුන් 50 දෙනෙකුට ඉඩ සැලැස්විය හැකි මධ්‍ය විද්‍යාගාර. දැනට එක් එක් මානව ශාස්ත්‍ර/කලා/සමාජ විද්‍යා පීඨවල සිටින සිසුන් සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින් අවශ්‍ය පරිගණක විද්‍යාගාර ගණනය කෙරේ. ඒ අනුව හඳුනාගත් පීඨවල මහා පරිමාණ විද්‍යාගාර 08ක් සහ මධ්‍ය පරිමාණ විද්‍යාගාර 15ක් ස්ථාපිත කෙරේ.
	3. මානව සම්පත් වැඩිදියුණු කිරීම සහ සෑම පීඨයකම තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශ / ඒකක පිහිටුවීම.
	මානව ශාස්ත්‍ර/කලා පීඨවල තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීමට බාධාවක් ලෙස නිපුණ තොරතුරු තාක්ෂණ ශ්‍රම බලකායක් (කථිකාචාර්යවරුන්, පූර්ණ කාලීන උපදේශකයින්) නොමැති වීම හඳුනාගෙන ඇත. ඒ අනුව, අරමුණු 1 සහ 2 සඳහා සහය දැක්වීම සඳහා මානව ශාස්ත්‍ර

ක්‍රියාකාරකම්	විස්තරය
	කලා සහ දෘශ්‍ය හා රංග කලා පීඨවල කාණ්ඩ හතරක් යටතේ නව සේවක තනතුරු විවෘත කිරීමට යෝජනාවෙන් අපේක්ෂා කෙරේ. 1. අධ්‍යයන - කථිකාචාර්ය / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2. තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය (ප්‍රදර්ශකවරුන්) 3. අධ්‍යයන සහාය - උපදේශකයින් 4. අනධ්‍යයන - කළමනාකරණ සහකාර/වැඩ සහායක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සේවක සංඛ්‍යාව 80ක් සඳහා අනුමැතිය ලැබී ඇති අතර විශ්වවිද්‍යාල තුළ බඳවා ගැනීම් සිදු කෙරේ. **තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශ පිහිටුවීම** තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශ, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා/කලා පීඨ යටතේ පහත උසස් අධ්‍යාපන ආයතනවල පිහිටුවා ඇත; 1. කොළඹ විශ්වවිද්‍යාලය 2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය 3. කැලණිය විශ්වවිද්‍යාලය 4. යාපනය විශ්වවිද්‍යාලය 5. රුහුණු විශ්වවිද්‍යාලය 6. නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව 7. ත්‍රිකුණාමල මණ්ඩපය 8. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය 9. සෞන්දර්ය විශ්වවිද්‍යාලය 10. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාල නිපුණතා පරීක්ෂණය (UCTIT)	විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන් අධ්‍යයන වර්ෂයේ විවිධ දිනවල ආරම්භ වන බැවින්, යම් වැඩසටහනකට තෝරා ගැනීමෙන් පසුව පවා සිසුන්ට යම් කාලයක් බලා සිටීමට සිදු වන අතර සමහර වැඩසටහන් වලදී ඊට මාස කිහිපයක් ගත විය හැකිය. ඒ අතරම, තොරතුරු තාක්ෂණයේ මූලික මාතෘකා ආවරණය වන පරිදි පුළුල් පාඨමාලා වලින් සමන්විත දිගානති වැඩසටහනක් සැපයීමට ප්‍රමාණවත් කාලයක් ද නොමැත. ඕනෑම උපාධි අපේක්ෂකයෙකුට තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම සහ කුසලතාව

ක්‍රියාකාරකම්	විස්තරය
	අත්‍යවශ්‍ය වන අතර ඔවුන් සාමාන්‍යයෙන් තොරතුරු තාක්ෂණ දැනුම සම්බන්ධයෙන් විවිධ මට්ටම්වල සිටින කණ්ඩායමක් බව අවබෝධ කර ගැනීමෙන් පසු යම් සහතිකයක් සහිත තොරතුරු තාක්ෂණ වැඩසටහනක් හඳුන්වාදීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. යෝජනාවේ අරමුණු 1. විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබමින් ඊට ඇතුළත් වන්නන්ගේ තොරතුරු තාක්ෂණ අධ්‍යාපනයේ විවිධ මට්ටම් සලකා බලා ඔවුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතාවය ඉහළ නැංවීම. 2. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අපේක්ෂා කරන අයවලුන්ට තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය දිගටම කරගෙන යාමට පදනමක් සැපයීම. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය විසින් වැඩසටහනේ සංවර්ධන පිරිවැය (ප්‍රාග්ධන පිරිවැය) සඳහා ආයෝජනය කරන අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පුනරාවර්තන පිරිවැය සඳහා මූල්‍යාධාර ලබා දෙනු ඇතැයි යන කොන්දේසියට යටත්ව, තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාල නිපුණතා පරීක්ෂණ වැඩසටහන දිගටම කරගෙන යාමට කොමිෂන් සභාව අනුමත කරන ලදී.

6.5.2 ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL)

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) යනු විශ්වවිද්‍යාලවල 3 වන වසරේ ඉගෙනුම ලබන සිසුන්ට ජාතික මට්ටමේ සහතිකයක් සමඟ පිරිනමනු ලබන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ පරිපාලනය වන ජාතික මට්ටමේ පරීක්ෂණයකි. පරීක්ෂණ පරිපාලනය කිරීම සඳහා UTEL සඳහා වන ඉම් ලකුණු සංවර්ධනය කර ප්‍රකාශයට පත් කරන ලදී. UTEL සිසුන්ගේ අත්පොත සමඟ සංයුක්ත තැටිය විශ්වවිද්‍යාල අතර බෙදා හරින ලදී. UTEL හි නියමු පරීක්ෂණය පරිපාලනය UTEL හි ක්‍රියාකාරී සැලසුම් කමිටුව සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ 2023 ජනවාරි මාසයේදී ආරම්භ කෙරේ. කාලරාමුවට අනුව නියමු පරීක්ෂණයේ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමෙන් පසු UTEL හි සැබෑ පරීක්ෂණය 2023 අවසානයේ පරිපාලනය කෙරේ.

6.5.3. විශ්වවිද්‍යාලට ඇතුළත් වීමට පෙර පවත්වන මාර්ගගත /විද්‍යුත් ඉගෙනුම ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ වැඩසටහන

විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන්ගේ ඉංග්‍රීසි භාෂාව වැඩිදියුණු කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාලට ඇතුළත් වීමට පෙර පවත්වන මාර්ගගත /විද්‍යුත් ඉගෙනුම් ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ වැඩසටහන සැලසුම් කර සංවර්ධනය කර ඇත. මෙම වැඩසටහනේ මොඩියුල 15 හි විෂය නිර්දේශය, උපදේශක කණ්ඩායමයක් සහ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය (UCSC) විසින් සකස් කර ඇත. 2023 ජනවාරි මස ආරම්භයේදී නව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂාවෙන් සිටින කාලය අතරතුර ඔවුන්ගේ ඉංග්‍රීසි භාෂාව වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන දියත් කෙරේ.

6.5.4 විශ්වවිද්‍යාල/ මණ්ඩපවල සමාජ සංහිඳියා මධ්‍යස්ථාන පිහිටුවීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) ජනාධිපති කාර්යාලය සහ රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාල/ මණ්ඩප (සියලුම විශ්වවිද්‍යාල දාහත සහ මණ්ඩප දෙක) සමඟ එක්ව ඒකාබද්ධ මුලපිරීමක් දියත් කරන ලදී. ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල ප්‍රජාවන් අතර සමාජ ප්‍රතිසන්ධාන ක්‍රියාකාරකම් මගින් ශිෂ්‍ය ජනගහනයෙන් ආසන්න වශයෙන් 1,810,036 ප්‍රමාණයකට පහසුකම් සැලසෙනු ඇත.

මෙම මධ්‍යස්ථාන විශ්වවිද්‍යාල ප්‍රතිපදාන කොමිෂන් සභාවේ විෂය පථය යටතට පත් කෙරෙන අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සමාජ සංහිඳියා මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා වෙනම ස්ථාවර කමිටුවක් පිහිටුවනු ලැබේ. විශ්වවිද්‍යාල/ මණ්ඩපවල සමාජ සංහිඳියා මධ්‍යස්ථාන උපකුලපති/ මණ්ඩපාධිපතිගේ විෂය පථය යටතට පත් කෙරෙන අතර එහි පරිපාලන හා මූල්‍ය කළමනාකරණය, කළමනාකරණ කමිටුවේ ව්‍යුහය යටතේ පවතින අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් කළමනාකරණ කමිටුවක් මගින් පාලනය වේ.

මෙම ක්‍රියාවලියට සමගාමීව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රජය සහ සමාජ කණ්ඩායම් සමඟ සහයෝගයෙන් විශ්වවිද්‍යාල සඳහා පදනම් සහිත පොදු ප්‍රතිපත්ති රාමුවක් ඇතුළත් 10/2021 කොමිෂන් සභා චක්‍රලේඛය නිකුත් කර ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මගපෙන්වීම සහ විෂය පථය යටතේ විශේෂඥයින් සහිත ස්ථාවර කමිටුවක් ස්ථාපිත කර ඇත. කොමිෂන් සභා චක්‍රලේඛය 10/2021 ප්‍රකාරව විශ්වවිද්‍යාල සහ මණ්ඩප දැනටමත් ඔවුන්ගේ සමාජ සංහිඳියා මධ්‍යස්ථාන සඳහා අධ්‍යක්ෂවරුන් පත් කර ඇති අතර ඔවුන් සමාජ සංහිඳියා මධ්‍යස්ථානවල සංවර්ධනය සහ තිරසාරභාවය සඳහා ඔවුන්ගේ උපායමාර්ගික සැලැස්ම අවසන් කිරීමේ අදියරේ සිටී.

6.5.5 2022 දී උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීම (AHEAD) වෙතින් ලබා දෙන ලද විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) සහාය

AHEAD මෙහෙයුම මගින් විශ්වවිද්‍යාල 17 තුළම විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටි ක්‍රමානුකූලව ස්ථාපිත කිරීම සිදු කරන ලද්දේ, UBL

ලකුණු පත්‍රිකාවක් හරහා ඒවායේ සංවර්ධනය ප්‍රවේශමෙන් නිරීක්ෂණය කිරීමෙනි.

විශ්වවිද්‍යාල තුළ බුද්ධිමය දේපළ (IP) ආරක්ෂාව සහ නඩත්තුව සඳහා සහාය ලබා දීමට මධ්‍යම කාර්යාලයක් නොතිබුණි. මෙය දැන් විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා කුටි හරහා සිදු කෙරේ. පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමට පෙර, වාණිජ සහ නොමිලේ පේටන්ට් දත්ත සමුදායන් භාවිතා කරමින් ලෝකයේ ඊට සමාන නව නිපැයුම් තිබේදැයි සොයා බැලීමට පර්යේෂණ සඳහා විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා සහාය දක්වයි.

වාණිජ හවුල්කරුවන්ට නව නිපැයුම්කරුවන් විසින් දියුණු කරන ලද තාක්ෂණයන් සඳහා බලපත්‍ර ලබා ගැනීමට විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා පර්යේෂකයන්ට උපකාර කරයි. 6.5.5 වගුවේ විස්තර කර ඇති පරිදි 2022 දී බලපත්‍ර ගිවිසුම් 34 ක් අත්සන් කර ඇති අතර නිෂ්පාදන 37 ක් මේ වන විට දේශීය වෙළඳපොලේ ඇත.

බලපත්‍ර ගිවිසුම්වල බලපෑම මෙහි දැක්වෙන අංකවලින් පිළිබිඹු නොවිය හැක. එහෙත් එක් බලපත්‍ර ගිවිසුමකට වුවද ඉහළ වටිනාකමක් සහ සමාජයට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

විශ්වවිද්‍යාලය	බලපත්‍ර සහිත ගිවිසුම්	වෙළඳපොලේ ඇති නිෂ්පාදන
රුහුණු විශ්වවිද්‍යාලය	1	9
අග්නිදිග විශ්වවිද්‍යාලය	1	0
කොළඹ විශ්වවිද්‍යාලය	3	4
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	2	3
දෘශ්‍ය හා රංග කලා විශ්වවිද්‍යාලය	1	1
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	0	0
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	1	1
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	5	7
කැලණිය විශ්වවිද්‍යාලය	1	0
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	1	3
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	5	2
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	6	1
මොරටුව විශ්වවිද්‍යාලය	1	3
යාපනය විශ්වවිද්‍යාලය	3	1
වවුනියාව විශ්වවිද්‍යාලය	0	0
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	0	0

විශ්වවිද්‍යාලය	බලපත්‍ර සහිත ගිවිසුම්	වෙළඳපොලේ ඇති නිෂ්පාදන
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	3	2
එකතුව	**34**	**37**


වගුව 6.5.5. 2022 දී අත්සන් කරන ලද බලපත්‍රලාභී ගිවිසුම් සහ වෙළඳපොලේ ඇති නිෂ්පාදන

i. ආහාර නිෂ්පාදන

විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා තාක්ෂණික හුවමාරු ක්‍රියාකාරකම් හේතුවෙන් වෙළඳපොලේ දක්නට ඇති නිෂ්පාදන කිහිපයක් පහත දැක්වේ.



ii. ඉලෙක්ට්‍රොනික හා යන්ත්‍රෝපකරණ



iii. කෘෂිකර්මය





iv. වෛද්‍ය/ ශාකසාර නිෂ්පාදන



රට තුළ පවතින වත්මන් ආර්ථික තත්ත්වය හේතුවෙන් දුරේක්ෂ, බුද්ධි කැමරා, සංචලිත ස්නායු ජාල ප්‍රොසෙසරය, කලින් අකුණු හඳුනාගැනීමේ පද්ධතිය, රේඩියෝ සංඛ්‍යාත රැහැන් රහිත සන්නිවේදන යාන්ත්‍රණය, විමෝචන හඳුනාගැනීමේ පද්ධතිය, අලි ඇතුන් නැවැත්වීමට ඇති සිරස් වැට වැනි ඉහළ මට්ටමේ නව නිපැයුම් සඳහා වාණිජ හවුල්කරුවන් සොයා ගැනීම විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා වලට අපහසු වේ.

6.5.5.1 ප්‍රතිපත්තිමය මුල පිරීම්

1. විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතාවල තිරසාරභාවය සඳහා නව නිෂ්පාදන සංවර්ධනය සහ වාණිජකරණයෙහි නිරත වීමට විශ්වවිද්‍යාල ආචාර්යවරුන් දිරිමත් කිරීම වැදගත් වේ. එබැවින් පර්යේෂණ දීමනාව ගෙවීමේදී පර්යේෂණ වාණිජකරණය කිරීම සලකා බැලීමේ වැදගත්කම AHEAD විසින් අවධාරණය කරන ලදී.

   මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 5/2014 හි ඇතුළත් කර ඇති අතර දැන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. (https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=2387%3Aestab-circular-no-52014iii-payment-of-research-allowance&catid=183%3A 2022& Itemid =47&lang=en).

2. එම චක්‍රලේඛයට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයා විසින් සකස් කරන ලද තාක්ෂණයක් කර්මාන්තයකට බලපත්‍ර ලබා දී එම තාක්ෂණය වාණිජමය වශයෙන් උපයෝජනය කළ හැකි බවට සඳහා සාක්ෂි පවතින්නේ නම් පර්යේෂණ දීමනාව සඳහා අයදුම් කිරීමට එම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයා සුදුසුකම් ලබයි.

3. විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා සමඟ සාකච්ඡා කර වාණිජ හවුල්කරුවෙකු තෝරා ගැනීමේ නිදහස පර්යේෂණ කණ්ඩායම්වලට ලබා දීම තාක්ෂණික හුවමාරු ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට වැදගත් පියවරකි. තව දුරටත් එවැනි වාණිජ හවුල්කරුවෙකු සොයා ගැනීමට නොහැකි වූ විට, එම නිෂ්පාදන/ක්‍රියාවලිය වෙළඳපොල වෙත ගෙනයාමට පර්යේෂණ කණ්ඩායමට ආරම්භක මාර්ගෝපදේශ (start-up guide) උපකාර වනු ඇත. මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා නව කොමිෂන් සභා චක්‍රලේඛයක් (අංක 12/2022) නිකුත් කරන ලදී.

   (https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=2389%3Acommissioncircular-no-122022-selection-of-the-commercial-partners-by research-and-innovation-teams-at-universitiesand-start-up-ahead-&catid=185%3A-circulars-published-in-2022-012022-and-above&Itemid=20&lang=en).



6.5.5.2 අනෙකුත් සංවර්ධන හවුල්කරුවන්ගේ උපකාර


AHEAD ව්‍යාපෘතිය, එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව, වාණිජ නීති සංවර්ධන වැඩසටහන (CLDP) සමඟ අත්වැල් බැඳගත් අතර 2022 දී තාක්ෂණික හුවමාරුව පිළිබඳ වෙබිනාර් මාලාවක් සංවිධානය කළේය. තවද සාකච්ඡාමය ගනුදෙනු සිදු කිරීමේ කුසලතා (negotiation skills) පිළිබඳව පුහුණුවක්, ඒ ආශ්‍රිත අවස්ථා භාවිතා කරමින් සහභාගිවන්නන් 40 දෙනෙකු පුහුණු කිරීම සඳහා නේපාලයේ පුද්ගලික වැඩමුළුවක් (in person workshop) සංවිධානය කරන ලදී. WIPO දූරස්ථ අධ්‍යාපන වැඩසටහන භාවිතා කරමින් සමහර කළමනාකරුවන්ට අඛණ්ඩව මාර්ගගතව අධ්‍යාපනය ලැබීමට ශිෂ්‍යත්ව සංවිධානය කරන ලදී.

7. මූල්‍ය පරිපාලනය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 වැනි වගන්තියට අනුව, උසස් අධ්‍යාපන ආයතනවල එකඟතාව ඇතිව උසස් අධ්‍යාපන ආයතනවල ත්‍රිවාර්ෂික අයවැය සකස් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බලය ඇත. උසස් අධ්‍යාපන ආයතන විසින් ඉදිරිපත් කරන ත්‍රිවාර්ෂික අයවැය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ සහිතව ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කෙරේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 100 වැනි වගන්තියට අනුව, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් ශීර්ෂ අංක 214 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද පරිදි උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කරයි.

7.1 විශ්වවිද්‍යාල පද්ධතියේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ සාරාංශ ක්‍රියා පටිපාටිය



i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 (ii) වගන්තියට අනුව, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් ඔවුන්ගේ අයවැය ඇස්තමේන්තු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශීර්ෂ අංක 214 යටතේ සියලුම විශ්වවිද්‍යාල සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද "අයවැය කැඳවීම" අනුව ඔවුන්ගේ අනුමැතිය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

ii. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන සඳහා වන වාර්ෂික ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදාන නිර්දේශ කරන අතර විසර්ජන පනත් කෙටුම්පතට ඇතුළත් කරනු ඇත. වියදම් දැරීමට බලය පැවරීම සහ වර්ෂය සඳහා රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සහ වාර්ෂික අයවැය සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සම්බන්ධව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් චක්‍රලේඛ උපදෙස් සහිතව අනුමත ප්‍රතිපාදන නිකුත් කරනු ලබයි.

iii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 100 (2) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල සඳහා වෙන් කර ඇති ප්‍රදාන මත පදනම්ව, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන පාලන අධිකාරිය විසින් ඔවුන්ගේ අවශ්‍යතා සඳහා මුදල් යෙදවීම සඳහා වන වියදම් අයවැය තීරණය කරයි.

- අංක 02/2019 මූල්‍ය චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැයට (TEC) යටත්ව අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල සංවර්ධන ව්‍යාපෘති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සමඟ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

- 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වැනි වගන්තියට අනුව, ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. 500,000/- කට වැඩි මුදලක් ලබා

ගැනීමට අධ්‍යාපන අමාත්‍යාවරයා විසින් නිර්දේශ කරන ලද පරිදි මුදල් අමාත්‍යාවරයාගේ එකඟතාව අවශ්‍ය වේ.

- මූල්‍ය රෙගුලාසිවලට අනුව, මූල්‍ය සීමාවන් තීරණය කරනු ලබන්නේ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල පාලන අධිකාරීන් විසිනි.

- FR 135. අවසරය –FR 136; අනුමැතිය -FR 137; සහතික කිරීම -FR 138; අත්සන් කිරීමේ බලතල -FR 139-141 ප්‍රකාරව විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් පවරනු ලබන මූල්‍ය සීමාවන්ට යටත්ව වියදම් දරනු ලැබේ.

- ඊට අමතරව, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් වියදම් කළමනාකරණය සහ ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන මාර්ගෝපදේශ පිළිබඳ නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛය අනුගමනය කළ යුතුය.

iv. විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන ඔවුන්ගේ මාසික මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණය (වියදම් තොරතුරු) සකස් කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කලින් කලට ලබා දෙන මාර්ගෝපදේශ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සමඟ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරයි.

v. විශ්වවිද්‍යාල විසින් ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණය මත පදනම්ව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ නිර්දේශ සහිත නිදහස් කිරීමේ නියෝග (release orders) නිකුත් කිරීම.

vi. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති පරිදි විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වියදම් කළමනාකරණය කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අරමුදල්/මුදල් සෘජුවම විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතන වෙත නිකුත් කරයි.

- විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන විසින් රජයේ ප්‍රදාන ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අරමුදල් වාර්තා ගත කරයි. එමෙන්ම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරයට වියදම් ලෙස නිකුත් කරන ලද අරමුදල් ද වාර්තා ගත කරයි.

vii. විශ්වවිද්‍යාල උපචිත පදනම මත මූල්‍ය වාර්තා තබා ගන්නා අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව මූල්‍ය තොරතුරු සකස් කරයි.

- මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත වාර්ෂික මූල්‍ය තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කෙරේ.

- මූල්‍ය වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත විගණනය කරන ලද මූල්‍ය තොරතුරු සහිත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශීර්ෂ අංක 214 සඳහා වන විසර්ජන ගිණුම්, මූල්‍ය වර්ෂය අවසන් වූ පසු විගණකාධිපති වෙත ඉදිරිපත් කෙරේ.

7.2 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම /භාවිතය

ප්‍රදාන	වර්ෂය 2021			වර්ෂය 2022		
	මුළු වෙන් කිරීම රු.මිලියන	නිකුත් කළ සම්පූර්ණ අරමුදල් රු.මිලියන	නිකුත් කළ /භාවිත කළ අනුපාතය, මුළු ප්‍රතිපාදනයෙන් %ක් ලෙස	මුළු වෙන් කිරීම රු.මිලියන	නිකුත් කළ සම්පූර්ණ අරමුදල් රු.මිලියන	නිකුත් කළ /භාවිත කළ අනුපාතය, මුළු ප්‍රතිපාදන යෙන් %ක් ලෙස
පුනරාවර්තන	53,995	52,490	97%	56,864	54,975	97%
ප්‍රාග්ධන	8,400	6,549	78%	4,700	3,042	65%
මුළු	**62,395**	**59,039**	**95%**	**61,564**	**58,017**	**94%**

වගුව 7.2 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම/භාවිතය

7.2.1 පුනරාවර්තන ප්‍රදානය (RBG)

රු.මිලියන

පුනරාවර්තන වියදම් කාණ්ඩය	වෙන් කිරීම් 2022	2022 දී නිකුත් කරන ලද අරමුදල්
පුද්ගල පඩිනඩි	49,372	48,493
වෙනත් පුනරාවර්තන	5,667	4,657
මහපොළ සහ ශිෂ්‍යාධාර	1,825	1,825
එකතුව	**56,864**	**54,975**


වගුව 7.2.1 පුනරාවර්තන ප්‍රදානය (RBG)

7.2.2 ප්‍රාග්ධන ප්‍රදාන (CBG)

රු.මිලියන

ප්‍රාග්ධන වියදම් කාණ්ඩය	වෙන් කිරීම් 2022	2022 දී නිකුත් කරන ලද අරමුදල්
ඉදිකිරීම් ව්‍යාපෘති	2,127	2,672
ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම	596	
ස්ථාවර වත්කම් අත් කර ගැනීම	799	
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති	205	
පර්යේෂණ හා සංවර්ධන	68	
අයවැය යෝජනා	905	370
එකතුව	**4,700**	**3,042**

වගුව 7.2.2 ප්‍රාග්ධන ප්‍රදාන (CBG)




7.2.3 අයවැය යෝජනා – 2022


රු.මිලියන

ප්‍රාග්ධන වියදම් කාණ්ඩය	වෙන් කිරීම් 2022	2022 දී නිකුත් කරන ලද අරමුදල්
විශ්වවිද්‍යාලවල තාක්ෂණ පීඨ පිහිටුවීම	750	318
නව පාඨමාලා හඳුන්වාදීම සඳහා යටිතල පහසුකම් - වෛද්‍ය පීඨය (පළමු අදියර), ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	50	-
කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාන අධ්‍යයනාංශය විසින් ආරම්භ කරන ලද කටයුතු	35	35
අක්මා රෝග සඳහා උතුරු කොළඹ මධ්‍යස්ථානය පිහිටුවීම, කැලණිය විශ්වවිද්‍යාලය	70	17
එකතුව	**905**	**370**

වගුව 7.2.3 අයවැය යෝජනා – 2022

7.3 යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති - 2022





7.4 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතය - 2018 සිට 2022 දක්වා

රු.මිලියන

	2018	2019	2020	2021	2022
1. රජයේ ප්‍රතිපාදන					
පුනරාවර්තන	36,786	46,076	49,497	53,995	56,864
ප්‍රාග්ධන	19,454	13,980	9,545	8,400	4,700
2. වියදම					
පුනරාවර්තන	35,935	45,544	49,457	52,490	54,975
ප්‍රාග්ධන	14,098	10,820	9,545	6,549	3,042
3. ශිෂ්‍ය මූල්‍ය ආධාර					
මහපොළ	1,305	1,257	1,420	1,138	930
ශිෂ්‍යාධාර	521	707	705	862	895

සටහන *: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අරමුදල් පුනරාවර්තන, ප්‍රාග්ධන සහ ශිෂ්‍ය මූල්‍ය ආධාරවල වියදම් ලෙස සටහන් කර ඇත.*

වගුව 7.4 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතය - 2018 සිට 2022 දක්වා

7.5 මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම සඳහා වාර්ෂිකව මුදල් වෙන් කිරීම

රු.මිලියන

අංකය	විද්‍යාලය / ආයතනය	මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
1	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	109	25	134
2	කොළඹ විශ්වවිද්‍යාලය	126	24	150
3	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	162	27	189
4	කැලණිය විශ්වවිද්‍යාලය	137	39	176
5	මොරටුව විශ්වවිද්‍යාලය	69	16	85
6	රුහුණු විශ්වවිද්‍යාලය	92	80	172
7	යාපනය විශ්වවිද්‍යාලය	71	84	155
8	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	31	68	100
9	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	38	75	113
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	41	52	93
11	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	46	70	116
12	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	48	46	94
13	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	7	14	21
14	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	19	46	65
15	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය	7	1	8
16	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	3	13	16
17	වවුනියාව විශ්වවිද්‍යාලය	7	29	36
18	ත්‍රිකුණාමල මණ්ඩපය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	6	28	34
19	ශ්‍රීපාලී මණ්ඩපය	2	8	11
20	ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය	3	18	22

අංකය	විද්‍යාලය / ආයතනය	මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
21	දේශීය වෛද්‍ය ආයතනය	8	11	19
22	තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	3	29	32
	එකතුව	**1,035**	**803**	**1,838**

වගුව 7.5 මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම සඳහා වාර්ෂිකව මුදල් වෙන් කිරීම

7.6 2022.12.31 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව

අංකය	විද්‍යාලය / ආයතනය	මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
1	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	5,695	716	6,411
2	කොළඹ විශ්වවිද්‍යාලය	5,072	1,330	6,402
3	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	6,961	3,212	10,173
4	කැලණිය විශ්වවිද්‍යාලය	5,385	2,680	8,065
5	මොරටුව විශ්වවිද්‍යාලය	3,082	1,118	4,200
6	රුහුණ විශ්වවිද්‍යාලය	3,829	4,032	7,861
7	යාපනය විශ්වවිද්‍යාලය	4,236	2,847	7,083
8	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	1,676	2,538	4,214
9	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල	1,342	1,985	3,327
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	2,843	2,442	5,285
11	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	1,706	3,018	4,724
12	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	2,021	1,767	3,788
13	සෞන්දර්ය විශ්වවිද්‍යාලය	837	885	1,722
14	ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	688	1,016	1,704
15	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය	281	146	427
16	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	115	424	539
17	වව්නියාව විශ්වවිද්‍යාලය,	296	741	1,037
18	ත්‍රිකුණාමලය මණ්ඩපය, නැගෙනහිර විශ්වවිද්‍යාලය	62	735	797
19	ශ්‍රීපාලි මණ්ඩපය	148	397	545
20	ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය	221	756	977
21	දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	414	435	849
22	තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය	314	622	936
	එකතුව	**47,224**	**33,842**	**81,066**

වගුව 7.6 2022.12.31 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව

සටහන I: 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ මහපොළ ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම තවමත් අවසන් කර නොමැත. මුළු ශිෂ්‍යත්වලාභීන් ගණන 16,000 කි.

***සටහන II*:** කොළඹ, ජ'පුර, කැලණිය,මොරටුව, රුහුණ, සබරගමුව, වයඹ, දේශීය වෛද්‍ය ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයිය පරිගණක විද්‍යායතනය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, ශ්‍රීපාලි මණ්ඩපය තුළින් ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව සඳහා 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිසුන් තෝරාගෙන ඇති අතර අනෙකුත් විශ්වවිද්‍යාල සඳහා තේරීම් තවමත් සිදුවෙමින් පවතී.

7.7 මහපොළ සහ ශිෂ්‍යාධාර සාරාංශය

මහපොළ ශිෂ්‍යත්වය, විශ්වවිද්‍යාලවලින් ඉල්ලා සිටින පරිදි මහපොළ භාරකාර අරමුදල මඟින් සිසුන්ට සෘජුවම ගෙවනු ලැබේ. දැනට ගෙවනු ලබන රු.2550/- ක මහපොළ ශිෂ්‍යත්ව වාරිකය, මහපොළ භාරකාර අරමුදල මගින් ලබා දෙන අතර ශේෂය වන රු. 2450/- ක මුදල මහා භාණ්ඩාගාරයේ දායකත්වයෙන් ලබා දෙනු ලැබේ.

විස්තරය	මහපොළ	ශිෂ්‍යාධාර
ශිෂ්‍යත්ව වාරිකය (.රු)	5,000/-	4,000/-
මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (.රු)	2,550/-	-
භාණ්ඩාගාරය - දායකත්වය (රු.)	2,450/-	4,000/-
වසරකට වාරික ගණන	10	10
මහපොළ* සහ ශිෂ්‍යාධාර ලබන සිසුන් සංඛ්‍යාව	63,224	33,842

** 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ මහපොළ ශිෂ්‍යත්වලාභීන් 16,000 කි.*

වගුව 7.7 මහපොළ සහ ශිෂ්‍යාධාර සාරාංශය

8. විශ්වවිද්‍යාල කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව

2022 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා විවිධ සේවක කාණ්ඩ 5ක් යටතේ අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 325ක් වූ අතර 2022 දෙසැම්බර් 31 වන විට සේවයේ නියුක්ත සංඛ්‍යාව 239 ක් විය. පුරවා නොමැති පුරප්පාඩු ගණන 86 කි. තොරතුරු 8 වගුවේ දක්වා ඇත.

කාර්ය මණ්ඩල කාණ්ඩය		වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින කාර්ය මණ්ඩලය	හිඟ
ප්‍රාථමික මට්ටම	නුපුහුණු	U-PL 1	44	27	17
	අර්ධ පුහුණු	U-PL 2	3	1	2
	පුහුණු	U-PL 3	18	14	4
ද්විතියික මට්ටම	කළමනාකරණ සහකාර	U-MN 1	144	116	28
	කළමනාකරණ සහකාර (IT)	U-MT 1	4	2	2
	සහකාර නිලධාරී කාණ්ඩය 2	U-MN 2	8	2	6
	සහකාර නිලධාරී කාණ්ඩය 1	U-MN 3	6	2	4
	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර	U-MN 4	25	25	0
තෘතීයික මට්ටම	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය කාණ්ඩය 2	U-AS 1	3	1	2
	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය කාණ්ඩය 1	U-AS 2	6	4	2
	කනිෂ්ඨ විධායක	U-EX 1	18	10	8
ජ්‍යෙෂ්ඨ මට්ටම	විධායක (මධ්‍යම මට්ටම)	U-EX 2	33	26	7
	විධායක (ජ්‍යෙෂ්ඨ මට්ටම)	U-EX 3	6	5	1
	ජ්‍යෙෂ්ඨ මට්ටමේ අධ්‍යයන	U-AC 3 සිට U-AC 5	7	4	3
			325	**239**	**86**

වගුව 8 2022 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යා තොරතුරු

8.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයන්ගේ පත්වීම්, උසස්වීම්, සේවය ස්ථිර කිරීම්

2022 වර්ෂය තුළ කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්ගේ නව පත්වීම් හතක් (07) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දී ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයින් දාහතක් (17) සේවයේ ස්ථිර කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් (EB) අවශ්‍යතා සඳහා ඇගයීමෙන් පසු සේවකයින් විසිඅට (28) දෙනෙකු උසස් කරන ලද අතර පත්කිරීම් හයක් (06)ක් සිදු කරන ලදී. තවද, එක් සේවකයෙකු (01) තනතුරෙන් ඉවත් කරන ලදී.

8.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයින්ගේ අභ්‍යන්තර මාරුවීම්, සේවා සම්මාන සහ විශේෂ අරමුණු නිවාඩු

2022 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර මාරුවීම් තුනක් (03) ක් පමණක් වාර්තා විය. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ සේවකයින් නව (09) දෙනෙකු විශ්වවිද්‍යාල පද්ධතියට

කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවා සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඔවුන්ට ඒ වෙනුවෙන් මුදල් ත්‍යාගයන් ලබා දෙන ලදී.

මීට අමතරව, වසර තුළ අංශ ප්‍රධානීන් ලෙස නව අභ්‍යන්තර ස්ථාන මාරුවීම් හතරක් (04) ලබා දී ඇත.

8.3 සේවකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලය හැරයාම්

2022 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වෙනත් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙත ස්ථාන මාරු තුනක් (03) සිදු කරන ලද අතර අනෙකුත් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙතින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු හතරක් (04) සිදු කරන ලදී.

විශ්‍රාම පූර්ව නිවාඩු ගැනීම් හතරක් (04) විශ්‍රාම යෑම් හයක් (06), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවයෙන් පහකිරීම් එකක් (01) සහ ඉල්ලා අස්වීම් හයක් (06) සමාලෝචිත වර්ෂය තුළ වාර්තා කර ඇත.

වර්ෂය තුළ නිවාඩු ලබා දීම් පහත සඳහන් පරිදි සිදු විය.

නිවාඩු වර්ගය	නිවාඩු ගණන
වැටුප් රහිත නිවාඩු	04
මාතෘ නිවාඩු	08
පිතෘ නිවාඩු	01
ඉකුත් නිවාඩු	10
වෛද්‍ය මණ්ඩලයේ නිවාඩු	02
අධ්‍යයන නිවාඩු	01
සප්ත වාර්ෂික නිවාඩු	03
විදේශ ගමන් සඳහා නිවාඩු	04
1989.09.29 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 406 ප්‍රකාරව විදේශයක රැකියාවක් කිරීම සඳහා වැටුප් රහිත නිවාඩු	01
විභාගවලට පෙනී සිටීම සඳහා වැටුප් සහිත නිවාඩු	09

වගුව 8.3 වර්ෂය තුළ වාර්තා කර ඇති නිවාඩු ලබා ගැනීම් ගණන

8.4 සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

2022 වර්ෂයේ දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සියලුම ස්ථිර සේවකයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දී ඇත.

9. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය ලබා දීමේ වගකීමට අනුකූලව මානව සම්පත් අංශය 2022 දී ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. මානව සම්පත් අංශයට පවරා ඇති කාර්යයන් යටතේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

9.1. සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම

9.1.1 වර්ෂය සඳහා නව සේවක සංඛ්‍යාව - කාණ්ඩය අනුව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක තනතුරු 118 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.මෙම තනතුරු 118 හි විස්තර 9.1.1 වගුවේ දක්වා ඇත.

සේවක කාණ්ඩය	අනුමත තනතුරු ගණන
අධ්‍යයන කාර්ය මණ්ඩලය	47
අධ්‍යක්ෂ	-
පීඨාධිපති	02
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය	30
පරිපාලන සහ අනෙකුත් කාර්ය මණ්ඩලය	11
වෛද්‍ය කාර්ය මණ්ඩලය	-
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	05
කළමණාරකරණ සහකාර / තාක්ෂණික නොවන	14
කළමණාරකරණ සහකාර / තාක්ෂණික	09
ප්‍රාථමික (පුහුණු නුපුහුණු / අර්ධ පුහුණු /)	-
එකතුව	**118**

වගුව 9.1.1 විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපනය සඳහා 2022 දී අනුමත කරන ලද නව සේවක සංඛ්‍යාව [කාණ්ඩය අනුව]

9.1 2 උසස් අධ්‍යාපන ආයතනවල අනුමත කළ සේවක සංඛ්‍යා ව්‍යාප්තිය

විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	අනුමත තනතුරු ගණන
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	03
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	16
කැලණිය විශ්වවිද්‍යාලය	15
මොරටුව විශ්වවිද්‍යාලය	06
යාපනය විශ්වවිද්‍යාලය	03
රුහුණු විශ්වවිද්‍යාලය	02
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	18
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	33
වවුනියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	16
දේශීය වෛද්‍ය ආයතනය	01
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	05
එකතුව	**118**

වගුව 9.1.2 උසස් අධ්‍යාපන ආයතනවල අනුමත කළ සේවක සංඛ්‍යා ව්‍යාප්තිය

9.2 පරිපාලනමය ශ්‍රේණි සඳහා පත් කිරීම / උසස් කිරීම

සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) වගන්තියේ (ii) ඡේදය සහ විශ්වවිද්‍යාල පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා පරිපාලන ශ්‍රේණියේ පත්වීම් / උසස්වීම් පිළිබඳ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඒ අනුව 2022 වර්ෂයේදී පහත සඳහන් පත්වීම් සිදු කරන ලදී.

9.2.1 පත්වීම්

(අ) සහකාර ලේකම්/ සහකාර ලේඛකාධිකාරී තනතුර (නීති සහ ප්‍රලේඛන)

අංකය	උසස් අධ්‍යාපන ආයතනය	උසස්වීම් ගණන
1.	යාපනය විශ්වවිද්‍යාලය	01

වගුව 9.2.1 (අ) සහකාර ලේකම්/ සහකාර ලේඛකාධිකාරී තනතුර සඳහා පත්වීම් සංඛ්‍යාව (නීති සහ ප්‍රලේඛන)

9.2.2 උසස්වීම්

(අ) නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුර

අංකය	උසස් අධ්‍යාපන ආයතනය	උසස්වීම් ගණන
1.	කොළඹ විශ්වවිද්‍යාලය	2
2.	කැලණිය විශ්වවිද්‍යාලය	3
3.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	6
4.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	4
5.	කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල	1
6.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	3
7.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	1
8	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	3
9.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	1
10.	යාපනය විශ්වවිද්‍යාලය	2
11.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	2
12.	වවුනියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	1
13.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	1
14.	රුහුණු විශ්වවිද්‍යාලය	1
15.	මානව සම්පත් සංවර්ධන ආයතනය	1

වගුව 9.2.2 (අ) නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුර සඳහා උසස් කිරීම

(ආ) නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර

අංකය	උසස් අධ්‍යාපන ආයතනය	උසස්වීම් ගණන
1.	ජෛව රසායන, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනය (IBMBB)	1
2.	විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS)	1
3.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය (PDN)	2
4.	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය (UCSC)	1
5.	ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය (SVIAS)	1
6.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM)	1
7.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (SJP)	2
8.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC)	2
9.	කැලණිය විශ්වවිද්‍යාලය (KLN)	2
10.	කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM)	1
11.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (WUSL)	1
12.	රුහුණු විශ්වවිද්‍යාලය (RUH)	1
13.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (OUSL)	3
14.	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය (UVPA)	1
15.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය (RUSL)	1
16.	කොළඹ විශ්වවිද්‍යාලය (CMB)	1

වගුව 9.2.2 (ආ) නියෝජ්‍ය ගණකාධිකාරී/ නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර

(ඇ) නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුර (නීති සහ ප්‍රලේඛන)

අංකය	උසස් අධ්‍යාපන ආයතනය	උසස්වීම් ගණන
1.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (OUSL)	01

වගුව 9.2.2 (ඇ) නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති සහ ප්‍රලේඛන) තනතුර සඳහා වූ උසස්වීම් සංඛ්‍යාව

9.3 වෙනත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද පත්වීම් /උසස්වීම්

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) වගන්තියට අනුව 2022 වර්ෂය තුළ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් එකක් (01) සහ උසස්වීම් විස්සක් (20) සිදු කර ඇත. මේ පිළිබඳ තොරතුරු වගු අංක 9.3.1 සහ වගු අංක 9.3.2 හි දක්වා ඇත.

i. පත්වීම්

අංකය	තනතුර	උසස්වීම් ගණන
01	ප්‍රධාන ආරක්ෂක නිලධාරි II ශ්‍රේණිය	01

වගුව 9.3.1 අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් - 2022

ii. උසස්වීම්

අංකය	තනතුර	විශ්වවිද්‍යාලය	උසස්වීම් ගණන
01	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික තාක්ෂණික නිලධාරි	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	06
02	ප්‍රධාන තාක්ෂණික නිලධාරි	පේරාදෙණිය විශ්වවිද්‍යාලය මොරටුව විශ්වවිද්‍යාලය කැලණිය විශ්වවිද්‍යාලය	03 01 02
03	ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ නිලධාරී I ශ්‍රේණිය	කැලණිය විශ්වවිද්‍යාලය	01
04	ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01
05	ප්‍රධාන ආරක්ෂක නිලධාරී I ශ්‍රේණිය	කැලණිය විශ්වවිද්‍යාලය	01
06	ගොවිපල කළමනාකරු I ශ්‍රේණිය	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01
07	පුහුණු ඉංජිනේරු II ශ්‍රේණිය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01
08	ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු II ශ්‍රේණිය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01
09	අධ්‍යක්ෂ/ශාරීරික අධ්‍යාපන - උසස් ශ්‍රේණිය	ශ්‍රී ලංකා උෂව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	01
10	වැඩ ඉංජිනේරු (සිවිල්) II ශ්‍රේණිය	ශ්‍රී ලංකා උෂව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	01
	එකතුව		**20**

වගුව 9.3.2 අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද උසස්වීම් -2022

9.4 කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් පත් කිරීම

1979.11.27 දිනැති අංක 50, 1996.10.18 දිනැති අංක 692, 1998.09.15 දිනැති අංක 742, සහ 2019.10.18 දිනැති අංක 10/2019 යන කොමිෂන් සභා චක්‍රලේඛවල විධිවිධාන සහ ලිපිකාර III ශ්‍රේණියට බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව ඉහත ක්‍රියාකාරකම් පහත පරිදි නිම කරන ලදී.

මාර්ගගත යෙදවුම් පද්ධතිය හරහා අයදුම්පත් කැඳවනු ලැබිය	13.11.2021
ලිඛිත විභාගය පැවැත්වීය	09.04.2022
විභාග ප්‍රතිඵල නිකුත් කරන ලදී	09.09.2022
සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දින	2022 ඔක්තෝබර් 21, 26, 27 සහ 2022 නොවැම්බර් 1
කළමනාකරණ සහකාර ශ්‍රේණිය III තනතුර සඳහා ලබා දෙන ලද පත්වීම් සංඛ්‍යාව	105

මාධ්‍යය	අපේක්ෂකයින් සංඛ්‍යාව				
	විභාගයට සුදුසුකම් ලැබූ ගණන	විභාගයට නොපැමිණි ගණන	ලිඛිත විභාගයට පෙනී සිටි ගණන	විභාගයෙන් සමත් ගණන	විභාගයෙන් අසමත් වූ ගණන
සිංහල	255	54	201	133	68
දෙමළ	51	7	44	28	16
එකතුව	**306**	**61**	**245**	**161**	**84**

වගුව 9.4. කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් පත් කිරීම

9.5 කළමනාකරණ සහකාර, කළමනාකරණ සහකාර (පොත් තැබීම), කළමනාකරණ සහකාර (සරප්) සහ කළමනාකරණ සහකාර (ගබඩා පාලන) යන තනතුරු III ශ්‍රේණියේ සිට II ශ්‍රේණිය දක්වා උසස් කිරීම

බදවා ගැනීමේ පරිපාටි හා 2018.07.16 දිනැති අංක 06/2018 සහ 2018.10.17 දිනැති අංක 12/2018 දරණ කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව ඉහත ක්‍රියාකාරකම් පහත පරිදි නිම කරන ලදී.

මාර්ගගත යෙදවුම් පද්ධතිය හරහා අයදුම්පත් කැඳවනු ලැබිය	-	12.01.2022
ලිඛිත විභාගය පැවැත්වීය	-	04.03.2022
විභාග ප්‍රතිඵල නිකුත් කරන ලදී	-	06.10.2022
විභාගය සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින් සංඛ්‍යාව	-	755
ලිඛිත විභාගයට පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව	-	545
විභාගයෙන් සමත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව	-	446

9.6 අන්තර් විශ්වවිද්‍යාල මාරුවීම් - 2022

විශ්වවිද්‍යාල පනතේ 78 වගන්තිය අනුව, 2022 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද මුළු ස්ථාන මාරු සංඛ්‍යාව පහත පරිදි වේ;

- පරිපාලන කාර්ය මණ්ඩලය - 13
- අනධ්‍යයන පරිපාලන නොවන කාර්ය මණ්ඩලය - 128

9.7 වෘත්තීය සමිති රැස්වීම්

පරිපාලන මාණ්ඩලික සංගමයේ රැස්වීම් දෙකක් (02) සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංගම් රැස්වීම් තුනක් (03) 2022 වර්ෂයේදී පවත්වන ලදී.

9.8 කළමනාකරණ කමිටුව

2022 වර්ෂය තුළ කළමනාකරණ කමිටුවේ රැස්වීම් විසිහතර ක් (24) පැවැත්විණි

9.9 සහනදායී කොන්දේසි මත මෝටර් රථ වාහන බලපත්‍ර සඳහා අයදුම්පත්

2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සහන කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් අයදුම්පත් 171 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී තිබේ.

සංශෝධිත 2016.07.14 දිනැති අංක 01/2016 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයට අනුව මෙම අයදුම්පත් ලැබුණු අතර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම අයදුම්පත් වසර පුරාම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ.

අංකය	විශ්වවිද්‍යාලය / ආයතනය	ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණන
1	කොළඹ විශ්වවිද්‍යාලය සහ අනුබද්ධ ආයතන	14
2	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	23
3	කැලණිය විශ්වවිද්‍යාලය සහ අනුබද්ධ ආයතන	14
4	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	14
5	මොරටුව විශ්වවිද්‍යාලය සහ අනුබද්ධ ආයතන	9
6	යාපනය විශ්වවිද්‍යාලය සහ අනුබද්ධ ආයතන	4
7	රුහුණු විශ්වවිද්‍යාලය	7
8	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	13
9	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව සහ අනුබද්ධ ආයතන	2
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	21
11	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	11
12	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	4
13	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	11
14	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	6
15	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	14
16	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	1
17	වවුනියාව විශ්වවිද්‍යාලය	0
18	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	3
	එකතුව	**171**

වගුව 9.9 මෝටර් රථ බලපත්‍ර සඳහා ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව

9.10 අධ්‍යයන තනතුරුවලට අදාළ තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන්

(අ) සහාය මහාචාර්ය / මහාචාර්ය තනතුර සඳහා කුසලතා අනුව සිදු කරන උසස් කිරීම්

අංකය	විශ්වවිද්‍යාලය / ආයතනය / මණ්ඩපය	තේරීම් කමිටු ගණන
1.	කොළඹ විශ්වවිද්‍යාලය	29
2.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	15
3.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	20
4.	කැලණිය විශ්වවිද්‍යාලය	23

අංකය	විශ්වවිද්‍යාලය / ආයතනය / මණ්ඩපය	තේරීම් කමිටු ගණන
5.	මොරටුව විශ්වවිද්‍යාලය	13
6.	යාපනය විශ්වවිද්‍යාලය	12
7.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	5
8.	රුහුණු විශ්වවිද්‍යාලය	16
9.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	14
10.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	10
11.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	6
12.	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	9
13.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	9
14.	ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	4
15.	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	5
16.	වවුනියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	1
17.	ශ්‍රීපාලී මණ්ඩපය	3
18.	දේශීය වෛද්‍ය ආයතනය	4
19.	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය	1
20.	ජෛව රසායන විද්‍යාව අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනය	2
21.	තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	2
22.	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	1
	එකතුව	**204**

වගුව 9.10 (අ) **සහාය මහාචාර්ය / මහාචාර්ය තනතුරට කුසලතා අනුව සිදු කරන උසස් කිරීම් පිළිබඳ තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව**

(ආ) දැන්වීම් මඟින් පුරප්පාඩු කැඳවන ලද මහාචාර්ය තනතුර (ප්‍රධානී)

අංකය	විශ්වවිද්‍යාලය	තේරීම් කමිටු ගණන
1.	කොළඹ විශ්වවිද්‍යාලය	3
2.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	1
3.	කැලණිය විශ්වවිද්‍යාලය	2
4.	යාපනය විශ්වවිද්‍යාලය	4
5.	රුහුණු විශ්වවිද්‍යාලය	2
6.	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	1
7.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	1
8.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	1
9.	වවුනියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	1
	එකතුව	**16**

වගුව 9.10 (ආ) **දැන්වීම් මඟින් පුරප්පාඩු කැඳවන ලද මහාචාර්ය (ප්‍රධානී) තනතුර සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව**

(ඇ) නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරට කුසලතා අනුව සිදු කරන උසස් කිරීම්

අංකය	විශ්වවිද්‍යාලය/මණ්ඩපය	තේරීම් කමිටු සංඛ්‍යාව
1.	යාපනය විශ්වවිද්‍යාලය	1
2.	ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	1
3.	රුහුණු විශ්වවිද්‍යාලය	2
4.	ශ්‍රීපාලී මණ්ඩපය	1
	එකතුව	**5**

වගුව 9.10 (ඇ) **නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරට කුසලතා අනුව සිදු කරන උසස් කිරීම් සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව**

(ඈ) දැන්වීම් මඟින් පුරප්පාඩු කැඳවන ලද පුස්තකාලයාධිපති තනතුර

අංකය	විශ්වවිද්‍යාලය	තේරීම් කමිටු සංඛ්‍යාව
1.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	1
2.	රුහුණු විශ්වවිද්‍යාලය	1
	එකතුව	2

වගුව 9.10(ඈ) **දැන්වීම් මඟින් පුරප්පාඩු කැඳවන ලද පුස්තකාලයාධිපති තනතුර සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව**

(ඉ) කථිකාචාර්ය (පරිවාස) / කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම / උසස් කිරීම

අංකය	ආයතන	තේරීම් කමිටු සංඛ්‍යාව
1.	ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය	12
2.	දේශීය වෛද්‍ය ආයතනය	6
3.	තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	7
4.	මානව සම්පත් අභිවර්ධන ආයතනය	1
5.	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය	1
6.	ජාතික පුස්තකාල සහ තොරතුරු විඥාපන ආයතනය	1
	එකතුව	**28**

වගුව 9.10(ඉ) **කථිකාචාර්ය (පරිවාස) / කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම / උසස් කිරීම සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයන් සංඛ්‍යාව**

9.11 අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු පත්වීම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම

(අ) කථිකාචාර්ය තනතුර (පරිවාස)

අංකය	විශ්වවිද්‍යාලය/ආයතනය	අනුමත පත්වීම් ගණන	අනුමත නොවූ පත්වීම් ගණන
1.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01	01
2.	කැලණිය විශ්වවිද්‍යාලය	02	-
3.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	01	-
4.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	-	01
5.	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය	-	01
	එකතුව	**04**	**03**

වගුව 9.11 (අ) කථිකාචාර්ය (පරිවාස) තනතුරේ පත්වීම් සඳහා අනුමැතිය ලබා ගැනීම් සංඛ්‍යාව

(ආ) කථිකාචාර්ය තනතුර (ස්ථිර නොකළ)

අංකය	විශ්වවිද්‍යාලය	අනුමත පත්වීම් ගණන
1.	යාපනය විශ්වවිද්‍යාලය	01
2.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	01
	එකතුව	**02**

වගුව 9.11 (ආ) කථිකාචාර්ය තනතුරේ පත්වීම් සඳහා අනුමැතිය අපේක්ෂා කරන සංඛ්‍යාව (ස්ථිර නොකළ)

(ඇ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණියේ තනතුර

අංකය	විශ්වවිද්‍යාලය	අනුමත පත්වීම් ගණන	අනුමත නොවූ පත්වීම් ගණන
1.	මොරටුව විශ්වවිද්‍යාලය	01	03
2.	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	01	-
3.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01	-
	එකතුව	**03**	**03**

වගුව 9.11(ඇ) කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරේ පත්වීම් සඳහා අනුමැතිය අපේක්ෂා සංඛ්‍යාව

10. යටිතල පහසුකම් සංවර්ධනය

2022 වසරේ දී, නව ඉදිකිරීම් හා අඛණ්ඩව සිදු කෙරෙන ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත් කර ගැනීම්, මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සහ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 4,700 ක මුදලක් වෙන් කරන ලදී. 2022 වසර අවසන් වන විට රු. මිලියන 3,042 ක මුළු මුදලක් භාණ්ඩාගාරය විසින් නිර්දේශ කර නිකුත් කරන ලදී.

වර්ෂය තුළදී, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 10 ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එහි සෝදිසි කිරීම් හා ඇගයීම්

ක්‍රියාවලියෙන් පසුව, 2022 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්දේ ව්‍යාපෘති යෝජනා* 8 ක් පමණි. රේඛීය අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේ දී ව්‍යාපෘති යෝජනා 8 ම අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාධන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදි. 2022 වර්ෂයේදී කිසිදු ව්‍යාපෘතියක භෞතික වැඩ ආරම්භ නොවුණු අතර වර්ෂය අවසන් වන විට, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වටිනාකම රු.මිලියන 28,748 ක් වන වැඩ ආරම්භ කර සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 56 ක් පවතින අතර සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 99.1 ක් වන ව්‍යාපෘති 1 ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දී ඇත. විස්තර පහත දැක්වේ.

	2019		2020		2021		2022	
	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)
වි.ප්‍ර.කොා. වෙත ලැබුණු ව්‍යාපෘති යෝජනා ගණන	39	18,906.75	34	8,857.79	33	16,598.11	10	14,733.95
වි.ප්‍ර.කොා. මගින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	19	6,331.26	16	7,630.97	17	7,003.71	8	2,200.65
ජාතික ක්‍රමසම්පාදන දෙ.වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	14	6,382.96	16	7,630.97	22	14,288.69	8	2,200.65
ජාතික ක්‍රමසම්පාදන දෙ .විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	11	2,845.80	1	182.45	1	132.00	-	-
අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	21	14,544.20	-	-	-	-	-	-
වර්ෂය තුළ දී ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන	16	3,581.70	9	6,794.90	12	1,739.70	-	-
දැනට සිදුකරගෙන යන ව්‍යාපෘති ගණන (සිදු කෙරෙමින් පවතින)	179	28,323.00	91	30,865.00	80	62,202.00	56	28,748.00
අවසන් කර ඇති ව්‍යාපෘති ගණන	17	5,723.00	21	6,521.00	5	1,131.00	1	99.10

වගුව 10.1 නිම කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දුන් ව්‍යාපෘති

11. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු (QAC)

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට 2022 වසර කාර්යබහුල වර්ෂයක් වූ අතර, වාර්ෂික ක්‍රියාමාර්ගවලින් සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක සහ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් පසුගිය වසර දෙක තුළ එකතු වූ කාර්යයන් ද සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි.

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් පදනම මත), සහකාර ලේකම්, කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකු, එක් වැඩ සහයකයෙකු සහ තාක්ෂණික සහකාරවරුන් දෙදෙනෙකු (කොන්ත්‍රාත් පදනම මත) ඇතුළත් විය. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ ක්‍රියාකාරී සැලැස්ම - 2022 ක්‍රියාත්මක කිරීමේදී තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපති සහ සාමාජිකයින් තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට මඟ පෙන්වූහ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්මේ ඉලක්ක අංක 3: ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නවෝත්පාදන හරහා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.

අරමුණ අංක 08 - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතන සහ ඔවුන් විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් ගෝලීයව සහ දේශීයව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වන බව තහවුරු කිරීම පිණිස අඛණ්ඩ පරීක්ෂණය, අධීක්ෂණය සහ සංවර්ධනය කිරීම.

11.1. විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම

රාජ්‍ය විශ්වවිද්‍යාල 17 හි සියලුම අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකවලින් කාර්තුමය ප්‍රගති වාර්තා නිතිපතා ලැබිණි. 2022 තුන්වන කාර්තුව වන විට, 14/15 CQAs, AHEAD වැඩසටහන් ඉලක්කය සපුරා ගනිමින්, කාර්ය සාධන ලකුණු කාඩ්පතේ ලකුණු වලින් අවම වශයෙන් 85%ක් ලබා ගෙන ඇත. 2022 අවසානය වන විට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂ විසින් විශ්වවිද්‍යාල හතරක්, එනම් වවුනියාව විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය වෙත ගොස් නිරීක්ෂණය කළ අතර සමාලෝචනවල ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාල-තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය අතර ඒකාබද්ධ රැස්වීම් පවත්වන ලදී.

තත්ත්ව ආරක්ෂණය සඳහා වූ මධ්‍යස්ථාන 17 හි වාර්ෂික ප්‍රගති සමාලෝචනය 2022 නොවැම්බර් 29 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රධාන සභාශාලාවේ දී පැවැත්විණි. විශ්වවිද්‍යාලවල ප්‍රගතිය සහ තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම්වල අභියෝග, බාහිර සහ අභ්‍යන්තර සමාලෝචනවල හොඳම භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරමින් රැස්වීමේදී සාකච්ඡා පවත්වන ලදී.

11.2. පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශ සංවර්ධනය කිරීම

මෑත වර්ෂවලදී, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් විෂය ඉම්ලකුණු ප්‍රකාශ සංවර්ධන ක්‍රියාවලිය සහ නව විෂය ඉම්ලකුණු ප්‍රකාශ නිර්මාණය කිරීමේ යාන්ත්‍රණය සහ 2015 ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සමඟ පෙළගැස්වීම

සඳහා පවතින විෂය ඉම්ලකුණු ප්‍රකාශ සංශෝධනය කිරීමේ යාන්ත්‍රණය පිළිබඳව දැනුවත් කිරීමට වැඩි උත්සාහයක් ගෙන ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 දී විෂය ඉම්ලකුණු ප්‍රකාශ සංවර්ධන ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රගතියක් ඇති විය. 2022 අවසානය වන විට, සංශෝධනය කිරීමට නියමිත විෂය ඉම්ලකුණු ප්‍රකාශ 37 න්, හයක් සංශෝධනය කර තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ වෙබ් අඩවියේ පළ කරන ලද අතර සංශෝධිත විෂය ඉම්ලකුණු ප්‍රකාශවල පළමු කෙටුම්පත සංවර්ධනය කිරීමට මණ්ඩල දෙකකට හැකි වූ අතර දැනට පවතින විෂය ඉම්ලකුණු ප්‍රකාශ සංශෝධනය කිරීම සඳහා මණ්ඩල 12 කට පවරන ලදී. එම කටයුතු සාර්ථකව සිදු වෙමින් පවතී. මීට අමතරව, නව විෂය ඉම්ලකුණු ප්‍රකාශ 22 ක් හඳුනාගෙන ඇති අතර, එයින් විෂය ඉම්ලකුණු ප්‍රකාශ කෙටුම්පත් දෙකක් සම්පූර්ණ කරන ලදී.

11.3. ආයතනික සමාලෝචන පැවැත්වීම (IRs)

කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව කැලණිය විශ්වවිද්‍යාලයේ සහ රුහුණු විශ්වවිද්‍යාලයේ කල් දැමූ ආයතනික සමාලෝචන සම්පූර්ණ කර අවසන් 2022 සමාලෝචන වාර්තා තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ වෙබ් අඩවියට උඩුගත කරන ලදී. මාර්ගගත තාක්ෂණය භාවිතා කරමින් දින දෙකක ක්ෂේත්‍ර සංචාරයක් තුළින් මෙම සමාලෝචන සිදු කරන ලදී. ආයතන සමාලෝචනවල දෙවන චක්‍රය සඳහා සැලසුම් කර ඇති කාලසටහනට අනුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සමාලෝචන 2021 සඳහා සැලසුම් කරන ලදී. කෙසේ වෙතත්, ක්‍රියාවලියේ නොවැළැක්විය හැකි ප්‍රමාදයන් සහ සංශෝධිත ආයතන සමාලෝචන අත්පොතේ අවශ්‍යතාවය හේතුවෙන්, විශ්වවිද්‍යාල තුනේ සමාලෝචන 2023 දක්වා කල් තබන ලද අතර, සමාලෝචන ආරම්භ කිරීම සඳහා සූදානම් කිරීමේ කටයුතු 2022 සිව්වන කාර්තුවේදී ආරම්භ විය. (2022 දක්වා මුළු ප්‍රගතිය - 12/15 විශ්වවිද්‍යාල සමාලෝචනය කරන ලදී).

ආයතන සමාලෝචන අත්පොත සංශෝධනය කිරීම 2022 අවසානය වන විට අවසන් කරන ලද අතර, සැලසුම් කර ඇති පරිදි, අත්පොත 2023 පළමු කාර්තුවේදී මුද්‍රණය කර නිල වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. ආයතනික සමාලෝචන සඳහා වන තුන්වන සමාලෝචන චක්‍රය ද (2024 - 2028) සංශෝධිත අත්පොත ක්‍රියාත්මක කිරීමත් සමඟ ආරම්භ වේ.

2022 අවසානය වන විට, විශ්වවිද්‍යාල හතරෙන් තුනක් 2019 දී පවත්වන ලද සමාලෝචන සඳහා ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කර ඇත. තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශය පරිදි, ක්‍රියාකාරී සැලසුම්වල කාර්තුමය ප්‍රගතිය නිරීක්ෂණය කිරීම තත්ත්ව ආරක්ෂණ පරිපාලන කමිටුවේ කළමනාකරණ කමිටුවේ ස්ථීර න්‍යාය පත්‍ර අයිතමයක් බවට පත් කිරීමටත්, වාර්ෂික ප්‍රගතිය තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව වෙත වාර්තා කිරීමටත් උපදෙස් දෙන ලදී.

11.4. වැඩසටහන් සමාලෝචන පැවැත්වීම (PRs)

2020 සමාලෝචන යටතේ, විද්‍යා, ඉංජිනේරු, වාස්තු විද්‍යා සහ භූ විඥාපන පීඨවල වැඩසටහන් සමාලෝචන 59ක් තවමත් අවසන් කර නොමැත. කොවිඩ් 19 හේතුවෙන්, 2020 වසරට අදාළ සමාලෝචන, කොමිෂන් සභාව අනුමැතිය ඇතිව 2021 වර්ෂය දක්වා කල් දමන ලදී. නැවතත්, ඉදිරිපත් කරන ලද ස්වයං ඇගයීම්

වාර්තාවල යම් යම් ගැටළු හේතුවෙන්, සමාලෝචනවල සංයුතිය වෙනස් කරන ලද අතර, සමාලෝචන සංඛ්‍යාව 74 දක්වා වැඩි කරන ලදී.

සමාලෝචන අදියර දෙකකින් සිදු කිරීමට නියමිතව තිබුණි: අදියර 1 සඳහා සමාලෝචන 37 ක් සහ අදියර 2 සඳහා 37ක් වශයෙනි. සමාලෝචන මාර්ගගත සමාලෝචන ක්‍රමය භාවිතයෙන් සිදු කරන ලද අතර එක් දින පීඨ සංචාරයක් ද ඊට ඇතුළත් විය. අදියර 1 හි සමාලෝචන 37 න්, පීඨ සංචාර දක්වා සමාලෝචන 36 ක් සම්පූර්ණ කරන ලදී. ඒ අතරින් සමහර විශ්වවිද්‍යාල සමාලෝචන වාර්තා ඉදිරිපත් කර අවසන් කර ඇත. අදියර 2 හි සමාලෝචන 2023 වර්ෂයේ පළමු කාර්තුවේදී සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. මීට අමතරව, 2022 සිව්වන කාර්තුවේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාලෝචන 7න් 3 ක් ආරම්භ කරන ලදී.ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ ඉගෙනුම් මාදිලියේ වැඩසටහන් සඳහා වෙනම අත්පොතක් භාවිතා කරන බැවින්, වෙනම මාර්ගගත සමාලෝචන පද්ධතියක් භාවිතා කරන ලදී. සම්පූර්ණ කරන ලද සමාලෝචන සඳහා ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය කිරීමේදී, ආයතන සමාලෝචන සඳහා සංවර්ධනය කරන ලද එම අධීක්ෂණ ක්‍රියාවලියම විශ්වවිද්‍යාල සමඟ බෙදා ගන්නා ලදී.

වැඩසටහන් සමාලෝචනයේ දෙවන චක්‍රයේ කොටසක් ලෙස, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය 2022 දී පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය කිරීමට සැලසුම් කළේය. කෙසේ වෙතත්, අභ්‍යන්තර සහ බාහිර වැඩසටහන් සමාලෝචන සහ ආයතන සමාලෝචන විශාල සංඛ්‍යාවක් ලබා දීම නිසා, පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචන තෙවන සමාලෝචන චක්‍රයට ඇතුළත් විය. ඒ අනුව, පශ්චාත් උපාධිවල වැඩසටහන් සමාලෝචන සඳහා මාර්ගෝපදේශයක් සකස් කර, තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් අනුමත කර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, 2023 සිට 2027 දක්වා සකස් කරන ලද පශ්චාත් උපාධි කාලසටහන මත පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා දත්ත රැස් කිරීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.

කාලසටහනට අනුව, 2022 දී බාහිර උපාධි වැඩසටහන් සමාලෝචන 20 ක් ආරම්භ කරන ලදී. බාහිර වැඩසටහන් සමාලෝචන සඳහා වන අත්පොත අභ්‍යන්තර වැඩසටහන් සමාලෝචන සඳහා යොදා ගන්නා අත්පොතට වඩා වෙනස් බැවින් බාහිර වැඩසටහන් සමාලෝචන සඳහා වෙනම මාර්ගගත සමාලෝචන ක්‍රමවේදයක් සංවර්ධනය කරන ලදී. බාහිර උපාධි වැඩසටහන් සමාලෝචන 20 න් 12 ක්ම 2022 අවසානය වන විට අවසන් කර ඇත. අභ්‍යන්තර සහ බාහිර වැඩසටහන් සමාලෝචන සිදු කරන සමාලෝචකයින් සඳහා 2022 දී වැඩමුළු සහ දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

11.5 ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය 2015 ට අනුකූලව සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම

විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන සුදුසුකම් සිතියම්ගත කිරීම සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සහතික කිරීමේ මණ්ඩලයක් පිහිටුවන ලදී. ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සහතික කිරීමේ මණ්ඩලයේ නිර්දේශය මත, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සහතික කිරීමේ අත්පොතක් සකස් කිරීමට තීරණය කරන ලද අතර, AHEAD ව්‍යාපෘතියේ මූල්‍ය අනුග්‍රහය ඇතිව මෙම කර්තව්‍යය සිදු කිරීමට කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, මෙම

කාර්යය සඳහා වන මූල්‍ය ආධාර සඳහා අනුමැතිය AHEAD ව්‍යාපෘතියෙන් ලබා ගන්නා ලදී.

11.6. පොදු අධ්‍යයන දින දර්ශනයක් සඳහා ක්‍රියා කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම

පොදු අධ්‍යයන දින දර්ශනයක් සංවර්ධනය කිරීම 2020 දී ආරම්භ කරන ලද අතර පසුගිය වසර දෙක තුළ අධ්‍යයන දින දර්ශනවල ඇති වූ දැඩි වෙනස්කම් හේතුවෙන් ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීම දුෂ්කර වී ඇත. එබැවින් අවම වශයෙන් පීඨ තුළ හෝ පොදු අධ්‍යයන දින දර්ශනයක් සකස් කිරීමට විශ්වවිද්‍යාලවලට වැඩි කාලයක් ලබා දීමටත්, විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා සඳහා පොදු කාලසටහනකට අනුගත වන වේගය අනුව ඉදිරියේදී සුදුසු දින දර්ශනයක් හඳුන්වා දීමටත් තීරණය විය.

11.7. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ සුදුසුකම් සඳහා වූ ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ සුදුසුකම් සඳහා වූ ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ සංකල්ප පත්‍රිකාවේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් විසින් ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳ දළ සටහනක් දක්වා ඇත. කොමිෂන් සභාව, 2021 මාර්තු 25 වැනි දින පැවති සිය 1051 වැනි සභාවාරයේදී එමඟින් රටට ඇති වැදගත්කම සහ හදිසි අවශ්‍යතාවය හඳුනා ගනිමින් මෙම සංකල්පය අනුමත කරන ලදී. ජාතික මට්ටමින් මධ්‍යස්ථානයක් පිහිටුවන තුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ මධ්‍යස්ථානයක් පිහිටුවීමේ හැකියාව තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් සලකා බලන ලදී. ව්‍යාපෘතියේ ස්වභාවය සහ වැදගත්කම සලකා බැලීමේදී එයට අධ්‍යාපන අමාත්‍යාංශයේ සහාය ද අවශ්‍ය වේ. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය අවශ්‍ය වන විශාල සංකල්පයකි. යුරෝපීය සංගමය අරමුදල් සපයන Reco Asia ව්‍යාපෘතියේ කොටසක් ලෙස යුරෝපා සංගමයෙන් අත්දැකීම් එක්රැස් කිරීම සඳහා මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ ජාත්‍යන්තර සංසදයක් 2023 දී පැවැත්වෙන බව වාර්තා විය. ඒ අනුව, යෝජිත මධ්‍යස්ථානය පිහිටු වීම සඳහා තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය ඉදිරියේ දී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව මහ පෙන්වීම ලබා දෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටියේය.

2022 වර්ෂය තුළ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් අනෙකුත් අංශවලට අදාලව සිදු කර ඇති වැඩ කටයුතුවලට පහත සඳහන් දෑ අයත් වේ:

- නව උපාධි හා පශ්චාද් උපාධි වැඩසටහන්, අධ්‍යයනාංශ සහ පීඨ අනුමත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීම;
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකම් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන උපාධිවල SLQF මට්ටම සහ මහජනතාව සිදු කරන වෙනත් විමසීම්වලට අදාළව පැහැදිලි කිරීම් සැපයීම,
- විශ්වවිද්‍යාලවල තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම්වල ශිෂ්‍ය සහභාගිත්වය;

මේ සඳහා වන වෙබ් අඩවියක් මඟින් පුහුණු වැඩමුළු, බාහිර සමාලෝචන පිළිබඳ වාර්තා, කොමිෂන් සභා චක්‍රලේඛ සහ තත්ත්ව ආරක්ෂණය සම්බන්ධ ප්‍රකාශන සහ අනෙකුත් අදාළ ප්‍රවෘත්ති සහ සිදුවීම් පිළිබඳ වාර්තා සමඟින් නිතිපතා යාවත්කාලීන වේ.

12. තොරතුරු තාක්ෂණ සහාය

පැවරී ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතින් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවල සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යත / පිරිවිතරයන් සකස් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය, පරිගණක, සන්නිවේදන පද්ධති හා ජාලයේ සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ 2022 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

- නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම සහ පවතින පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා සහ පිරිවිතරයන් සැකසීම, මෘදුකාංග ඇතුළු පරිගණක පද්ධතියේ සහ ජාලයේ සමස්ත පරිපාලනය, සන්නිවේදන පද්ධති, දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සහ ආයතනයේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සැපයීම සඳහා සෞඛ්‍ය සම්පන්න අඛණ්ඩ පරිගණක පද්ධතියක් කළමනාකරණය කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වන ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා ටෙලිකොම්, LK Domain Registry සමඟ සම්බන්ධීකරණය කිරීම

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නවතම තොරතුරු තාක්ෂණයන් හඳුන්වා දීම.

- වෙබ් අඩවි පරිපාලනය සහ නඩත්තු කිරීම;

  - නිල වෙබ් අඩවිය : https://www.ugc.ac.lk/
  - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් ද්වාරය: https://www.eugc.ac.lk/

    ඉ.වෙන්කරවා ගැනීම් - රැස්වීම් ශාලා වෙන් කිරීම් කළමනාකරණය කිරීම

    ඉ.ලේඛන - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රයෝජනවත් අභ්‍යන්තර ලේඛන එකතු කිරීම

    ඉ.අධ්‍යයන - අධ්‍යයන කටයුතු සම්බන්ධ තොරතුරු

    eHRMS - සේවක පැමිණීම / රක්ෂණ, සේවක පරිපාලනය සම්බන්ධ තොරතුරු

    ඉ.ගබඩාව - ගබඩාවලින් අයිතම ඉල්ලීමට අදාළ ද්‍රව්‍ය ඉල්ලීම් යෙදවුම

- සාර්ථක ප්‍රතිඵල ලබා දීම සඳහා පහත ක්ෂේත්‍ර යටතේ ආවරණය කිරීමට, යෙදවුම් සංවර්ධන කණ්ඩායම සහ සේවා සපයන්නන් සම්බන්ධීකරණය කිරීම.

- 2021/2022 අධ්‍යයන වර්ෂයට අදාළ අවම කඩඉම් ලකුණු වෙබ් අඩවිය ඔස්සේ නිකුත් කිරීම.
- කෙටි පණිවුඩ සහ රජයේ තොරතුරු මධ්‍යස්ථානය (1919 ඇමතුම් මධ්‍යස්ථානය) විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ ක්‍රියාකාරකම්.
- කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික ශ්‍රේණි තනතරුවල උසස්වීම්වලට අදාළ මාර්ගගත අයදුම්පත් සඳහා රජයේ කෙටි පණිවුඩ (GovSMS) සේවාව.
- විශ්වවිද්‍යාල සඳහා මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචිය - 2021/2022 අධ්‍යයන වර්ෂය
- මාර්ගගත අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය - 2021/2022 අධ්‍යයන වර්ෂය

- ICTA සමඟ එක්ව මාර්ගගත ගෙවීම් ද්වාරයේ ක්‍රියාවලිය පරිපාලනය සහ සම්බන්ධීකරණය:
  - විදේශීය විශ්වවිද්‍යාල සහ දේශීය රාජ්‍ය නොවන ආයතන සඳහා පිළිගැනීමේ සහතික නිකුත් කිරීම
- වෙබ් ද්වාරය, රැස්වීම් ශාලා වෙන් කිරීමේ පද්ධතිය, පිරිස් අංශය සඳහා සේවකයින්ගේ පැමිණීම සලකුණු කිරීම සඳහා වන eHRM පද්ධතිය, සේවක උසස් වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ පද්ධතිය, ඉ-තොග සහ මාර්ගගතව වාහන වෙන්කරවා ගැනීමේ අයදුම්පත වැනි ව්‍යාපාරික යෙදවුම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
- ශ්‍රී ලංකාවේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යාපනයේ ශත සංවත්සර සැමරුම් වෙබ් අඩවිය (1921-2021) එහි පෙර පැවති අන්තර්ගතය සමඟ නැවත සකස් කර එය පවතින සර්වරයේ අවකාශය (https://eugc.ac.lk/hss/) තුළම ස්ථානගත කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ නව සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

ඉහත විෂය පථයට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන් නිසි ක්‍රියාකාරිත්වයෙන් යුතු තොරතුරු තාක්ෂණ පරිසරයක් කළමනාකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විවිධ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කරන අතර මෙම වාර්තාවේ දැක්වෙන්නේ 2022 වර්ෂයේ සිදු කරන ලද විශේෂිත ක්‍රියාකාරකම්වල සාරාංශයක් පමණි.

12.1 මෘදුකාංග සංවර්ධන

i. කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියේ උසස්වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීම සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය

මෙම ක්‍රමය මඟින් සේවකයින් සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් සලසයි. ඉදිරිපත් කරන ලද අයදුම්පත් උසස්වීම් අවසන් වන තෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවේ මානව සම්පත් අංශය විසින් අන්තර්ජාලය හරහා හසුරුවනු ලැබේ.

ii. කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරට ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් පත්කිරීම සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය

කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් පත්කිරීම සඳහා වන අයදුම්පත් අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමට මෙම ක්‍රමය පහසුකම් සපයයි. විභාග පැවැත්වීම, ප්‍රශ්න පත්‍ර ලකුණු කිරීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ පත්වීම් ලබා දීමේ ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවේ මානව සම්පත් අංශය විසින් හසුරුවනු ලැබේ.

iii. **ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් /ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී /ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරු සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීම සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය**

මෙම ක්‍රමය මඟින් අයදුම්පත් මාර්ගගතව ඉදිරිපත් කිරීමට පහසුකම් සපයන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවේ මානව සම්පත් අංශය විසින් සම්මුඛ පරීක්ෂණ කාලසටහන්ගත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත හසුරුවනු ලබයි.

iv. ප්‍රේරණ පුහුණු වැඩසටහන සහ වැඩසටහන් හැසිරවීමේ පද්ධතිය

විශ්වවිද්‍යාල පරිපාලන හා මූල්‍ය නිලධාරීන්ගේ තොරතුරු රැස් කිරීම සහ ප්‍රේරණ පුහුණු වැඩසටහන හැසිරවීම සඳහා මාර්ගගත පෝරමය සකස් කිරීම.

v. ගබඩා කළමනාකරණ පද්ධතිය

ගබඩා කළමනාකරණ පද්ධතිය මඟින් ගබඩාවල ඇති සියලුම අයිතම පිළිබඳ තොරතුරු දත්ත ගබඩාවකට එක්රැස් කරන අතර සියලුම අංශවලට ඔවුන්ගේ ද්‍රව්‍ය ඉල්ලීම් පෝරමය පහසුවෙන් ඉදිරිපත් කිරීමට සබැඳි යෙදවුමක් හරහා මෙම දත්ත ගබඩාවට ප්‍රවේශ විය හැකිය.

vi. නීති සහ ප්‍රලේඛන අංශය සඳහා ගොනු බෙදා හැරීමේ පද්ධතිය

මෙම අංශයට ලැබෙන ලිපි හැසිරවීමට සහ අංශයේ වඩාත් ආරක්ෂිත සහ සුමට ක්‍රියාකාරිත්වය සඳහා ලිපිවල ස්කෑන් පිටපත් තබා ගැනීමට මෙම යෙදවුම භාවිතා වේ.

vii. වාහන වෙන්කරවා ගැනීමේ මාර්ගගත අයදුම්පත

මෙම යෙදවුම දෙපාර්තමේන්තු/අංශවලින් වාහන වෙන්කරවා ගැනීම සඳහා සිදු කරන මාර්ගගත ඉල්ලීම් හැසිරවීම සඳහා සංවර්ධනය කර ඇති අතර අදාළ පාර්ශ්වයෙන් විසින් ඒ සඳහා අන්තර්ජාලය හරහා අනුමැතිය ලබා දේ. මෙම යෙදවුම දැනට පරීක්ෂණ මට්ටම යටතේ පවතී.

viii. **විශ්වවිද්‍යාලය සඳහා මාර්ගගතව ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමේ අයදුම්පත**

මෙම යෙදවුම සංවර්ධනය කිරීමේ අරමුණ වන්නේ අනෙකුත් විශ්වවිද්‍යාලවල සේවක මාරුවීම් ක්‍රියාවලිය පරිගණක ගත වැඩසටහනක් බවට පරිවර්තනය කිරීමයි. මෙම යෙදවුම දැනට සංවර්ධන මට්ටම යටතේ පවතී.

ix. **සේවක සංඛ්‍යාව ආශ්‍රිත වාර්තා ජනනය කිරීම සඳහා වන පරිගණක යෙදවුම**

සේවක සංඛ්‍යාව සම්බන්ධ වාර්තා පහසුවෙන් ජනනය කිරීම සඳහා මානව සම්පත් අංශයේ ඉල්ලීම අනුව මෙම යෙදවුම සංවර්ධනය කර ඇත. දැනට යෙදවුම පරීක්ෂා කිරීම සඳහා මානව සම්පත් අංශයට භාර දී ඇත.

12.2 ජාල සහ දෘඪාංග වැඩිදියුණු කිරීම

තොරතුරු තාක්ෂණ අංශය විසින් සුමට තොරතුරු තාක්ෂණ පරිසරයක් සහතික කිරීම සඳහා දෘඩාංග හා ජාල ආශ්‍රිත මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කරයි.

- දැනට පවතින දුරකථන පද්ධතියේ ගැටලු හඳුනාගෙන ඒවා විසඳීමට කටයුතු කිරීම.
- ඉල්ලීම් අනුව තාක්ෂණික පිරිවිතර සැපයීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රාදේශීය ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- අංශවල ප්‍රාදේශීය සරි ජාලය (Local Area Network) උසස් කිරීම සහ උසස් කිරීමෙන් පසු පැන නගින ගැටලු නිරාකරණය කිරීම.

i. ඩිජිටල් දුරකථන පද්ධතිය (PABX) ප්‍රතිව්‍යුහගත කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීම සහ ඵලදායී රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා, ඔවුන්ගේ අභ්‍යන්තර දුරකථන මාර්ග සඳහා අභිරුචිකරණය කළ හැකි විශේෂාංග සහිත මිල අඩු විකල්ප ලබා දෙන PBX පද්ධතියක් සකස් කරන ලදී.

මහජනතාව විසින් ලබා දෙන ඇමතුම් වැඩිදියුණු කිරීමට තොරතුරු මධ්‍යස්ථානයේ පැවතී අන්තර්ජාල ප්‍රොටෝකෝල දුරකථන (IP Phones) වෙනුවට ඇමතුම් මධ්‍යස්ථාන පහසුකම් සඳහා සහය දක්වන අමතර විශේෂාංග සහිත නව දුරකථන ප්‍රතිස්ථාපනය කරන ලද අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සන්නිවේදනය වැඩිදියුණු කිරීම සඳහා වෙනත් තෙවන පාර්ශවීය අන්තර්ජාල ප්‍රොටෝකෝල දුරකථන කිහිපයක් ප්‍රතිස්ථාපනය කරන ලදී.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ පුංචි බොරැල්ල පරිශ්‍රයේ ෆයර්වෝල් (Firewalls) ක්‍රියාත්මක කිරීම

ෆයර්වෝල් පූර්ව නිශ්චිත ආරක්ෂක නීති මත පදනම්ව පැමිණෙන සහ පිටතට යන ජාල ගමනාගමනය නිරීක්ෂණය සහ පාලනය කරන ජාල ආරක්ෂාව සහතික කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පරිශ්‍රයේ සහ පුංචි බොරැල්ල පරිශ්‍රයේ ඇති ෆයර්වෝල් දෙක Site to Site VPN හරහා එකිනෙකට සම්බන්ධ වේ.

iii. ජාල යටිතල පහසුකම් පරිපාලනය සහ අධීක්ෂණය.

- Lanka Education & Research Network (LEARN) විසින් කළමනාකරණය කරනු ලබන Eduroam රැහැන් රහිත සේවාව නඩත්තු කිරීම
- Kaspersky Antivirus Guard හි පරිපාලනය සහ අධීක්ෂණය.
- බලපත්‍ර අධීක්ෂණය සහ අලුත් කිරීම (ෆයර්වෝල්, SSL යනාදිය)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පවතින රැහැන් රහිත උපාංග නඩත්තු කිරීම.

- ඉන්ටර්කොම් පද්ධතිය කළමනාකරණය කිරීම.
- CCTV කැමරා පද්ධතිය නඩත්තු කිරීම.

iv. සබැඳි සහයෝගිතා පහසුකම වැඩිදියුණු කිරීම

නව තාක්ෂණය පදනම් කරගත් වීඩියෝ සම්මන්ත්‍රණ උපාංගයක් හඳුන්වා දීමෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාමණ්ඩල කාමරය තුළ පවත්වන රැස්වීම් සහ ඉදිරිපත් කිරීම් පහසුකම වැඩි දියුණු කිරීම.

v. ජාල ප්‍රතිව්‍යුහගත කිරීම

දෙපාර්තමේන්තු/අංශ කිහිපයක ජාලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා විවිධ අන්තර්ජාල ප්‍රොටොකෝල් ලිපින (IP Addresses) මගින් වෙන් කර ඇත.

vi. රැහැන් රහිත විසඳුම්

පැරණි අන්තර්ජාල ප්‍රවේශ ලක්ෂ්‍යයන් යල් පැන ගිය සහ නවතම තාක්ෂණයන් සමඟ නොගැලපෙන බැවින් නව රැහැන් රහිත විසඳුමක් ආරම්භ කරන ලදී. එසේම, මෙම පැරණි උපාංග සමඟ අපේක්ෂිත අන්තර්ජාල වේගය ලබා ගත නොහැක.

13. නීති කටයුතු

13.1 නව ව්‍යවස්ථා

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් නියමයන් 27ක් සහ නියමාවලීන් 02 ක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී.

- **2022 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද නියමයන්**

i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.02.11 දිනැති අංක 2266/73 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය යටතේ දෘෂ්ඨීමිතික අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

ii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.02.17 දිනැති අංක 2267/35 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය පිහිටුවීමේ නියමය.

iii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.03.03 දිනැති අංක 2269/53 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය යටතේ පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

iv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.06 දිනැති අංක 2274/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ කැළණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨය යටතේ තොරතුරු තාක්ෂණ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

v. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.06 දිනැති අංක 2274/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ කලා පීඨය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

vi. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.06 දිනැති අංක 2274/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

vii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.06 දිනැති අංක 2274/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

viii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.06 දිනැති අංක 2274/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා භාෂා පීඨය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

ix. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.06 දිනැති අංක 2274/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

x. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.06 දිනැති අංක 2274/15 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xi. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.18 දිනැති අංක 2276/04 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.06.22 දිනැති අංක 2285/09 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨය පිහිටුවීමේ නියමය.

xiii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.07.26 දිනැති අංක 2290/13 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලා සහ සංස්කෘතික කටයුතු පීඨය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xiv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.08.09 දිනැති අංක 2292/30 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ

යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය යටතේ යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.07.28 දිනැති අංක 2290/30 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨය යටතේ පහසුකම් කළමනාකරණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xvi. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.08.19 දිනැති අංක 2293/63 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xvii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.08.25 දිනැති අංක 2294/43 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තාක්ෂණික අධ්‍යයන පීඨය යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xviii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.04.18 දිනැති අංක 2276/04 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් ප්‍රාසාංගික සහ දෘෂ්‍ය කලා පීඨය පිහිටුවීමේ නියමය.

xix. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.09.30 දිනැති අංක 2299/67 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය යටතේ වූ "පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය" වෙනුවට "ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ සහ පවුල් වෛද්‍ය අධ්‍යනාංශය" යනුවෙන් ආදේශ කරන ලදී.

xx. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.10.11 දිනැති අංක 2301/31 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය යටතේ වූ "කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යනාංශය" වෙනුවට "කෘෂි ආර්ථික විද්‍යා සහ කෘෂි ව්‍යාපාර අධ්‍යනාංශය" යනුවෙන් ආදේශ කරන ලදී.

xxi. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.10.27 දිනැති අංක 2303/24 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය යටතේ පරිගණක අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xxii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.09.30 දිනැති අංක 2299/66 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය යටතේ වූ "කෘෂි ඉංජිනේරු අධ්‍යනාංශය" වෙනුවට "කෘෂි ඉංජිනේරු සහ පාරිසරික තාක්ෂණවේද අධ්‍යනාංශය" යනුවෙන් ආදේශ කරන ලදී.

xxiii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.11.09 දිනැති අංක 2305/16 දරන රජයේ

අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය යටතේ ආහාර විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xxiv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.12.13 දිනැති අංක 2310/13 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය යටතේ නාවික ඉංජිනේරු සහ නෞකා නිර්මාණ අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xxv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.12.12 දිනැති අංක 2310/06 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨය යටතේ සන්නිවේදන හා නිර්මානාත්මක කලා අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

xxvi. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.12.19 දිනැති අංක 2311/12 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය යටතේ වූ "ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ අධ්‍යනාංශය" වෙනුවට "ප්‍රවාහන කළමනාකරණ සහ කාර්යෝපාය ඉංජිනේරු අධ්‍යනාංශය" යනුවෙන් ආදේශ කරන ලදී.

xxvii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2022.12.27 දිනැති අංක 2312/14 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨය පිහිටුවීමේ නියමය.

- **2022 දී ප්‍රකාශයට පත් කරන ලද නියමාවලීන්**

i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2022..05.27 දිනැති අංක 2281/33 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයේ ප්‍රකාශිත පරිදි 2008 අංක 02 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි-තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය.

ii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2022.12.29 දිනැති අංක 2312/38 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයේ ප්‍රකාශිත පරිදි 2022 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය.

13.1 අධිකරණ නඩු

2022 වර්ෂය තුළ විවිධ පාර්ශවයන් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව අධිකරණ හා විනිශ්චය සභාවල ගොනු කර තිබූ පහත සඳහන් නඩු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අංශය විසින් මෙහෙයවන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය	-	නඩු 38
අභියාචනාධිකරණය	-	නඩු 35
විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය	-	නඩු 36
දිස්ත්‍රික් අධිකරණය	-	නඩු 04
කම්කරු විනිශ්චය සභාව	-	නඩු 02
බේරුම්කරණය	-	නඩු 01
මහාධිකරණය	-	නඩු 02

13.2 වෙනත් ක්‍රියාකාරකම් වලට ලබා දෙන ලද දායකත්වය

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සිදු කළ ක්‍රියාකාරකම්**

  i. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ උපකුලපතිට එරෙහිව ඇති පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ රැස්වීම් සහ එකී කමිටුවේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සහාය ලබාදීම.

  ii. උසස් අධ්‍යාපන විද්‍යායතනයන්හි සියලුම නියමාවලි නැවත පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද උපදේශකවරුන් හට සහාය ලබාදීම.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිටත සිදු කළ ක්‍රියාකාරකම්**

  i. ජාතික අධ්‍යාපන ආයතන පනත සංශෝධනය කිරීමේ කමිටු සාමාජික

  ii. හෙද සහ ගුරු විශ්වවිද්‍යාල පිහිටුවීමේ නෛතික ලේඛන සැදීමේ කටයුතු සඳහා සහාය ලබාදීම.

14. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ වාර 26ක් රැස්වී ඇත. 2022 වර්ෂයේ දී අභියාචනා මණ්ඩලය තුළ අභියාචනා 30ක් ලියාපදිංචි කොට ඇත. 01ක් මූලික නියෝගයක් ලබා දී ඇත. අභියාචනා 10 ක් සම්බන්ධයෙන් නියෝග නිකුත් කරන ලද අතර ඉන් 03 ක් නිෂ්ප්‍රභා කර 01 ක් පිළිගෙන ඇති අතර ඉන් අභියාචනා 06 ක් නිෂ්ප්‍රභා කර හෝ පිළිගෙන නොමැත. බේරුම්කරණය සහ අභියාචකයාගේ කැමැත්ත හේතුවෙන්අ භියාචනා 05ක නඩු කටයුතු අවසන් විය. කිසිදු අතුරු නියෝගයක් ද නිකුත් කර නොමැත. නියෝග 07 ක් 2022 වර්ෂය අවසාන වන විට ලේඛණ ගත කර ඇත. කිසිදු අභියාචනාවක් කල් තබා නොමැත. 2022 අවසන් වන විට අභියාචනා හතළිස් එකක් (41) විභාග වෙමින් පැවැතුණි.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් දෙන ලද නියෝගයන්ට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ අභියාචන 03ක් ඉදිරිපත් කර ඇති අතර කිසිදු නියෝගයකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනාවක් ඉදිරිපත් කර නොමැත.

15. මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු

මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ 3 වන ඡේදයේ, 1 වන පරිච්ඡේදය මගින් පවරා ඇති බලය යටතේ ස්ථාපිත කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශයේ මූලික පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙන්ම අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන පැවරුම් සහ පරීක්ෂණ පැවැත්වීමයි.

15.1 විගණන වැඩසටහන

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ, කළමනාකරණ සහ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද F.R.133 සහ විගණන සහ කළමනාකරණ චක්‍රලේඛ අංක DMA/2009(1) හි ඇමුණුම 2 ට අනුකූලව වසර සඳහා අදාළ වන විගණන වැඩසටහන සකස් කර ඇත.

15.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

කොමිෂන් සභාවේ භාණ්ඩාගාර නියෝජිතයින් විසින් විගණන කමිටුවේ සභාපතිත්වය දැරූ අතර එය කොමිෂන් සභාවේ අනුකමිටුව ලෙස විධිමත් ලෙස පිහිටුවන ලද තවත් කොමිෂන් සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. ජාතික විගණන කොමිෂන් සභාවේ විගණන අධිකාරීවරයා නිරීක්ෂකයකු ලෙස රැස්වීමට සහභාගි වූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් හා ගණකාධිකාරී සහ අනෙකුත් නිලධාරීන් ආරාධිතයන් ලෙස සහභාගී විය.

2022 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හයක් සහ විශේෂ විගණන කමිටු රැස්වීමක් පවත්වන ලදී.

වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සංසරණය විය යුතු ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් විගණන කමිටුව කළමනාකරණ කමිටුවට හෝ කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි. විගණකාධිපති විසින් නිකුත් කරන ලද වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා ද සාකච්ඡාවට බඳුන් කෙරේ.

15.3 පවත්වන ලද පූර්ව විගණනයන්

සේවකයින්ට නිකුත් කරනු ලබන ගෙවීම්වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් හි පූර්ව විගණනයක් සිදු කරන ලදී.

- අර්ථසාධක අරමුදල නිදහස් කිරීම
- පාරිතෝෂික ගෙවීම
- විශ්‍රාම වැටුප් නිදහස් කිරීම

15.4 ප්‍රගති වාර්තාව - අභ්‍යන්තර විගණන අංශය 2022

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශයේ හි කාර්ය මණ්ඩලය, 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ විගණන පරීක්ෂණ සඳහා උසස් අධ්‍යාපන ආයතන සහ ආයතන වෙත ගොස් ඇත. ඒවා ඔවුන්ගේ විගණන කමිටු වෙත ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති හරහා අදාළ උසස් අධ්‍යාපන ආයතන/ආයතනවල උපකුලපතිවරුන්/ මණ්ඩපාධිපතිවරුන්/ අධ්‍යක්ෂවරුන් වෙත එම වාර්තා යවන ලදී.

අභ්‍යන්තර විගණන වාර්තා වල සාරාංශය – 2022

අංකය	විෂය	යොමු අංකය	වාර්තාව ඉදිරිපත් කළ දිනය
01	විගණන වාර්තාව අතැති මුදල් - පිළිබඳ භෞතික සත්‍යාපනය	UGC/CIA/F/IAR/22-01	12/01/2022
02	විගණන වාර්තාව - ලැප්ටොප් පරිගණක ප්‍රසම්පාදනය -2020	UGC/CIA/IAR/22-02	13/01/2022
03	විගණන වාර්තාව -2021 වසර සඳහා NCAS හි ගෙවීම් වවුචර	UGC/CIA/IAR/22-03	13/01/2022
04	විගණන වාර්තාව ලැබීම් සහ බැංකු සහ ප්‍රතිසන්ධාන බැංකුකරණය NCAS	UGC/CIA/IAR/22-03-1	13/01/2022
05	විගණන වාර්තාව- අත්තිකාරම් සහ පියවීම - NCAS	UGC/CIA/IAR/22-03-2	20/01/2022
06	NCAS හි පුද්ගලික ගොනු පිළිබඳ විගණන වාර්තාව	UGC/CIA/F/IAR/22-03-3	07/02/2022
07	මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ විගණන පරීක්ෂණය - 2021 - ප්‍රාග්ධන ප්‍රදාන	UGC/CIA/F/IAR/22-03-4	07/02/2022
08	මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ විගණන පරීක්ෂණය - ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් කළමනාකරණය	UGC/CIA/F/IAR/22-03-5	08/02/2022
09	මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ විගණන පරීක්ෂණය - පර්යේෂණ සම්මන්ත්‍රණය, වැඩමුළුව සහ සම්මන්ත්‍රණ	UGC/CIA/F/IAR/22-03-6	04/03/2022
10	පැමිණීම, නිවාඩු වාර්තා, වැටුප් සහ පර්යේෂණ දීමනා පිළිබඳ විගණන වාර්තාව -NCAS	UGC/CIA/IAR/22-03-7	10/03/2022
11	පුද්ගලික ලිපිගොනු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/IAR/22-04	14/03/2022
12	මූල්‍ය බලතල පැවරීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව 2022 – විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/IAR/22-05	26/04/2022
13	ගබඩා සහ ගබඩා පටිපාටිය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/IAR/22-06	26/04/2022

අංකය	විෂය	යොමු අංකය	වාර්තාව ඉදිරිපත් කළ දිනය
14	විශේෂ වාර්තාව – මහාචාර්ය එම්.එම්.එම්. නජීම් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ හි ගණන් දීමේ නිලධාරියා ලෙස ඔහුගේ පරිපාලන අධිකාරිය භාවිතා කරමින් රජයේ අරමුදල් මිලියන 1.47 වංචා කර ඇති අතර අග්නිදිග විශ්වවිද්‍යාල තුළ එවැනි ක්‍රියාවන් දිගින් දිගටම සිදු කිරීම.	UGC/CIA/IAR/22-07	21/06/2022
15	අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2022/2021 පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය	UGC/CIA/F/IAR/22-08	22/06/2220
16	විගණන වාර්තාව -UGC හි ගෙවීම් වවුචර	UGC/CIA/IAR/22-09	08/08/2022
17	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ ආයෝජනය පිළිබඳ විගණන පරීක්ෂණය	UGC/CIA/IAR/22-10	09/08/2022
18	විගණන වාර්තාව මානව සම්පත් - දියුණුව පිළිබඳ ආයතනය	UGC/CIA/F/IAR/22-11	16/08/2022
19	ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ (NILIS) විගණන පරීක්ෂණය	UGC/CIA/F/IAR/22-12	30/09/2022
20	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ D.L.C.J. මල්ලිකා මහත්මියගේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා වන අයදුම්පත්‍රය පිළිබඳ විගණන පරීක්ෂණය.	UGC/CIA/F/IAR/22-13	18/10/2022
21	ගබඩා සහ ගබඩා පටිපාටිය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	UGC/CIA/F/IAR/22-14	31/10/2022
22	බැංකුකරණය, බැංකු ප්‍රතිසන්ධාන, ගෙවීම් වවුචර් සහ වැටුප් සහ ඒ ආශ්‍රිත වියදම් -NCAS	UGC/CIA/F/IAR/22-15-1	21/11/2022
23	භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සහ ඉන්ධන දීමනාව -NCAS	UGC/CIA/F/IAR/22-15-2	21/11/2022
24	පුද්ගලික ගොනු පිළිබඳ විගණන වාර්තාව -NCAS	UGC/CIA/F/IAR/22-15-3	21/11/2022
25	විශ්‍රාම වැටුප් අරමුදල	UGC/CIA/F/IAR/22-15-16	14/12/2022

වගුව: 15.4 ප්‍රගති වාර්තාව- අභ්‍යන්තර විගණන අංශය

15.5 නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි සහ ආයතන චක්‍රලේඛ ලිපි

පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව චක්‍රලේඛ තුනක් (3) නිකුත් කරන ලදී.

	චක්‍රලේඛ අංකය	විෂය	චක්‍රලේඛයේ දිනය
01	අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 01/2022	වෙබ් අඩවියේ පළ කිරීම හිඟ - බැඳුම්කර මුදල් ගෙවීමට ඇති බැඳුම්කර උල්ලංඝනය කළ පුද්ගලයන්ගේ ලැයිස්තුව	19/01/2022
02	අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 02/2022	මූල්‍ය රෙගුලාසිවල විධිවිධාන යටතේ බැඳුම්කර වටිනාකම අයකර ගැනීම	22/06/2022
03	අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 03/2022	උසස් අධ්‍යාපන ආයතනයන් හි බැඳුම්කර සමාලෝචන කමිටුව සඳහා යොමු කොන්දේසි (TOR)	12/12/2022

වගුව: 15.5 නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි සහ ආයතන චක්‍රලේඛ ලිපි

16. ප්‍රකාශන සහ වාර්තා / සංවර්ධන ක්‍රියාකාරකම් / විශේෂ පැවරුම්

16.1 ප්‍රකාශන සහ වාර්තා

2022 තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් පහත සඳහන් වැදගත් ප්‍රකාශන සහ වාර්තා සමඟ පද්ධතියට පරිපාලනමය සහාය ලබා දෙන ලදී;

- "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන 2021" ප්‍රකාශන මාලාවේ 20 වන වෙළුම, 2022 අගෝස්තු මාසයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපදන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

16.2 සංවර්ධන කටයුතු

- විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ වෙබ් අඩවියේ (webometrics) හා QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යාවත්කාලීන කරන ලද ශ්‍රේණිගත කිරීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම.

- Science Land IT (PVT) Ltd විසින් නිපදවන ලද වෙබ් පාදක කළමනාකරණ තොරතුරු පද්ධතිය, එහි වාර්තා උත්පාදනය පරීක්ෂා කිරීමේ අදියරේ පවතී. ඒ අනුව සියලුම විශ්වවිද්‍යාලවල දත්ත ඇතුළත් කර වාර්තා පරීක්ෂා කරන ලදී.

16.3 විශේෂ පැවරුම්

2022 වර්ෂය තුළ පහත සඳහන් විශේෂ පැවරුම් සිදු කරන ලදී.

1. ජාතික පර්යේෂණ සහ සංවර්ධන (R&D) සමීක්ෂණය 2021 සඳහා විශ්වවිද්‍යාල වලින් එකතු කරන ලද දත්ත පරීක්ෂා කර අවසන් කරන ලදී.

2. උසස් අධ්‍යාපන ආයතනයන් හි බැඳුම්කර ගිවිසුම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් (2022 ජූනි 31 දින වන විට) කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳව තොරතුරු රැස් කොට, අභ්‍යන්තර විගණන අංශය වෙත ලේඛනය ඉදිරිපත් කරන ලදී.

3. පහත දක්වා ඇති පරිදි අවසාන එම්.බී.බී.එස් (ප්‍රධාන) විභාගය මත පදනම්ව එම්.බී.බී.එස් උපාධිධාරීන්ගේ පොදු කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව සම්පාදනය කිරීම සහ සීමාවාසික පුහුණු ස්ථානගත කිරීම් සඳහා එය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම;

   - 2014/15 ප්‍රධාන විභාගය සඳහා කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව
   - 2013/14 පුනර් පරීක්ෂණ විභාගය සඳහා කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව

4. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉල්ලා සිටි පරිදි දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල සියලුම ඉඩම්/ඉඩම් අත් කර ගැනීම් සහ හිමිකම් ඔප්පු පිළිබඳ දත්ත රැස් කිරීම ආරම්භ කර ඇත.

5. මහ බැංකුවේ වාර්ෂික වාර්තාව සහ 2022 මැතකාලීන ආර්ථික සංවර්ධන විශේෂ අවස්ථා සහ 2023 සඳහා සපුරා ගැනීමට නියමිත අපේක්ෂාවන්, සම්පූර්ණ කර මහ බැංකුව වෙත ඉදිරිපත් කර ඇත.

6. 2021 වසර සඳහා පීඨය විසින් උපාධි අපේක්ෂකයින්ගේ ඒකක පුනරාවර්තන පිරිවැය පිළිබඳ වාර්තාව විශ්ලේෂණය කර සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

7. 2022 සැප්තැම්බර් 30 වැනි දිනට විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් පිළිබඳ වාර්තාව සම්පාදනය කර උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

8. පහත පාර්ශ්වකරුවන්ගේ දත්ත ඉල්ලීම් සපුරාලමින් සම්පූර්ණ දත්ත ලබා දෙන ලදී;
   - යුනෙස්කෝ
   - මහ බැංකුව
   - ජනලේඛන දෙපාර්තමේන්තුව
   - AHEAD ව්‍යාපෘතිය
   - වෙනත් රජයේ ආයතන

9. සෑම මසකම 25 වන දිනට ප්‍රථම උපාධි වැඩසටහන්වල ප්‍රගතිය සම්පාදනය කර සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

17. ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය

විවිධත්වයට සහ සමානාත්මතාවයට සංවේදී වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල හිතකර ඉගෙනුම්/සේවා පරිසරයක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. ඒ අනුව, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රජාවන්හි අසමානතා අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරන විවිධ ක්‍රියාකාරකම් සමූහයක නිරත වෙමින් සිටී. මහාචාර්ය හේමමාලි ගුණතිලක (කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආචාර්ය උපාධිය, වෝර්වික් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරිය ලෙස 2022 මැයි දක්වා සප්ත වාර්ෂික නිවාඩු තුළ සිදු කළ පත්වීමක් ලෙස කටයුතු කරන ලදී. ඇයගේ වසරක සේවා කාලය සම්පූර්ණ වූ පසු ඇය එම මධ්‍යස්ථානයේ වැඩබලන අධ්‍යක්ෂවරිය ලෙස නැවත පත් කරන ලද අතර 2022 වර්ෂයේදී එම මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

17.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙ හි මධ්‍යගත දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය

2022 වර්ෂයේ දී නවක සිසුන්ගෙන් හෝ ඔවුන්ගේ දෙමව්පියන්ගෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයන්ගෙන් නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ පැමිණිලි, 2016 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාපිත දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් යටතේ ස්ථාපිත කර ඇති පහත මාර්ග ඔස්සේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී ඇත.

- නවක වදය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරය www.ugc.ac.lk/rag/හෝ https://www.eugc.ac.lk/rag/
- 0112123700 දුරකථන අංකය
- විද්‍යුත් ලිපිනය raggінghelp@ugc.ac.lk සහ helpme@ugc.ac.lk
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත ඇමතුම් ලබා දීම, පෞද්ගලිකව හෝ ලිඛිතව පැමිණිලි ඉදිරිපත් කිරීම, විද්‍යුත් ලිපිනය ඔස්සේ දැනුම් දීම.

17.2 පැමිණිලි ද්වාරය

රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට මාර්ගගත පැමිණිලි ද්වාරයට ප්‍රවේශ විය හැකි අතර නවක වදයට සම්බන්ධ නමුත් ප්‍රධාන වශයෙන් ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ලෙස වර්ගීකරණය කළ හැකි සිදුවීම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. 2022 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩු අගයක් ගන්නා ලදී. එයට හේතුව වුයේ විශ්වවිද්‍යාල මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක වීමත් සිසුන් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ භෞතිකව නොසිටීමත් ය. කෙසේ වෙතත්, ලැබුණු පැමිණිලි කිහිපයක් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ විශ්වවිද්‍යාල වෙත යොමු කරන ලද අතර පවතින සමහර පැමිණිලි පිළිබඳව ක්‍රියාකර විසඳා ඇත (ලැබුණු සහ අවශ්‍ය පියවර ගන්නා ලද පැමිණිලි සංඛ්‍යාව 71 ක් වූ අතර පැමිණිලි 18 ක කටයුතු අවසන් කර ඇත).

17.3 පර්යේෂණ මුල පිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාලවල නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ සහ නවක වදයට එරෙහිව සටන් කිරීමට උපාය මාර්ග යෝජනා කිරීම සහ පැහිරීම අවම කිරීම පිළිබඳව වන UNICEF විසින් අරමුදල් සපයන ලද ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාව 2022 වර්ෂයේ මාර්තු මාසයේදී නිකුත් කරන ලදී. ලේකම්/අධ්‍යාපන අමාත්‍යාංශය, යුනිසෙෆ් නිලධාරීන්, උපකුලපතිවරුන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයන්, විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රවල අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් ආරාධිතයන්ගේ සහභාගීත්වයෙන් පර්යේෂණ වාර්තාව එළිදැක්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සරල උත්සවයක් පවත්වන ලදී.





17.4 2022 දී ගන්නා ලද මුලපිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ ප්‍රධාන වශයෙන් සිදු කරනු ලැබුවේ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය බහුලවීමට හේතු හඳුනා ගැනීම සහ එවැනි සිදුවීම් අවම කිරීම සඳහා උපාය මාර්ග යෝජනා කිරීම සඳහා ය. විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ විවිධත්වය සහ සමාන ප්‍රවේශය සම්බන්ධ ගැටළු විසඳීමට ඇති නොහැකියාව බව අධ්‍යයන සොයාගැනීම්වලින් අනාවරණය විය. එවැනි සොයාගැනීම් මත පදනම්ව, මේ වන විට ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ සම්පත් දායකයින්ගේ සහාය ඇතිව 'විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම' නමින් පාඨමාලාවක් සකස් කර ඇත. මෙම පාඨමාලාව පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සම්පාත වේ:

ඉලක්කය 4 : ගුණාත්මක අධ්‍යාපනය
ඉලක්කය 5 : ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය
ඉලක්කය 10: අඩු කරන ලද අසමානතා
ඉලක්කය 11: තිරසාර නගර සහ ප්‍රජාවන්
ඉලක්කය 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

අදහස්, ප්‍රතිචාර සහ අනුමැතිය සඳහා පාඨමාලා කෙටුම්පත පහත සංසද වෙත ඉදිරිපත් කරන ලදී.

1. කොමිෂන් සභා සාමාජිකයින් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. උප කුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව (CVCD)
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයින්

4. රාජ්ය විශ්වවිද්යාලවල තත්ත්ව ආරක්ෂණ ඒකකවල අධ්යක්ෂවරුන්

පාඨමාලා සංවර්ධනය 2022 මාර්තු මාසයේදී අවසන් කරන ලදී.

"විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම" යන මාතෘකාව යටතේ, මෙම පාඨමාලාව පැවැත්වීමට අධ්යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා වන පුහුණු කිරීමේ (ToT) වැඩසටහන් 2022 දී පහත සඳහන් විශ්වවිද්යාලවල පවත්වන ලදී.

- කොළඹ විශ්වවිද්යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්යාලය
- රුහුණු විශ්වවිද්යාලය
- කැලණිය විශ්වවිද්යාලය
- සෞන්දර්ය විශ්වවිද්යාලය
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්යාලය
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්යාලය

පුහුණු කිරීම සඳහා වන පුහුණු කිරීමේ (ToT) වැඩසටහන් 2023 දී පහත විශ්වවිද්යාලවල පැවැත්වේ.

- මොරටුව විශ්වවිද්යාලය
- පේරාදෙණිය විශ්වවිද්යාලය
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්යාලය
- නැගෙනහිර විශ්වවිද්යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්යාලය
- යාපනය විශ්වවිද්යාලය
- වවුනියාව විශ්වවිද්යාලය

17.5 ජාත්‍යන්තර කාන්තා දින සැමරුම්

2022 ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම සඳහා මාර්ගගත උත්සවයක් පවත්වන ලදී. මෙම අවස්ථාවට විවිධ විශ්වවිද්යාල වලින් 800 කට වැඩි පිරිසක් සහභාගී වූහ.



මෙම අවස්ථාව පහත ඉදිරිපත් කිරීම් වලින් අනතුරුව පවත්වන ලද සාකච්ඡාවලින් සමන්විත විය.

1. මහාචාර්ය වසන්ති අරසරත්නම්/ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ සම සභාපති - විශ්වවිද්යාල ප්‍රජාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය

2. මහාචාර්ය දීපිකා උඩගම/ පේරාදෙණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ නීති රාමුව පිළිබඳ කථිකාවක්

3. ආචාර්ය ප්‍රභා මනුරත්න/ කැලණිය විශ්වවිද්‍යාලය - ස්ත්‍රී පුරුෂ භාවය, සමාජ නිර්මාණයක් ලෙස - කථිකාවක්.

17.6 ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගෝලීය සමුළුව

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගෝලීය සමුළුවක් සංවිධානය කිරීමටත් 2024 දී එය පැවැත්වීමටත් ස්ථාවර කමිටුව යෝජනා කළේය. සමුළුව සංවිධානය කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලද අතර එය ස්ථාවර කමිටුවේ ස්වේච්ඡා සාමාජිකයින්ගෙන් සහ සියලුම විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රස්ථානවල අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

17.7 ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ විසින් එහි කාර්ය මණ්ඩලය වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙම පුහුණුව ස්ත්‍රී පුරුෂ භාවය සහ අසමානතාවයේ වෙනත් ආකාර, පුද්ගල සංවර්ධනය, වෘත්තීය ප්‍රගතිය සහ අන්තර් පුද්ගල සහ සමාජ කුසලතා වැනි ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

18. විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලබා දීම

ශිෂ්‍යත්ව යනු පරිත්‍යාගශීලීන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් එකඟ වන නියමයන් සහ කොන්දේසි මත පුද්ගලයන් හෝ සංවිධාන විසින් ස්ථාපිත කර ඇති සහ අනාගතයේදී ස්ථාපිත කළ හැකි ඒවා වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය, දැනට මුදල් අංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශයේ සහාය ඇතිව පහත සඳහන් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කරනු ලබයි;

18.1 2022 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් කළමනාකරණය කරන සහ පහසුකම් සපයන ශිෂ්‍යත්ව වැඩසටහන්වල වර්තමාන තත්ත්වය

ශිෂ්‍යත්වයේ නම	මිට්සුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව
ශිෂ්‍යත්ව කාලය	2021 සැප්තැම්බර් 1 සිට 2022 අගෝස්තු 31 දක්වා කාලය තුළ තෝරාගත් සිසුන්ට ශිෂ්‍යත්ව මුදල එකවර ගෙවීමක් ලෙස ලබා දෙනු ලැබේ.
ශිෂ්‍යත්වයෙන් පිරිනමන මුදල් ප්‍රමාණය	එක් ශිෂ්‍යත්වලාභියෙක්ට රු. 59,500/- බැගින්
සුදුසුකම් නිර්ණායක	කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණ පීඨයේ හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ වාණිජ්‍යය පීඨයේ අධ්‍යයන පාඨමාලා හැදෑරීමට තෝරාගෙන ඇති සිසුන්
ශිෂ්‍යත්ව ප්‍රදානය කළ සිසුන් සංඛ්‍යාව	කොළඹ විශ්වවිද්‍යාලය - 15 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 15

වගුව 18.1.1 මිට්සුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව

ශිෂ්‍යත්වයේ නම	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය
ශිෂ්‍යත්ව කාලය	2017/2018 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍යත්ව ලබන්නෙකුට වසරකට වාරික 10 බැගින් ගෙවනු ලබන අතර මෙම මුදල ශිෂ්‍යත්ව ලබන්නාගේ සම්පූර්ණ අධ්‍යයන කාලය සඳහා ප්‍රදානය කෙරේ.
ශිෂ්‍යත්වයෙන් පිරිනමන මුදල් ප්‍රමාණය	ශිෂ්‍යත්වවල වාර්ෂික වටිනාකම රු. 25,000/- වන ආතර ශිෂ්‍යත්ව ලබන්නෙකුට වාරික 10 බැගින් ගෙවනු ලබන අතර මෙම මුදල ශිෂ්‍යත්ව ලබන්නාගේ සම්පූර්ණ අධ්‍යයන කාලය සඳහා ප්‍රදානය කෙරේ.
සුදුසුකම් නිර්ණායක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 පෙබරවාරි 11 වැනි දින පැවති සිය 934 වැනි සභා වාරයේදී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශිෂ්‍යත්ව සඳහා ලකුණු ලබා දීමේ නිර්ණායක මත පදනම්ව ඇගයීමට ලක් කරන ලදී.
ශිෂ්‍යත්ව ප්‍රදානය කළ සිසුන් සංඛ්‍යාව	2017/2018 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල පද්ධතියේ සිසුන් 41දෙනෙක්

වගුව **18.1.2.** **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**

ශිෂ්‍යත්වයේ නම	හොඳම විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සඳහා වන ශිෂ්‍යත්ව
ශිෂ්‍යත්ව කාලය	2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළව ශිෂ්‍යත්ව හයක් විවිධ විෂය ධාරාවන් සඳහා තෝරාගනු ලබන ශිෂ්‍යයන්ට එකවර ගෙවීමක් ලෙස ලබා දෙනු ලැබේ.
ශිෂ්‍යත්වයෙන් පිරිනමන මුදල් ප්‍රමාණය	එකවර රු. 25,000/-
සුදුසුකම් නිර්ණායක	අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් ඔහුගේ/ඇයගේ පළමු උත්සාහයේ දීම පහත විෂය ධාරාවන්ගෙන් දිවයිනේ ඉහළම දස්කම් දක්වන සිසුන්ට; 1. කලා විෂය ධාරාව 2. වාණිජ විෂය ධාරාව 3. ජීව විද්‍යා විෂය ධාරාව 4. භෞතික විද්‍යා විෂය ධාරාව 5. ඉංජිනේරු තාක්ෂණය

රටේ අධ්‍යාපනයේ යහපැවැත්ම සඳහා දායක වූ ජාතික කීර්තිමත් ශ්‍රී ලාංකිකයන්ගේ නම්වලින් විවිධ විෂය ධාරාවන් ඔස්සේ ශිෂ්‍යත්ව ප්‍රදානය කළ සිසුන් සංඛ්‍යාව.	**ශිෂ්‍යත්ව හයක (06) විස්තර පහත පරිදි වේ;** 1. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (විද්‍යෝදය පිරිවෙනේ නිර්මාතෘ) - කලා විෂය ධාරාව 2. පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි (විද්‍යාලංකාර පිරිවෙනේ නිර්මාතෘ) - වාණිජ විෂය ධාරාව 3. ආචාර්ය සී.ඩබ්ලිව් ඩබ්ලිව්. කන්නන්ගර (නිදහස් අධ්‍යාපනයේ පියා) - ජීව විද්‍යා විෂය ධාරාව 4. සර් නිකලස් ආටිගල (පළමු ශ්‍රී ලංකා උපකුලපති) - පෙව පද්ධති තාක්ෂණය. 5. ලලින් ඇතුලත්මුදලි මහතා (මහපොළ නිර්මාතෘ) - භෞතික විද්‍යා විෂය ධාරාව 6. ආචාර්ය ස්ටැන්ලි කල්පගේ (ආරම්භක සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) - ඉංජිනේරු තාක්ෂණය

වගුව **18.1.3.** **හොඳම විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සඳහා වන ශිෂ්‍යත්ව**

ශිෂ්‍යත්වයේ නම	ඩබ්ලිව් පී හෙන්ද්‍රික් අප්පු අබේදීර ශිෂ්‍යත්ව වැඩසටහන
ශිෂ්‍යත්ව කාලය	එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගනු ලබන ශිෂ්‍යයෙකුට එක් අධ්‍යයන වර්ෂයකට එක් ශිෂ්‍යත්වයක් පමණක් එකවර ගෙවීමක් ලෙස ලබා දෙනු ලැබේ.
ශිෂ්‍යත්වයෙන් පිරිනමන මුදල් ප්‍රමාණය	රුපියල් 1,000,000/- ක තැන්පතුවක් තැබීමෙන් පසු එයට ලැබෙන වාර්ෂික පොලිය (පවත්නා බැංකු අනුපාත මත පදනම්ව) මත ශිෂ්‍යත්ව ගෙවීම පදනම් වේ. එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද උපරිම සීමාවකට යටත් වේ.
සුදුසුකම් නිර්ණායක	හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ඉංජිනේරු අධ්‍යයන පාඨමාලාවට තෝරා ගන්නා පළමු සිසුන් 10 දෙනාගෙන් එක් සිසුවෙකු පමණක් තෝරා ගැනීම, අදාළ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ඔවුන් ලබා ගත් ඉසෙඩ් ලකුණු අනුපිළිවෙල අනුව හා ඔවුන්ගේ දෙමාපියන්ගේ වාර්ෂික ආදායම අදාළ විශ්වවිද්‍යාලය මගින් තහවුරු කර ගැනීමෙන් පසු සිදු කෙරේ.
ශිෂ්‍යත්ව ප්‍රදානය කළ සිසුන් සංඛ්‍යාව	2023 සිට ආරම්භ කිරීමට නියමිතය

වගුව **18.1.4.** **ඩබ්ලිව් පී හෙන්ද්‍රික් අප්පු අබේදීර ශිෂ්‍යත්ව වැඩසටහන**

ඉහත ශිෂ්‍යත්ව හැරුණු විට, අදාළ ආයතන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සහාය ඉල්ලා සිටින විට පහත ශිෂ්‍යත්ව සඳහා පහසුකම් සැලසේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අරමුදල් ගිණුම් පවත්වාගෙන නොයයි;

- සුජාතා ගුරුගේ ශිෂ්‍යත්ව වැඩසටහන
- ඩයලොග් තාක්ෂණ කුසලතා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය

19. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම

අධ්‍යයන කාර්ය මණ්ඩලයට විශේෂයෙන්ම තරුණ විද්‍යාර්ථීන්ට මෙරට මෙන් ම පිටරට උසස් අධ්‍යාපන අවස්ථා හිමිකර ගැනීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ පද්ධතිය තවදුරටත් පෝෂණය කිරීම සහ ශක්තිමත් කිරීම යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්තියට අනුකූලව යමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පර්යේෂණ හා අන්තර්ජාතික සහයෝගිතා අංශය මඟින් ඒ වෙනුවෙන් 2022 වසර තුළ දැඩි උත්සාහයක් දැරුවේය. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිදුකළ කාර්යයන් පහත පරිදි වේ;

19.1 උසස් අධ්‍යාපනය සඳහා ප්‍රදාන ලබා දීම

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය – 2022**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ හැකියාව ශක්තිමත් කිරීම මගින් ආචාර්ය මණ්ඩලයේ ස්ථිර සාමාජිකයින්ට සිය වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා මූල්‍යමය වශයෙන් සහයෝගය දැක්වීමයි.

  ප්‍රදාන ලබා දෙනු ලබන්නේ දේශීය/විදේශීය ආචාර්ය උපාධි සහ ආචාර්ය උපාධිය දක්වා වන දර්ශපති උපාධි හා ඊට සමාන අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණි.

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය මඟින් PhD/ආචාර්ය උපාධි අධ්‍යයන සඳහා උපරිම වශයෙන් වසර 03ක් සඳහා වන ප්‍රදාන සහ MPhil/ශාස්ත්‍රපති උපාධි සඳහා උපරිම වශයෙන් වසර 02ක් සඳහා වන ප්‍රදාන පමණක් සපයයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයේ සමස්ත ප්‍රදාන සීමාව, ආයතනික සහ ජීවන වියදම් යන දෙකම ඇතුළුව එක් අපේක්ෂකයෙකුට වසරකට රුපියල් මිලියන 2 කි. විදේශයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන සිදු කරන අපේක්ෂකයෙකුට ජීවන වියදම් සඳහා ලැබෙන ප්‍රදානයේ උපරිම සීමාව වසරකට රුපියල් මිලියන 1.5 ක් වේ. ජීවන වියදම් යටතේ, තනි අපේක්ෂකයෙකුට අදාළ වන සීමාව ඉහත දක්වා ඇති උපරිම සීමාව තුළ රට අනුව වෙනස් වේ.

  2022 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ සංශෝධනය කරන ලදී. කෙසේ වෙතත්, අරමුදල් ප්‍රමාණවත් නොවීම

හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ ප්‍රදාන 2022 දී ප්‍රදානය නොකළේය.

- **විදේශීය විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් සිදු කරන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම - 2022**

  i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව (GU) පූර්ණ / ඒකාබද්ධ ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන

  ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය (GU) සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විද්වත් අන්තර්ක්‍රියා, සංස්කෘතික හුවමාරුව, සහභාගී පර්යේෂණ සහ වෙනත් ආකාරයේ ශාස්ත්‍රීය සහයෝගීතාවයෙන් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමකට එළැඹෙන ලදී.

  ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම යටතේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසර 03ක් දක්වා වූ කාලසීමාවක් සඳහා සම්පූර්ණ පන්ති ගාස්තුව ආවරණය කරනු ලබන අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඕස්ට්‍රේලියාව සඳහා අනුමත කරන ලද සීමාවන් තුළ අපේක්ෂකයින්ට වසර 3 ක කාලයක් සඳහා ජීවන දීමනාවක් සහ විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණය (OSHC) ලබා දෙනු ඇත. ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසරකට ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව 12 ක් දක්වා ලබා දෙනු ඇත.

  ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය

  සියලුම පාර්ශ්වයන්ගේ අවසාන අනුමැතියට යටත්ව පහත සඳහන් විශ්වවිද්‍යාල හතරින් සහ අනෙකුත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලින් ඕනෑම එකකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහාය දක්වන අපේක්ෂකයින් සඳහා ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් අධීක්ෂණ විධිවිධාන ද දිරිමත් කරනු ලැබේ:

  - කොළඹ විශ්වවිද්‍යාලය
  - කැලණිය විශ්වවිද්‍යාලය
  - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
  - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

  මෙම යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂය තුළ ශිෂ්‍යත්ව හතරක් (04) ප්‍රදානය කරන ලදී.

  ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ (QUT) ඒකාබද්ධ / භින්න ආචාර්ය උපාධි වැඩසටහන

  ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයක් වන ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT), ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සමඟ අනුබද්ධ වෙමින් මුල් සහ මධ්‍ය මට්ටමේ සිටින ශ්‍රී ලාංකීය වෘත්තීය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ උසස් උපාධි පර්යේෂණ (HDR) වැඩසටහන් සහ පර්යේෂණ පුහුණුව සඳහා සහාය වීම සිදුකරයි. මෙම ක්‍රියාවලිය තුළ, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල දේශීය

අධ්‍යයන අධීක්ෂකවරුන් සමඟ ආචාර්ය උපාධි අධීක්ෂණය, පර්යේෂණ පුහුණුව සහ හවුල් අධීක්ෂණය ඇතුළු ඒකාබද්ධ පර්යේෂණ ප්‍රයත්නයන් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් ආචාර්ය උපාධි අපේක්ෂකයන් (වසර තුනක් දක්වා) සඳහා සම්පූර්ණ උපකාරක ගාස්තු අනුග්‍රහයක් (ආසන්න වශයෙන් AUD 100, 000 අගයක්) ලබා දෙනු ඇත.

වසරක් සඳහා ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සිදු කරන අතරතුර වියදම් පියවා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සුදුසුකම් අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලාංකික විද්වතුන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය සහාය ලබා දෙනු ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව අවශ්‍ය පරිදි ජීවන දීමනාවක්, විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණයක් (OSHC) සහ ඒ ආශ්‍රිත ආනුෂංගික වියදම් මෙම ආධාරයට ඇතුළත් වේ. උපරිම දීමනා සීමාව වසර 03ක් සඳහා එක් අපේක්ෂකයෙකුට රු. මිලියන 3.5ක් වේ.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල විවිධ විෂයයන් සඳහා අපේක්ෂකයින් 10 - 12 ක් ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මණ්ඩපයන් හි අවම වශයෙන් මාස 12 ක ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සිදු කරන අතර ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය මඟින් ආචාර්ය අධීක්ෂණ සමූහ ආකෘතියකට සහාය දක්වනු ලබයි.

පහත දැක්වෙන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමවල ආකෘති දෙකකි;

i. ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය

- ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගිතා ආචාර්ය උපාධි වැඩසටහන්වලට කොළඹ විශ්වවිද්‍යාලය (CMB), පේරාදෙණිය විශ්වවිද්‍යාලය (PDN) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (SJP) සමඟ එක්ව ආරම්භ කරන ලද ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය ඇතුළත් වේ.

- ඒකාබද්ධ ආචාර්ය උපාධි සිසුන් ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු, කොළඹ, පේරාදෙණිය හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවල එක් ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් සහ හැකි නම් අදාළ අපේක්ෂකයාගේ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් විසින් සම-අධීක්ෂණය සිදු කරනු ලැබේ.

ii. භින්න/ බාහිර ආචාර්ය උපාධි ආකෘතිය

භින්න ආචාර්ය උපාධි සිසුන්ට, ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධීක්ෂකවරුන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් ඕනෑම විශ්වවිද්‍යාලයක දේශීය අධීක්ෂකවරයෙකු සිටී .

මෙම යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂය තුළ ශිෂ්‍යත්ව දෙකක් (02) ප්‍රදානය කරන ලදී.

iii. ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය (IUJ) සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීමට සම අනුග්‍රහය සහිත ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් එකඟතා ලිපියට අනුව, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය පන්ති ගාස්තුවෙන් 50% අරමුදල් සපයනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පන්ති ගාස්තුවෙන් ඉතිරි 50% (ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු ලැබේ) සහ ජපාන යෙන් 90,000ක මාසික ජීවන දීමනාවක් සඳහා අරමුදල් සපයනු ඇත. අධ්‍යයන නිවාඩු මත විදේශගත වන අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගුවන් ගමන් සඳහා ගෙවනු ලබන ප්‍රදාන ද හිමිවනු ඇත.

19.2 විදේශ හවුල්කරුවන් සමඟ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU) /ගිවිසුම්

i. විදේශීය හවුල්කරුවන් සමඟ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU)/ ගිවිසුම් අත්සන් කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම

මෙය 2018.06.05 දිනැති ලිපි අංක UGC/CH/7/1, 2018.08.03 දිනැති ලිපි අංක UGC/S/PA/111, 2019.01.22 දිනැති UGC/S/PA/111 හා ඉහත විෂය සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2019.12.19 දිනැති අංක PS/SP/SB/Circular/06/2019 චක්‍රලේඛය හා බැඳේ.

ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සියලුම උපකුලපතිවරුන්ට දැනුම් දුන්නේ විදේශීය ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් (MoU) / ගිවිසුම්වලට එළඹීමට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සමඟ රේඛීය අමාත්‍යාංශයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවයි. තවද, විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත සියලුම අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අමාත්‍ය මණ්ඩලය හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට 2018.07.03 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි.

රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්/එකඟතා බොහොමයක් අප රටට බෙහෙවින් ප්‍රයෝජනවත් වන අතර අපගේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට, ඔවුන්ට අදාළ ක්ෂේත්‍ර/ උසස් අධ්‍යයනය පිළිබඳ ප්‍රවීණත්වය තවදුරටත් වර්ධනය කිරීම හෝ විදේශ රටවල පර්යේෂණ කටයුතු සිදු කිරීමට සඳහා ශිෂ්‍යත්ව/පර්යේෂණ ප්‍රදාන හෝ ඉගැන්වීම් අවස්ථා ලබා දීම මගින් විශ්වවිද්‍යාල පද්ධතියට විදේශ අරමුදල් අවස්ථා විශාල ප්‍රමාණයක් ලබා දෙනු ලැබේ. බොහෝ රාජ්‍ය විශ්වවිද්‍යාල

ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් විදේශීය ආයතන සමඟ ගැඹුරු සහයෝගීතාවයකට අවතීර්ණ වී ඇති අතර එමඟින් දැනුමේ ප්‍රගමනයට සහ ධාරිතා වර්ධනයට මග පාදයි. අවසානාවකට මෙන්, අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් අත්සන් කිරීමේදී අනුමැතිය ලබා ගැනීමේ දීර්ඝ ක්‍රියා පටිපාටිය හේතුවෙන් බොහෝ විශ්වවිද්‍යාල එවැනි දිගුකාලීන පර්යේෂණ සහයෝගීතාවයන් දිගටම කරගෙන යාමට අපොහොසත් වී ඇත. දැනට පවතින ක්‍රියා පටිපාටියට අනුමැතිය ලබා ගැනීමට සහ අත්සන් කිරීමට අවම වශයෙන් මාස 5-6ක් ගත වන බව නිරීක්ෂණය වී ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විදේශීය පාර්ශවයන් සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් අත්සන් කිරීමේදී අනෙකුත් අදාළ පාර්ශ්ව / පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීමට සහ අනුමැතිය ලබා ගැනීමේ පවතින ක්‍රියාදාමයන් සරල කිරීමට මූලික පියවර ගෙන ඇත.

ඒ අනුව, ඔබ විසින් මතු කරන ලද අනවශ්‍ය ප්‍රමාදයන් පිළිබඳ ගැටළු සලකා බලා, ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යමය හෝ වෙනත් බැඳීමක් නොමැති සහ අදාළ අධ්‍යයන ආයතන අතර පමණක් සහයෝගීතාව පවතින ශ්‍රී ලංකා සහ විදේශීය උසස් අධ්‍යයන ආයතන අතර අත්සන් කිරීමට නියමිත අවබෝධතා ගිවිසුම් / එකඟතාවලට එළඹීමට ඔබට හැකි බව අතිගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් දී ඇත, යනුවෙන් සඳහන් කරමින් "රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU) / එකඟතා අත්සන් කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම" යනුවෙන් 2022 මැයි 27 වැනි දින අංක PS/M&E – 3/04/04 දරන ලිපිය ජනාධිපති අතිරේක ලේකම්වරයා විසින් නිකුත් කරන ලදී. තවද, ඉහත සඳහන් චක්‍රලේඛය ඒ අනුව සංශෝධනය කිරීමට මෙම කාර්යාලය මගින් කටයුතු කරනු ඇත.

ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථය යටතේ ඇති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත ද එය දැනුම් දෙන ලදී.

20. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්ථාපිත කර ඇත. ඒ අනුව 1999 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන් සඳහා දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ලෙස විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කර ඇත. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ පාලනය, සාමාන්‍යයෙන් භාවිතා කරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ රාමුවට අමතරව ආයෝජන කමිටුව, අධීක්ෂණ මණ්ඩලය සහ කොමිෂන් සභාව මගින් ශක්තිමත් කර ඇත.


අවුරුදු 20ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති සහ අනිවාර්ය විශ්‍රාම යන වයස දක්වා සේවය කළ සේවකයින්, ජීවිත කාලය පුරාම මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි. විශ්‍රාමිකයෙකු මිය ගිය විට විශ්‍රාම වැටුපෙන් 50% වැන්දඹුව/වැන්දඹු පුරුෂයා වෙත ගෙවනු ලබන අතර අනෙක් 50% සමානව බෙදා දරුවන්ට වයස අවුරුදු 18 වන තෙක් ගෙවනු ලැබේ. වසර 20ක සේවා කාලයක් සම්පූර්ණ නොකළ සේවකයකුගේ, විශ්‍රාම මුදල හා පොලීය ඔහු/ඇය විශ්‍රාම යන අවස්ථාවේදී ආපසු ගෙවනු ලැබේ.

20.3. ප්‍රධාන මූල්‍ය තොරතුරු


		2018	2019	2020	2021	2022
1	සාමාජිකයන්					
	ක්‍රියාකාරී සාමාජිකයන්	13,945	14,922	15,211	16,062	16,191
	අක්‍රිය සාමාජිකයන්	1,928	2,025	2,023	2,139	2,420
	මුළු සාමාජිකයන් ගණන	15,873	16,947	17,234	18,201	18,611
2	මුළු සාමාජිකත්වය	19,733	21,275	21,951	23,449	24,467
3	විශ්‍රාම වැටුප් ලබන සාමාජිකයන් ගණන	279	314	351	402	449
4	එකවර මුදල් ආපසු ගෙවන සාමාජිකයන් ගණන	965	1,082	1,186	1 ,287	1,469
3	අරමුදලේ ශේෂය (රු.මි)					
	දායකයින්ගේ අරමුදල	8,722	10,906	13,473	16,238	19,559
	විශ්‍රාමිකයන්ගේ අරමුදල සහ සංචිත	744	815	855	914	1,189
	මුළු අරමුදල (රු. මිලියන)	9,466	11,721	14,328	17,152	20,748
	අරමුදලේ වර්ධනය %	22%	24%	22%	19.71%	21%
4	මුළු ආයෝජනය (රු.මි)	9,078	11,060	13,347	15,967	19,059
5	මුළු ආයෝජන ආදායම (රු.මි)	924	1,168	1,333	1,444	2,300
6	ආදායම් බදු (රු.මි)	138	166	190	206	320
7	ආයෝජන මත ප්‍රතිලාභ (%)	10.18%	10.56%	9.98%	9.05%	12.07%
8	සාමාජිකයන්ට ප්‍රකාශිත පොලිය	10%	10%	9.6%	8.4%	10%
9	විශ්‍රාම වැටුප් ගෙවීම් (රු.මි)	58	75	93	107	145
10	විශ්‍රාම වැටුප් ගෙවීමේ වර්ධනය (%)	14%	29%	24%	15%	21%
11	ස්ථීර තැම්පතු, භාණ්ඩාගාර බැඳුම්කර, ණයකරවල පස් අවුරුදු සාමාන්‍ය පොලී අනුපාතය (බදුවලින් පසු)	-	-	-	-	9.57%


වගුව 20.1 විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රධාන මූල්‍ය තොරතුරු

වසර 2018 සිට 2022 දක්වා කාලය සඳහා අරමුදල් වර්ධනය




2018 සිට 2022 දක්වා කාලසීමාව සඳහා මාසික විශ්‍රාම වැටුප් ගෙවීම්






වසර 2018 සිට 2022 දක්වා කාලය සඳහා ආයෝජන ආදායම




20.2 2022.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

	2021/12/31		2022/12/31	
	කල්පිරීමේදී අගය (මි.රු)	කොටස (%)	කල්පිරීමේදී අගය (මි.රු)	කොටස (%)
භාණ්ඩාගාර බැදුම්කර / බිල්පත් භාණ්ඩාගාර	7,112.14	44.54	11,899.45	59.51
ස්ථාවර තැන්පතු	4,911.36	30.76	3,830.00	19.16
ණයකර	3,900.00	24.42	4,230.00	21.16
කෙටි කාලින හා රාත්‍රී කාලීන	43.95	0.28	34.73	0.17
එකතුව	**15,967.45**	**100.00**	**19,994 .18**	**100.00**

වගුව 20.2 2022.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල





20.3 විශ්‍රාම වැටුප් අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද අනුපාත

කාලය		විශ්‍රාම වැටුප් අරමුදල විසින් ප්‍රකාශිත අනුපාත (බදුවලින් පසු) (%)	පසුගිය වසර පහක සාමාන්‍ය පොලී අනුපාත බදුවලින්) (පසු
2018	ජනවාරි සිට දෙසැම්බර් දක්වා	10.00%	8.58%
2019	ජනවාරි සිට ජූනි දක්වා	10.30%	8.34%
	ජූලි සිට දෙසැම්බර් දක්වා	10.00%	
2020	ජනවාරි සිට ජූනි දක්වා	10.00%	8.51%
	ජූලි සිට දෙසැම්බර් දක්වා	9.60%	
2021	ජනවාරි සිට දෙසැම්බර් දක්වා	8.40%	8.25%
2022	ජනවාරි සිට ජූනි දක්වා	9.00%	7.58%
	ජූලි සිට දෙසැම්බර් දක්වා	10.00%	

වගුව 20.3 විශ්‍රාම වැටුප් අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද අනුපාත

මූලාශ්‍රය:

- https://www.cbsl.lk/eResearch/Modules/RD/SearchPages/CMB_LendingAndDeposit.aspx.
- https://www.cbsl.lk/eResearch/Modules/RD/SearchPages/Indicators_GovernmentSecurities.aspx

21. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල


1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත යටතේ "විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල" පිහිටුවනු ලැබූ අතර එක් එක් විශ්වවිද්‍යාල තම සේවකයන් සඳහා වෙන් වෙන් වශයෙන් අර්ථසාධක අරමුදල පවත්වාගෙන ගියේය. 1972 දී 1972 අංක 01 දරන ලංකා විශ්වවිද්‍යාල පනත මගින් "විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල" මධ්‍යගත කරන ලදී. ඒ අනුව, සෙනෙට් සභාව ඒකාබද්ධ කරන ලද "අර්ථසාධක අරමුදල" පවත්වාගෙන යන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 1978 දී පිහිටුවන ලද අතර ඒ අනුව "විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල" පිහිටුවන ලදී.


21.1 මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය– විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල


		දින වන විට	2018	2019	2020	2021	2022
1.	**සාමාජිකයන්**						
	ක්‍රියාකාරී සාමාජික ගිණුම්	දෙසැ.31	21,363	22,172	22,318	23,046	23,349
			1,739,269,871	**1,225,897,453**
ඉදිරියට ගෙන ගිය රඳවා ගත් ලාභය			**724,712,937**	**496,273,155**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. NAD/A/ PNF/FA/2022 මගේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි 18 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-
1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/PNF/FA/2022 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි 15 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්ඝන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය හා අංක 03/2022 දරන 2022 පෙබරවාරි 07 දිනැති කොමිෂන් සභා වක්‍රලේඛය දායකයාගේ ගිණුම අවසන් කර මාස 03 ක් ඇතුලත ඔහුගේ විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතු වුවද අවස්ථා දෙකකදී මාස 02 ක් හා මාස 07 ක් ප්‍රමාද වී ගෙවීම් කර තිබීම නිසා ප්‍රමාද කාලය සඳහා විශ්‍රාම වැටුප් අරමුදලින් රු.27,260 ක් වැඩියෙන් ගෙවීමට සිදුවී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

<u>විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ගෙන ඇති පියවර.</u>

3. මෙහෙයුම් සමාලෝචනය

3. 1 නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය හා අංක 03/2022 දරන 2022 පෙබරවාරි 07 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛය දායකයාගේ ගිණුම අවසන් කර මාස 03ක් ඇතුලත ඔහුගේ විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතු වුවද, අවස්ථා දෙකකදී මාස 02ක් හා මාස 07ක් ප්‍රමාද වී ගෙවීම් කර තිබීම නිසා ප්‍රමාද කාලය සඳහා විශ්‍රාම වැටුප් අරමුදලින් රු. 27,260 ක් වැඩියෙන් ගෙවීමට සිදු වීම.

පිළිතුර:-

එම රු. 27,260/- ක ගෙවීම වැඩියෙන් ගෙවීමක් නොව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 92(3) වගන්තිය හා අංක 03/2022 දරන 2022 පෙබරවාරි 07 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූල ගෙවීමක් වේ.

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන


2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන අංකය	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන වත්කම්	06	302,060,542	76,144,214
ලැබිය යුතු පොළිය	07	5,374,162,634	1,991,690,268
ලැබිය යුතු දායක මුදල්	08	212,477,601	211,190,152
ලැබිය යුතු අර්ථසාධක ණය චාරික	09	35,224,961	30,860,266
ලැබිය යුතු අර්ථසාධක ණය	14	1,265,997,652	1,462,808,971
ආයෝජන	13	13,756,945,688	12,489,607,333
වෙනත් අත්තිකාරම් හා කලින් ගෙවීම්	10	268,712	486,611
තොග		438,274	107,612
මුළු ජංගම වත්කම්		20,947,576,064	16,262,895,427
ජංගම නොවන වත්කම්			
ලැබිය යුතු පොළිය	07	-	2,135,210,959
දේපළ , පිරියත හා උපකරණ	11	5,407,856	15,467
අස්පෘශ්‍ය වත්කම්	12	235,311	720,623
දිගුකාලීන ආයෝජන	13	42,684,425,600	39,500,907,720
අර්ථසාධක ණය	14	9,559,162,280	6,252,393,294
මුළු ජංගම නොවන වත්කම්		52,249,231,048	47,889,248,063
මුළු වත්කම්		**73,196,807,111**	**64,152,143,490**
වගකීම්			
ජංගම වගකීම්			
මුදල් හා මුදල් සමාන දෑ	06	103,512,872	88,203,527
ගෙවිය යුතු ණය	15	186,274,821	-
විවිධ ණයහිමියෝ	16	3,488,241	35,624,314
ගෙවිය යුතු ජීවන වියදම් දීමනා හිඟ දායක මුදල්		43,182,641	43,575,020
ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ	17	50,732,906	49,903,091
ගෙවිය යුතු බදු	18	1,004,352,835	748,455,782
මුළු වත්මන් වගකීම්		1,391,544,316	965,761,734
මුළු ශුද්ධ වත්කම්		**71,805,262,795**	**63,186,381,755**

ශුද්ධ වත්කම් / ස්කන්ධය

සාමාජික ගිණුම් ශේෂය - ක්‍රියාකාරී	19	71,057,499,025	62,988,316,953
සාමාජික ගිණුම් ශේෂය - අක්‍රිය	20	38,094,733	38,134,412
අක්‍රිය ගිණුම් සඳහා වෙන්කිරීම්		8,000,000	8,000,000
ඉල්ලුම් නොකල ප්‍රතිලාභ සංචිත		6,997,078	6,997,078
ඉදිරියට ගෙනා රඳවාගත් ලාභය		694,671,959	144,933,312
මුළු ශුද්ධ වත්කම්		**71,805,262,795**	**63,186,381,755**

පිටු 06 සිට 09 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 10 සිට 27 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ. 2023 පෙබරවාරි 27 වැනි දින පැවති විශේෂ රැස්වීමේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.




උබයකුල රණවීර
ගණකාධිකාරී



ඩී.එල්.ඩී. ජයන්ත
වැඩ බලන ලේකම්



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.කේ.ඩබ්ලිව් ජයවර්ධන
කොමිෂන් සභා සාමාජික

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය	**2022** **රු.**	**2021** **රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය		
බදු සහ වියදම් වලට පසුව ශුද්ධ ලාභය	6,015,429,579	4,225,026,102
ගැලපීම්		
මුදල් නොවන ගනුදෙනු		
භාණ්ඩාගාර බිල්පත් අව මිල/අධි මිල	20,598,514	90,488,260
වර්ෂයේ ක්ෂය	164,270	11,600
කපාහැරීම්	485,311	485,311
ආදායම් බදු	983,491,335	703,414,046
මෙහෙයුම් අතිරික්තය	7,020,169,010	5,019,425,320
තොග වෙනස්වීම	(330,663)	(79,500)
ලැබිය යුතු ආයෝජන ආදායම් වෙනස්වීම	(1,247,261,406)	(703,354,261)
වෙනත් අත්තිකාරම් හා කලින් ගෙවීම් වෙනස්වීම	217,899	(123,811)
ලැබිය යුතු ණය වාරික වෙනස්වීම	(4,364,695)	4,728,427
ගෙවිය යුතු ජීවන වියදම් දීමනා වෙනස්වීම	(392,379)	(2,274,398)
විවිධ ණයහිමියන්ගේ වෙනස්වීම	(32,136,073)	33,579,818
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්	5,735,901,692	4,351,901,595
වර්ෂය තුල ගෙවන ලද ආදායම් බදු	(727,594,282)	(605,205,872)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**5,008,307,410**	**3,746,695,723**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම	(5,556,659)	-
ස්ථාවර තැන්පතු කල්පිරීම්	17,294,882,009	9,580,049,064
ස්ථාවර තැන්පතු ආයෝජන	(11,620,000,000)	(10,844,882,009)
භාණ්ඩාගාර බැඳුම්කර විකිණීම/කල්පිරීම	393,000,000	50,000,000
ණයකර විකිණීම/කල්පිරීම	-	1,595,366,700
ණයකර මිලට ගැනීම	(170,000,000)	(3,300,000,000)
භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීම	(9,747,679,559)	(3,577,015,970)
භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම	(1,552,974,200)	-
භාණ්ඩාගාර බිල්පත් විකිණීම/කල්පිරීම	931,317,000	-
අර්ථසාධක ණය ලබා දීම් හා පියවීම්	(2,923,682,845)	(283,639,572)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(7,400,694,255)**	**(6,780,121,787)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
සාමාජික මුදල් ලැබීම්	6,347,808,222	6,159,907,301
සාමාජික මුදල් ගෙවීම්	(3,744,814,395)	(3,293,163,961)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,602,993,826**	**2,866,743,340**
මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම	**210,606,982**	**(166,682,724)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වත්කම්	(12,059,313)	154,623,411
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන වත්කම්	**198,547,669**	**(12,059,313)**
මුදල් හා මුදල් සමාන වත්කම්:		
මුදල් සහ බැංකු ශේෂය (සටහන අංක: 06)	**198,547,669**	**(12,059,313)**

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

(රුපියල්)

	සාමාජික ශේෂය ක්‍රියාකාරී	සාමාජික ශේෂය අක්‍රිය	අක්‍රිය සාමාජික ගිණුම් සඳහා වෙන් කිරීම්	ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත	රඳවා ගන්නා ලද ලාභ	මුළු ශුද්ධ වත්කම්
2021.01.01දිනට ශේෂය (ප්‍රති ප්‍රකාශිත)	56,020,836,691	38,153,592	8,000,000	6,993,398	64,394,361	56,138,378,042
වර්ෂයට අදාල සාමාජික මුදල්	6,132,431,980	-	-	-	-	6,132,431,980
සාමාජික පොළී	4,195,276,550	-	-	-	(4,195,276,550)	-
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී	-	-	926,873	-	(926,873)	-
සාමාජික මුදල් නැවත ගෙවීම්	(3,293,260,404)	-	-	-	-	(3,293,260,404)
සප්ත වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම්	(16,193,966)	-	-	-	-	(16,193,966)
ගැළපිලි	(50,773,898)	(19,180)	(926,873)	3,680	51,716,271	-
2021 වර්ෂයේ අතිරික්තය (ප්‍රති ප්‍රකාශිත)	-	-	-	-	4,225,026,102	4,225,026,102
2022.01.01 දිනට ශේෂය	**62,988,316,953**	**38,134,412**	**8,000,000**	**6,997,078**	**144,933,312**	**63,186,381,755**
වර්ෂයට අදාල සාමාජික මුදල්	6,381,480,119	-	-	-	-	6,381,480,119
සාමාජික පොළී	5,518,371,852	-	-	-	(5,518,371,852)	-
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී	-	-	2,081,868	-	(2,081,868)	-
සාමාජික මුදල් නැවත ගෙවීම්	(3,745,644,210)	-	-	-	-	(3,745,644,210)
සප්ත වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම්	(32,384,449)	-	-	-	-	(32,384,449)
ගැළපිලි	(52,641,241)	(39,679)	(2,081,868)	-	54,762,788	-
2021 වර්ෂයේ අතිරික්තය	-	-	-	-	6,015,429,579	6,015,429,579
2022.12.31 දිනට ශේෂය	**71,057,499,025**	**38,094,733**	**8,000,000**	**6,997,078**	**694,671,959**	**71,805,262,796**

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන අංක	2022 රු.	2021 රු.
ආදායම්			
ආයෝජන ආදායම්	21	7,004,339,594	4,932,068,135
අඩුකලා : මෙහෙයුම් වියදම්	22	(5,418,680)	(3,627,986)
බදු පෙර ශුද්ධ ආදායම		**6,998,920,914**	**4,928,440,149**
අඩුකලා : ආදායම් බදු	18	(983,491,335)	703,414,046)
බදු පසු ශුද්ධ ආදායම		**6,015,429,579**	**4,225,026,102**
ආදායමට ගැලපීම්		54,762,788	51,716,271
පසුගිය වසරේ රඳවාගත් ලාභය		144,933,312	64,394,361
බෙදාහැරීම සඳහා ශුද්ධ ලාභය		**6,215,125,680**	**4,341,136,734**
සාමාජික ගිණුම් සඳහා පොළිය		(5,518,371,852)	(4,195,276,550)
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළිය		(2,081,868)	(926,873)
ඉදිරියට ගෙන යන රඳවාගත් ලාභ		**694,671,959**	**144,933,312**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/UPF/FA/2022

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 17 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.හොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-
1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/UPF/FA/2022 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි 12 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය හා 2022 පෙබරවාරි 07 දිනැති අංක 03/2022 දරන කොමිෂන් සභා වක්‍රලේඛය අනුව දායකයාගේ ගිණුම අවසන් කර මාස 03 ක් තුළ ඔහුගේ අර්ථසාධක අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතුය. එහෙත් අවස්ථා 84 ක දී මාස 01 සිට මාස 354 ක් දක්වා කාලයක් ප්‍රමාද වී ගෙවීම් කර තිබීම නිසා එම කාලය සඳහා රු.30,968,567 ක පොලියක්ද දායකයින් වෙත ගෙවා තිබුණි

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති කරුණු පිලිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපදන කොමිෂන් සභාව ගෙන ඇති පියවර

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය හා 2022 පෙබරවාරි 07 දිනැති අංක 03/2022 දරන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව දායකයාගේ ගිණුම අවසන් කර මාස 03 ක් තුල ඔහුගේ අර්ථසාධක අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතුය.එහෙත් අවස්ථා 84 ක දී මාස 01 සිට මාස 354 දක්වා කාලයක් ප්‍රමාද වී ගෙවීම් කර තිබීම නිසා එම කාලය සඳහා රු.30,968,567 ක පොලියක්ද දායකයන් වෙත ගෙවා තිබුණි.

පිළිතුර;

විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තියට අනුව අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී සේවකයාගේ බැරට ඇති ශේෂයට අදාළව කිසිම අමතර පොළියක් දායකයින් වෙත ගෙවා නැත. අදාළ සියලුම පොළී ගණනය කිරීම 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තියට අනුව සිදු කර ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව

2022

තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව - 2022

වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2017 අවශ්‍ය මාර්ගෝපදේශ හා මඟ පෙන්වීම් සපයනු ලබයි.

අයවැය ක්‍රියාවලිය සඳහා හඳුන්වාදෙන මධ්‍ය කාලීන ඉදිරි දැක්ම තුළින් වඩාත් උපායමාර්ගිකව රජයේ ප්‍රමුඛතාවලට ප්‍රතිචාර දැක්විය හැකි බව ද එහි සඳහන් වේ. ඒ අනුව, අයවැය ක්‍රියාවලිය මඟින් ඇස්තමේන්තුගත සම්පත් ලබා ගැනීම; මධ්‍ය කාලීන සැලසුම, සාර්ව මූල්‍ය රාමුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රමුඛතා මාවත ඔස්සේ සම්බන්ධ කළ හැකි අතර මෙයින් අයවැය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා සමඟ අයවැය ප්‍රතිපාදන යථා තත්ත්වයට පත් කිරීම සිදු කළ හැකිය.

මේ අතර, අයවැය සැකසීමේ පුළුල් ඉදිරිදැක්මට ඇතුළත් වන්නේ, 2015 දී එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් සම්මත කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක ලැයිස්තුවට අදාළ, 2030 වන විට සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කළ යුතු ආකාරයයි.

තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් ඇති අතර, එයින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා වඩාත්ම අදාළ ඉලක්කය වන්නේ අංක 4 - ගුණාත්මක අධ්‍යාපනයයි. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තිරසාර සංවර්ධන ඉලක්ක අංක 4 ට අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2019-2023 උපායමාර්ගික සැලැස්මේ හඳුනාගත් ඉලක්ක පෙළගස්වා ඇති අතර ප්‍රධාන අංශ පහක් යටතේ වෙනස්කම් සිදු කළ යුතු බවට ද හඳුනාගෙන ඇත;

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම.
- 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා අවශ්‍ය සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මඟින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප වලින් සමන්විත වැඩිදියුණු කළ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහතික කිරීම.
- ආරක්ෂිත, ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශ්වකරුවන්ගේ සබඳතා තුළින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

ඒ අනුව, රටේ අපේක්ෂාවන් හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කරගත් ආර්ථිකයක් තුළ මානව අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සමඟ තිරසාර සංවර්ධන ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහිත ආයතනික අරමුණු මෙහිදී සැලකිල්ලට ගන්නා ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 01:** රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම.	1. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂක අධ්‍යයන වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල බඳවාගැනීම් තුළ 15%ක සමුච්චිත වර්ධන වේගයක් (CGR) ලබා ගැනීම.	පවතින අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම 10,000 කින් වැඩි කිරීම. ඉහළ වෙළඳපල ඉල්ලුමක් ඇති දැනට පවතින අධ්‍යයන පාඨමාලා සඳහා බඳවා ගැනීම් 5% කින් වැඩි කිරීම ශ්‍රම වෙළඳපොළේ ඉල්ලීම් මත පදනම්ව නව අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම සහ හඳුන්වා දීම	- රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන් (පවත්නා සහ නව යන දෙකම) සඳහා උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීමේ ප්‍රතිශතය වැඩි වීම.
		2. උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය මාස දෙකකින් අඩු කිරීම.	උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ උසස් අධ්‍යාපන ආයතනවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය අඩු කිරීම.	- උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය මාස 2ක් වැනි අඩු කාල පරාසයක් පවත්වා ගැනීම.
		3. දැනට පවතින අඩු ඉල්ලුමක් සහිත උපාධි (UG) පාඨමාලා, විභවය සහිත සිසුන් අතර ප්‍රවර්ධනය කිරීම.	උසස් අධ්‍යාපන ආයතනවල පුරප්පාඩු ගණන අඩු කිරීම.	- සෑම වසරකම අඩුම ඉල්ලුමක් සහිත යුනිකෝඩ් සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩි කිරීම. - අවම ඉල්ලුමක් ඇති පාඨමාලා ඇතුළුව විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලාවල පුරප්පාඩු ප්‍රතිශතය අඩු කිරීම.
		4. ඉදිරි වසර 5 තුළ දැනට පවතින උපාධි අධ්‍යයන පාඨමාලා වල පුරප්පාඩු සංඛ්‍යාව 25% කින් අඩු කිරීම.		- අවම ඉල්ලුමක් ඇති පාඨමාලා ඇතුළුව විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලාවල පුරප්පාඩු ප්‍රතිශතය අඩු කිරීම.

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		5. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් සහිතව ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව 8% කින් වැඩි කිරීම.	අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට අදාළ විය හැකි නව දේවල් ඉගෙන ගැනීමට සහ හවුල්කාරිත්වයන් ගොඩනැගීම සඳහා විදේශීය විශ්වවිද්‍යාල සමඟ සබඳතා ශක්තිමත් කිරීම.	- පවතින ඉල්ලුම සමඟ උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගන්නා විදේශීය සුදුසුකම් ලත් සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩිවීම. - ලොව පුරා සිටින හැකියාවන් සහිත අපේක්ෂකයින් අතර විදේශීය බඳවා ගැනීම් ප්‍රවර්ධනය කිරීමට ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. - පූර්ව ඉල්ලුමක් නොමැති එහෙත් විදේශීය අයදුම්පත් ලැබුණු උපාධි පාඨමාලා සංඛ්‍යාව.
			ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ අධ්‍යයන වැඩසටහන් විදේශ රටවල් තුළ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ අධ්‍යයන පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් ඇති සිසුන් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම.	
			විදේශීය බඳවා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම	
		6. රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන සුදුසුකම් ලත් සිසුන්ට පහසුකම් සැලසෙන විශේෂිත කර්මාන්ත ඉලක්ක කරගත් සහ තත්ත්ව නියාමනය කරන ලද බාහිර උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීම.	බාහිර උපාධි සම්බන්ධයෙන් වූ තත්ත්ව ආරක්ෂණ අත්පොත පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලය ඇතුළු සියලුම විශ්වවිද්‍යාල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	- රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන අය වෙනුවෙන් විශේෂයෙන් නිර්මාණය කරන ලද බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන්ගේ ප්‍රතිශතය.
			UGC නියෝගවලට අනුකූලව සියලුම විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල බාහිර උපාධි වැඩසටහන් සහ ව්‍යාප්ති පාඨමාලාවල ප්‍රමිතීන් සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට එම ආයතන මෙහෙය වීම.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			බාහිර උපාධි ස්ථාවර කමිටුව හරහා UGC නියෝග සමඟ විවෘත සහ දුරස්ථ ඉගෙනීම් ක්‍රමවේදය හරහා සියලුම විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන බාහිර අධ්‍යයන වැඩසටහන් අඛණ්ඩව සමාලෝචනය කිරීම.	
			බාහිර විභාග අංශ තුළ පාලන සහ කළමනාකරණ ක්‍රියා පටිපාටි අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට සියලුම විශ්වවිද්‍යාල මෙහෙය වීම.	
			කණ්ඩායම් වැඩ, රැස්වීම් සහ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම.	
		7. රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන සිසුන් සඳහා, රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන සහ UGC පිළිගත් ආයතන හරහා ලබා දෙන UGC අනුමත උපාධි පාඨමාලා හරහා 2023 වන විට තවත් උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.	අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 18ක් පීඨ ලෙස උසස් කිරීමට සහ ඊට අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පහසුකම් සැලසීම.	- විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන UGC අනුමත උපාධි වැඩසටහන් ලබා දීම සඳහා UGC පිළිගත් ආයතන පිහිටුවීම.
			උසස් අධ්‍යාපන ආයතනවලට යටිතල පහසුකම් සහ මානව සම්පත් සපයමින් සිසුන් ඇතුළත් කිරීම වැඩි කිරීම.	
			සමුද්‍ර සේවා ක්ෂේත්‍රයේ උපාධි පිරිනැමීමට පුද්ගලික ආයතන ප්‍රතීතනය කිරීමට පහසුකම් සැලසීම සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			පෞද්ගලික ආයතනවලට ගුවන් සේවා ක්ෂේත්‍රයේ උපාධි පිරිනැමීමට ප්‍රතිනතය කිරීමට සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීමට පහසුකම් සැලසීම.	
			ඩිප්ලෝමා පාඨමාලා ප්‍රදානය කිරීම සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතන 10ක් පිහිටුවීම.	
			හෙද විද්‍යාල උපාධි පිරිනැමීමේ මට්ටමට උසස් කිරීමට පහසුකම් සැලසීම.	
			ජනමාධ්‍ය සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමට පහසුකම් සැලසීම සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම.	
			උපදේශන කමිටුවක් හරහා විශ්වවිද්‍යාල ව්‍යාප්ති යෝජනාව පිළිබඳ අවසන් තීරණයක් ගැනීම.	
			අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීම.	
			අවශ්‍ය සම්පත් සුරක්ෂිත කිරීම.	
			අදාළ ජනාධිපති කාර්ය සාධක බළකාය විසින් නිර්දේශ කරන පරිදි හෙද විද්‍යාල උපාධි පිරිනමන ආයතන දක්වා උසස් කිරීමට අදාළ ක්‍රියාකාරකම්.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			අදාළ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිර්දේශ කර ඇති පරිදි, ක්‍රීඩා අධ්‍යාපනය සඳහා කැප වූ උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට අදාළ ක්‍රියාකාරකම්.	
		8. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලාවලට බඳවා ගැනීමේදී 30% ක සමුච්චිත වර්ධන වේගයක් සඳහා පහසුකම් සැලසීම.	ශ්‍රම වෙලඳපොල නිරීක්ෂණයන් තුළින් ලැබෙන ප්‍රක්ෂේපන මත පදනම්ව, නැගී එන වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ නව පශ්චාත් උපාධි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.	- වසරකට අනුමත කරන නව සහ අදාළ පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව.
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 02:** 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා අවශ්‍ය සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මඟින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.	1. අවශ්‍ය අරමුදල් වෙන් කිරීම තුළින් 2023 වන විට එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාලවල විනෝදාත්මක හා සංස්කෘතික පහසුකම් සහ සෞන්දර්යාත්මක පරිසරය වැඩිදියුණු කිරීම.	UGC හි ප්‍රධාන රැස්වීම් කාමරයේ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය පද්ධතිය නැවත සකස් කිරීම.	- එකතු කරන ලද / වැඩිදියුණු කළ විනෝදාත්මක / සංස්කෘතික පහසුකම් සහ / හෝ වඩා හොඳ සෞන්දර්යාත්මක පරිසරයක් සහිත රාජ්‍ය විශ්වවිද්‍යාල සංඛ්‍යාව
			UGC පරිශ්‍රයේ නව දුරකතන පද්ධතියක් (PABX) සැපයීම සහ ස්ථාපනය කිරීම.	
			UGC හි LAN පද්ධතියේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.	
			විශ්වවිද්‍යාලයන්හි සම්පත් භාවිතය සහ පවතින සම්පත් පිළිබඳ සමීක්ෂණය.	
			රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම.	
			රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ ලැප්ටොප් පරිගණක සැපයීම.	
		2. විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ ඉගෙනුම් පරිසරය සඳහා අවශ්‍ය භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම	ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය සහ සමාලෝචනය	- රාජ්‍ය උසස් අධ්‍යයන ආයතන සඳහා වාර්ෂික අයවැයේ ප්‍රතිශතය වැඩිවීම.
			යටිතල පහසුකම් අවශ්‍යතා සමාලෝචනය කර විශ්ලේෂණය කිරීම	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		3. සියලුම විශ්වවිද්‍යාල සිසුන් සඳහා සාධාරණ සම්පත් ප්‍රවේශයක් ලබාදීම සඳහා වන මූලික පියවර හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.	විශ්වවිද්‍යාලයන් හි සම්පත් භාවිතය සහ සම්පත් ලබා ගැනීම පිළිබඳ සමීක්ෂණය රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම	- සම්පත් ලබා ගැනීමේ/භාවිත කිරීමේ සමීක්ෂණයක් සාර්ථකව නිම කරන ලද රාජ්‍ය විශ්ව විද්‍යාල සංඛ්‍යාව. - විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සම්පත් සැලැස්මේ ඉඹ ලකුණු සලකුණු කිරීම.
		4. උසස් අධ්‍යාපන ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් කාලෝචිත අරමුදල් ගලායාම වැඩිදියුණු කිරීම.	වාර්ෂික අයවැය සඳහා අනුමැතිය UGC සඳහා මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය හඳුන්වා දීම	- වසරකට පවත්වනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව. - වසරකට උසස් අධ්‍යාපන ආයතන වෙත සිදු කරන ක්ෂේත්‍ර වාරිකා ගණන. - වසරක් තුළ භාණ්ඩාගාරය / උසස් අධ්‍යාපන අමාත්‍යාංශය / කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන වාර්තා සංඛ්‍යාව - වසරක් තුළ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විශ්වවිද්‍යාල මූල්‍යකරණය පිළිබඳ ප්‍රගති වාර්තා සංඛ්‍යාව
		5. අභිරුචිකරණය කරන ලද මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියක් (FMIS) හඳුන්වා දීමෙන් මූල්‍ය කාර්යයන් උපාය මාර්ගික කළමනාකරණයට පහසුකම් සැලසීම.	ශක්තිමත් කරන ලද ලේඛන කළමනාකරණ පද්ධතිය මූල්‍ය අංශය 5 S ක්‍රමය අනුව සකස් කිරීම.	- UGC හි මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියක් (FMIS) තිබීම.

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 03:** ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.	1. වැඩසටහන්වල අදාලත්වය සහතික කිරීම සහ වෙළඳපොළ ඉල්ලුමට ගැලපෙන පරිදි නව අධ්‍යයන පාඨමාලා සංවර්ධනය කිරීම සහ දැනට පවතින පාඨමාලාවල විෂයමාලාවන් සංශෝධනය කිරීම.	ශ්‍රම වෙළෙඳපොළ නිරීක්ෂණ අනුව දැනට පවතින අධ්‍යයන පාඨමාලා සංශෝධනය කිරීම.	- වෙළඳපොළ ඉල්ලුම් ප්‍රවණතා සපුරාලීමට අනුමත කරන ලද, නව වෙනස්කම් කරන ලද උපාධි පාඨමාලා ප්‍රතිශතය. - ඉල්ලුම වැඩි දියුණු කිරීම සහ වෙළඳපල අදාළත්වය සහතික කිරීම සඳහා දැනට පවතින සංශෝධනය කර ඇති අධ්‍යයන පාඨමාලා සංඛ්‍යාව.
			ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුම මත පදනම්ව නව අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම සහ හඳුන්වා දීම.	
			නව සහ පවතින උපාධි පාඨමාලා සඳහා වන යෝජනාවල ගුණාත්මකභාවය පිළිබඳ වාර්තාව.	
			නව උපාධි වැඩසටහන්, අධ්‍යයනාංශ සහ පීඨ අනුමත කිරීම සඳහා UGC හි මාර්ගගත ක්‍රමය අනුගමනය කිරීමට පහසුකම් සැලසීම.	
		2. උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාධි වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම දෙක හඳුන්වා දීම.	උපාධි පාඨමාලා බෙදාහැරීමේ ක්‍රමවලට අදාළ උසස් අධ්‍යාපන ආයතනයන් හි වර්තමාන තත්ත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.	- පාර්ශ්වීය ප්‍රවේශ / ඉගෙනුම් අධ්‍යයන සම්භාර පැවරුම් ප්‍රතිපාදන අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා ගණන
			පාර්ශ්වීය ප්‍රවේශ (lateral entry) සහ පෙර ඉගෙනුම් අධ්‍යයන සම්භාර හුවමාරුව හඳුනාගැනීම සඳහා මාර්ගෝපදේශ.	
			උසස් අධ්‍යාපනයට ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාධි වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම දෙක හඳුන්වා දීම.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		3. උපාධි අපේක්ෂක සිසුන්ගේ පුද්ගලික සහ අවශ්‍ය කුසලතා සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක (CGU) හරහා ව්‍යුහගත සැලසුම් ක්‍රියාත්මක කිරීම.	විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ ඒකකවල කාර්ය සාධනය බැලීමට ලකුණු කාඩ්පත් පද්ධතිය සකස් කිරීම. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුහුණු අවස්ථා සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ඒකක වෙත පුහුණුව ලබා දීම. UTEL පරීක්ෂණ සේවාව ස්ථාපිත කිරීම.	- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලවල පීඨ වෘත්තීය මාර්ගෝපදේශ ඒකක හරහා උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වන ලද පුද්ගලික හා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන් ගණන. - විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක හි උපදේශකයින් / කාර්ය මණ්ඩලය සඳහා UGC විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සහ/හෝ වැඩමුළු ගණන. - වාර්ෂිකව ශිෂ්‍ය උපදේශකයින් / උපදේශකයින් ලෙස පත් කෙරෙන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය. - ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) පවත්වන කුටි සහ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය තුළ පිහිටුවීම. - සමස්ත විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂක ශිෂ්‍ය ජනගහනයෙන් වසරකට UTEL පරීක්ෂණවලට පෙනී සිටින සිසුන්ගේ ප්‍රතිශතය.
		4. කියවීමේ පුරුද්දේ වැදගත්කම වැඩි දියුණු කිරීම සහ විශ්ව විද්‍යාල තුළ පවතින විද්‍යුත් පුස්තකාල පද්ධති සහ අනෙකුත් පහසුකම්	විද්‍යුත් පුස්තකාලවලට අදාළව උසස් අධ්‍යාපන ආයතනයන් හි වත්මන් තත්ත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.	- පර්යේෂණ දත්ත සමුදායන්, රචනා සොරකම් (plagiarism) පිලිබඳ මෘදුකාංග සහ විද්‍යුත් පොත්වල ශිෂ්‍ය

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම.	විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා රචනා හිමිකම් සොරකම් විරෝධී මෘදුකාංග (Anti-plagiarism Software) සැපයීම	භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
		5. කොමිෂන් සභා වක්‍රලේඛ 933 හි සඳහන් පරිදි ශිෂ්‍ය ආධාර සේවා ශක්තිමත් කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිසුන්ගේ ඉගෙනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම	ශිෂ්‍ය සහාය පද්ධතිවල පවතින තත්ත්වය හඳුනාගෙන ශක්තිමත් කිරීමට පහසුකම් සැලසීම.	- ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 933 කොමිෂන් සභා වක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම.
			තත්ත්ව ආරක්ෂණ කටයුතු සඳහා සිසුන් සම්බන්ධ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.	
		6. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි ක්‍රියාත්මක කිරීම තුළින් ඵලදායී විශ්වවිද්‍යාල-කාර්මික හවුල්කාරිත්වයක් ඇති කිරීම, ගෝලීය සහ ජාතික අවශ්‍යතා ඇති ක්ෂේත්‍රවල පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හා සිසුන් සවිබල ගැන්වීම.	උපාධිධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා තිරසාර ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට සහ කුසලතා නොගැලපීම් අඩු කිරීමට දායක වීමට UGC හි ස්ථාවර කමිටු වෙත පුද්ගලික අංශයේ නියෝජිතයන් ඇතුළත් කිරීම.	- පර්යේෂණ සහ නවෝත්පාදනයන් සඳහා පහසුකම් සැලසීමට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පිහිටුවා ඇති ක්‍රියාකාරී විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා ඒකක සංඛ්‍යාව - රාජ්‍ය/පෞද්ගලික අංශය සමඟ සහයෝගයෙන් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන දෙකක් හෝ වැඩි ගණනක් එක්ව සංවිධානය කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පහසුකම් සපයන මහජන දැනුවත් කිරීමේ සැසි සංඛ්‍යාව
			විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.	
			පවතින පශ්චාත් උපාධි පර්යේෂණ යෝජනා ක්‍රම සඳහා අයදුම් කිරීමට විද්වතුන්ට ආරාධනා කිරීම.	
			පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රදාන ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසිද්ධ විදේශීය විශ්වවිද්‍යාල හඳුනා ගැනීම.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			තරුණ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීමට අවස්ථා ලබා දීම සහ දිරිගැන්වීම.	
			කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රතිපාදනවලින් විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සඳහා පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීම.	
		7. රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් සපයනු ලබන උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය ඉහළ නැංවීම.	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ට/ සිසුන්ට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම.	- 2023 වන විට විශ්වවිද්‍යාල සේවාවන්හි අභ්‍යන්තර පාර්ශවකරුවන්ගේ තක්සේරුවේදී අවම වශයෙන් 80% තෘප්තිමත් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.
			විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා හරහා උසස් අධ්‍යාපන ආයතන සමඟ සබඳතා ඇති කර ගැනීමට බාහිර පාර්ශ්වකරුවන්ට අවස්ථා ලබා දීම.	- 2023 වන විට විශ්වවිද්‍යාල ප්‍රතිදානයේ බාහිර පාර්ශ්වකරුවන්ගේ තක්සේරුවෙහි අවම වශයෙන් 75% තෘප්තිමත් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.
		8. UGC යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතන සහ ඔවුන් විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් ගෝලීයව සහ දේශීයව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල බව අඛණ්ඩව පරීක්ෂා කිරීම, අධීක්ෂණය සහ සංවර්ධනය තුළින් සහතික කිරීම.	විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව සහතික ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.	- කාර්ය සාධන ලකුණු කාඩ්පත සඳහා 75%කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගත් UGC යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක (IQAU) ප්‍රතිශතය.
			පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශයන් සංවර්ධනය කිරීම.	- වර්ෂය තුළ නිකුත් කරන ලද උසස් අධ්‍යාපන ආයතනයන් හි ආයතනික සමාලෝචන වාර්තා ගණන.
			ආයතනික සමාලෝචන පැවැත්වීම.	
			වැඩසටහන් සමාලෝචන පැවැත්වීම.	- වර්ෂය තුළ නිකුත් කරන ලද උසස් අධ්‍යාපන ආයතනයන් හි වැඩසටහන්
			ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) අනුව දැනට පවතින සියලුම අධ්‍යයන පාඨමාලා සංශෝධනය කර	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			නැවත නම් කිරීම සහ ඒ අනුව අත්පොත යාවත්කාලීන කිරීම.	සමාලෝචන වාර්තා ගණන.
			SLQF 2015 අනුව විශ්වවිද්‍යාල සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම.	
			මනා ලෙස පාලනය කරන ලද සමකාලික අධ්‍යයන දින දර්ශනයක් පවත්වා ගැනීමට විශ්වවිද්‍යාලවලට සහාය වීම.	
			උසස් අධ්‍යාපනයේ තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ජාතික අධ්‍යයන සමූළුවක් ආරම්භ කිරීම.	
			UGC යටතේ සුදුසුකම් තහවුරු කිරීම සඳහා ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.	
			සාගර විශ්වවිද්‍යාලය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර ප්‍රමිතියට ඉහල නැංවීමට සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම.	
ගුණාත්මක අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානතාව	**ඉලක්ක අංක 04:** කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප වලින්	1. ඉදිරි වසර 5 තුළ විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සෑම තරාතිරමකම හැකි උපරිම දක්ෂතා ඇති විවිධ ශ්‍රම බලකායන් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම සහතික කිරීම.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි මානව ප්‍රාග්ධනයේ නිපුණතා සහ විශේෂඥතාව වර්ධනය කිරීම.	- සුදුසුකම් තහවුරු කිරීමේ පළමු උත්සාහයේදීම සේවයේ ස්ථිර කරන ලද විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය
			කාර්ය මණ්ඩල කාණ්ඩ බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සංශෝධනය කිරීම.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
	සමන්විත වැඩිදියුණු කළ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහතික කිරීම.		පවතින පශ්චාත් උපාධි පර්යේෂණ යෝජනා ක්‍රම සඳහා අයදුම් කිරීමට අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ආරාධනා කිරීම.	
		2. පුහුණුව හා සංවර්ධනය තුළින් දැනට සිටින විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය තුළ ඇති විභව දක්ෂතා හඳුනාගැනීමට හා ඒවා පෝෂණය කිරීම සඳහා ක්‍රියා කිරීම ආරම්භ කිරීම.	පශ්චාත් උපාධි/ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට පරිපාලන නිලධාරීන්ට පහසුකම් සැලසීම.	- දේශීය රැකියා ආශ්‍රිත පුහුණුව සහිත පරිපාලන නිලධාරීන්ගේ සංචිත ප්‍රතිශතය - විදේශ රැකියා ආශ්‍රිත පුහුණුවක් සහිත පරිපාලන නිලධාරීන්ගේ සංචිත ප්‍රතිශතය. - UGC හරහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට ලබා දෙන ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව ප්‍රතිශතය. - පරිපාලන කාර්ය මණ්ඩලයට UGC හරහා ලබා දෙන ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව ප්‍රතිශතය. - පශ්චාත් උපාධි සහ/හෝ වෘත්තීය සුදුසුකම් ඇති පරිපාලන නිලධාරීන්ගේ ප්‍රතිශතය.
		3. අඩු කාර්ය සාධනයක් සහිත කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව වැඩි කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සේවක සුභසාධනය ක්‍රියාකාරී ලෙස වැඩිදියුණු කිරීම.	විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සේවක සුභසාධනය ක්‍රියාශීලීව ඉහළ නැංවීමට සහ ඌන කාර්ය සාධන කාර්ය මණ්ඩලය අඩු කිරීමට පද්ධතිය සමාලෝචනය කිරීම.	- ආවර්ජිතා කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම්වල මුළු ලකුණු 5 ක් වූ මිනුමෙන්, අවම වශයෙන් ලකුණු 3ක් ලබා ගන්නා කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය. - සේවක සුභසාධනය සහ තෘප්තිය පිළිබඳ සමීක්ෂණයකදී > 75% ක ලකුණු ලබා ගන්නා විශ්වවිද්‍යාල සංඛ්‍යාව.

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
				- UGC හි නීති අංශය විසින් මෙහෙයවනු ලබන සේවකයන් සම්බන්ධ නීති/උසාවි නඩු ගණන.
